## සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාළ 1990 ප්‍රධාන නීති අණපනත්

පිටුව


1. 1990 අංක 2 දරන ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනත* ... I
2. 1990 අංක 3 දරන උකස් (සංශෝධන) පනත .. .. XI
3. 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ... ... XVI
4. 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත ... XXIV
5. 1990 අංක 9 දරන ගොවිජනසේවා (සංශෝධන) පනත ... XXV
6. 1990 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත XXVII
7. 1990 අංක 13 දරන භාර ලදුපත් (සංශෝධන) පනත ... ... XXVIII
8. 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත ... ... XXX
9. 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත ... XXXIV
10. 1990 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... XLV
11. 1990 අංක 31 දරන විසර්ජන (සංශෝධන) පනත ... ... LVI
12. 1990 අංක 39 දරන බැංකු (සංශෝධන) පනත ... ... LVI
13. 1990 අංක 42 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... LIX
14. 1990 අංක 43 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... ... LXXXI
15. 1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත LXXXVI
16. 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත ... ... XCI
17. 1990 අංක 48 දරන විසර්ජන පනත ... ... CVII


* ණය ආපසු අයකර ගැනීමේ කටයුතුවල වර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ සහ අනුයායි සංශෝධන වශයෙන් පහත සඳහන් ව්‍යවස්ථාවන්ද ණය ආපසු අයකර ගැනීමේ නීති පද්ධතියේ කොටසක් වශයෙන් පනවනු ලැබ ඇත.

1. 1990 අංක 5 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත ...
2. 1990 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත ...
3. 1990 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනත ... ...
4. 1990 අංක 11 දරන රජයේ සේවකයන්ගේ (වගකීම්) (සංශෝධන) පනත
5. 1990 අංක 12 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත ...

# 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**ණය දෙන ආයතන විසින් ණය ආපසු අයකර ගැනීමට අදාළ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ :—

## I වන කොටස—නඩු පැවරීම

**2.** (1) (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ණය දෙන ආයතනයක් විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව මේ පනතින් නියම කර ඇති කාර්ය පටි පාටිය අනුව වූ නඩුවක්,—

(අ) විත්තිකාර පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ; හෝ

(ආ) නඩු නිමිත්ත පැන නැගුනේ ; හෝ

(ඇ) බලාත්මක කිරීම අපේක්ෂිත ගිවිසුමට එළඹියේ

යම් දිසා අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද එම දිසා අධිකරණයේ පැවරීමෙන් එම ආයතනයට අයවිය යුතු යම් ණයක් ආපසු අයකර ගත හැකි ය.

(2) ණයට හෝ අත්තිකාරම් වශයෙන් හෝ දෙන ලද මුල් මුදල රුපියල් එක් ලක්ෂ පනස් දහසකට අඩු වන අවස්ථාවක එම ණය අයකර ගැනීම සඳහා, මේ පනතේ දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාර යම් නඩුවක් යම් ආයතනයක් විසින් නොපැවරිය යුතු ය.

**3.** මේ පනත යටතේ වූ නඩුවක් (101 වන අධිකාරය වන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ නිශ්චිතව සඳහන් ආකෘතියේ වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පැවරිය හැකි ය.

**4.** (1) නඩු පවරන ආයතනය විසින් පැමිණිල්ල ඉදිරිපත් කරන විට, හිමිකම් පා ඇති මුදල යුක්තිසහගත ලෙස ආයතනයට විත්තිකරුගෙන් අයවිය යුතු බවට වූ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර ඊට අතිරේකව නඩු පැවරීමට මුල් වූ හෝ ආයතනය විසින් විශ්වාසය තබන සාධන පත්‍රය, ගිවිසුම හෝ ලේඛනය අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) යම් සාධන පත්‍රයක්, ගිවිසුමක් හෝ ලේඛනයක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ නම් ද (එම සාධන පත්‍රයට, ගිවිසුමට හෝ ලේඛනයට මුද්දර ගැසීමට නීතියෙන් නියමිතව ඇති අවස්ථාවක නම්) ඊට නිසි ලෙස මුද්දර ගසා ඇති බව සහ එහි මුහුණතේ ඇති යම් වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් හෝ වෙනත් දෙයක් නිසා එය සැකයට භාජන නොවන බව සහ කාලාපගමනය නිසා ඊට බාධකයක් ඇති වී නැති බව අධිකරණයට පෙනී යයි නම් සහ (4) වන උපවගන්තියේ සඳහන් දිවුරුම් පත්‍රයේ අඩංගු සම්ප්‍රකාශ සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත්වන්නේ නම් ද, මුදල ගෙවන දිනය තෙක් පොලිය සහිතව පැමිණිල්ලේ සඳහන් ගණනට නොවැඩි මුදල් ප්‍රමාණයක් සහ නයිසයි තීන්දු ප්‍රකාශය කරන වේලාවේ දී ආයතනය විසින් අයැද ඇති වූ ද සුදුසු යැයි අධිකරණයට පෙනී යන්නා වූ ද වෙනත් සහන ද සඳහා වූ නයිසයි තීන්දු ප්‍රකාශයක් අධිකරණය විසින් සටහන් කළ යුතු ය. මෙහි මින් මතු නිශ්චිතව සඳහන් කරන ආකාරයට නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) විත්තිකරුට අධිකරණයේ පෙනී සිටීම සඳහා සහ නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙන්වීමට හේතු ඇත්නම් එම හේතු පෙන්වීම සඳහා ද නයිසයි තීන්දු ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු දිනය, විත්තිකරු පදිංචි ස්ථානයේ සිට අධිකරණයට ඇති දුර සැලකිල්ලට ගෙන පහසුවෙන් නියම කළ හැකිතාක් වේලාසනින් වූ දිනයක් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ආයතනය විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශය, ඒ ආයතනයේ යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයකු හෝ ආයතනය වෙනුවෙන් නඩුව පවරා පවත්වාගෙන යාමට යථා පරිදි බලය දෙනු ලැබූ නීතිඥවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඒ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන තැනැත්තා නඩු නිමිත්තට තුඩු දුන් සිද්ධි කරුණු පිළිබඳව පෞද්ගලිකව ම දැන සිටිය යුතු ය. තව ද ඒ දිවුරුම් ප්‍රකාශයේ අඩංගු කරුණු තමාගේ ම පෞද්ගලික දැනීම මත කියා සිටින බව දිවුරා හෝ සහතික කොට ඒ දිවුරුම් පත්‍රයෙන් ප්‍රකාශ කළ යුතු අතර, එහි අඩංගු විෂය කරුණු පිළිබඳව, විනිශ්චයකාර වරයාගේ අභිමතය පරිදි, ඔහු පරීක්ෂා කරනු ලැබීමට යටත් විය යුතු ය.

(5) ආයතනය විසින් පැමිණිල්ල සමඟ පහත දැක්වෙන දේ ඉදිරිපත් කළ යුතු ය :—

(අ) දිවුරුම් ප්‍රකාශය සහ මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රය ගිවිසුම හෝ ලේඛනය ;

(ආ) නයිසයි තීන්දු ප්‍රකාශයේ කෙටුම්පත ;

(ඇ) නයිසයි තීන්දු ප්‍රකාශය සඳහා සහ එය භාරදීම සඳහා අවශ්‍ය මුද්දර.

**5.** 4 වන වගන්තිය යටතේ නයිසයි තීන්දු ප්‍රකාශයක් සටහන් කර ඇති අවස්ථාවක ඒ නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාරදීමේ දී, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 705අ සහ 705ආ වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට අදාළ විය යුතු ය.

**6.** (1) මේ පනත යටතේ පවරන ලද නඩුවක දී, පෙනී සිටීමට හෝ හේතු දැක්වීමට අධිකරණයෙන් අවසර ලබාගෙන ඇත්නම් මිස, නයිසයි තීන්දු ප්‍රකාශයකට විරුද්ධ විත්තිකරුවකු පෙනී සිටීම හෝ හේතු දැක්වීම නොකළ යුතු ය.

(2) විත්තිකරුවකු විසින් නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීම සහ හේතු දැක්වීම සඳහා අවසර ඉල්ලා සිටි විටක අධිකරණය විසින් පහත සඳහන් අවස්ථාවක දී ඒ සඳහා අවසර දිය හැකි ය. එනම් :—

(අ) නයිසයි තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල් ප්‍රමාණය විත්තිකරු විසින් අධිකරණයට ගෙවූ විට ; හෝ

(ආ) නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබුවහොත් ඒ නයිසයි තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල් ප්‍රමාණය පියවීම සඳහා යුක්තිසහගත හා ප්‍රමාණවත් ලෙස අධිකරණයට පෙනී යා හැකි යම් ඇපයක් විත්තිකරු විසින් සපයනු ලැබූ විට ; හෝ

(ඇ) විභාග කරනු ලැබිය යුතු, විසඳිය යුතු ප්‍රශ්නයක් හෝ විවාදයට විෂය වී තිබෙන ප්‍රශ්නයක් හෝ තිබෙන බවට අධිකරණය සෑහීමට පත්වන දිවුරුම් පත්‍රයක් විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ දිවුරුම් පත්‍රයෙහි පැමිණිලිකරුගේ හිමිකම්පෑම

සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් විය යුතු අතර විත්තිවාචකය කුමක් ද යන්න සහ එය සනාථ කිරීම සඳහා විශ්වාසය තබන්නේ කුමන කරුණු මත ද යන්න පැහැදිලිව හා සංක්ෂිප්තව එහි ප්‍රකාශ විය යුතු ය.

(3) පෙනී සිටීම සහ හේතු දැක්වීම සඳහා එවැනි අවසරයක් විත්තිකරු විසින් ඉල්ලා නොසිටි විටක, අධිකරණය එම නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් කළයුතු අතර, එම ආඥව සම්බන්ධයෙන් (101 වන අධිකාරය) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 389 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. මේ කාර්යය සඳහා විනිශ්චයකාරවරයා විසින් නයිසයි තීන්දු ප්‍රකාශයෙහි ''නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලදී'' යනුවෙන් (හෝ ඒ සමාන අර්ථය ඇති වචන වලින්) පිටසනක් කර එහි දාතම යොදා අත්සන් කළ යුතු ය.

**7.** විත්තිකරු පෙනී සිටියහොත් සහ පෙනී සිටීම හා හේතු දැක්වීම සඳහා අවසර දෙනු ලැබුවහොත්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 384, 385, 386, 387, 388, 389, 390 සහ 391 යන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, එම නඩු විභාගයට අදාළ විය යුතු ය.

**8.** මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී, පැමිණිල්ල සමග ඉදිරිපත් කරන හෝ නඩුවට පදනම් කරගෙන ඇති සාධන පත්‍ර, එකඟවීමේ හෝ වෙනත් ලේඛන අධිකරණයේ නිලධරයකු වෙත තැන්පත් කරන ලෙස අධිකරණය විසින් ආඥ කළ හැකි අතර, එහි ගාස්තු සඳහා ආයතනය විසින් ඇප තබන තෙක්, සියලු නඩු කටයුතු අත්හිටුවන ලෙස, වැඩිදුරට ආඥ කළ හැකි ය.

**9.** අගරු කරන ලද විනිමය බිල්පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් දරන්නා, ආයතනය වන අවස්ථාවක, පිළිනොගැනීම හෝ නොගෙවීම සඳහා එය සටහන් කර ගැනීම සම්බන්ධයෙන් හෝ එම අගරු කිරීම හේතු කොට ගෙන අන්‍යාකාරයෙන් හෝ දැරීමට සිදු වූ වියදම් අයකර ගැනීම සඳහා, ඒ බිල්පත්‍රයේ හෝ නෝට්ටුවේ මුදල අයකර ගැනීම සඳහා මේ පනත යටතේ ඒ ආයතනයට ඇති ප්‍රතිකර්ම ම ආයතනයට හිමි විය යුතු ය.

**10.** මේ පනත යටතේ නඩු පවරනු ලැබිය හැකි අධිකරණයෙහි, පෙනී සිටීම සහ නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව හේතු දැක්වීම සඳහා අවසර දෙනු ලැබූ නඩු පිළිබඳව, විභාගයට නියමිත විශේෂ නඩු ලැයිස්තුවක් තබාගත යුතු අතර, ඒ නඩු විභාග කර ඉක්මණින් නිම කිරීමට පහසු කරවනු පිණිස විභාගය පැවැත්වෙන දිනය පිළිබඳව පාර්ශ්වකරුවන්ට සාධාරණ දැනුම්දීමකින් පසුව යම් දිනවල දී ඒවා, විභාග කිරීම සඳහා ගන්නා ලෙස, ඊට ප්‍රතිවිරුද්ධ කවර රීතියක් හෝ පරිචයක් තිබුණ ද ඒ නොතකා, ආඥ කිරීමට, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට නිසි බලය තිබිය යුතු ය.

**11.** නයිසයි තීන්දු ප්‍රකාශය ලබාගෙන ඇත්තේ ප්‍රමාණවත් නොවන හේතු මත බව හෝ නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කරනු ලැබීමෙන් පසු නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබ නයිසයි තීන්දු ප්‍රකාශය පැහැර හැරීමෙන් හෝ අන්‍යාකාරයකින් අහෝසි වී ඇත්නම් සහ නයිසයි ආඥව සටහන් කිරීමට සාධාරණ හේතුවක් නොතිබුණු බව අධිකරණයට පෙනී ගියහොත්, අධිකරණය විසින් ඒ නඩුවේ දී ම, ඒ නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කරන ලද්දේ යම් පාර්ශ්වයකට විරුද්ධව ද ඒ පාර්ශ්වයේ ඉල්ලීම පිට, ඒ නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කිරීමේ හේතුවෙන් ඒ පාර්ශ්වයට දරන්නට සිදු වූ වියදම් සහ හානියට වන්දි වශයෙන් සාධාරණ යැයි අධිකරණය සලකන මුදල් ප්‍රමාණයක්, ඒ නයිසයි තීන්දු ප්‍රකාශය ලබාගත් ආයතනයට විරුද්ධව, අධිකරණය විසින් ප්‍රදානය කළ හැකි අතර මේ වගන්තිය යටතේ කරනු ලබන ප්‍රදානයකින්, නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කිරීමට විරුද්ධව වන්දි සඳහා කිසි නඩුවක් පැවරීම වළක්වනු ලැබිය යුතු ය.

**12.** විත්තිකරු නයිසයි තීන්දු ප්‍රකාශයට ප්‍රතිචාර වශයෙන් අධිකරණයේ පෙනී සිට, නයිසයි තීන්දු ප්‍රකාශයට හබ නොකොට එහෙත් ණය මුදල ගෙවීමේ වගකීම පිළිගෙන එම ණය මුදල වාරික වශයෙන් ගෙවා ඇවර කිරීමට අයැද සිටි අවස්ථාවක, අධිකරණය විසින් ඒ බව නඩු වාර්තාවෙහි සටහන් කොට ඊට විත්තිකරුගේ අත්සන ලබා ගත යුතු ය. ඉන් අනතුරුව අධිකරණය විසින් එම තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් කොට, නඩුව පවරා ඇති ණය ඇවර කිරීම සඳහා වූ වාරික පිළිබඳ සමථ කොන්දේසි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 408 වන වගන්තියට අනුකූලව, සටහන් කළ යුතු ය. එම සමථය, විත්තිකරු සමථ කොන්දේසි කිසිවක් කඩවන පරිදි ක්‍රියා කළහොත් මිස, ක්‍රියාත්මක කරවීමේ නඩු කටයුතු අත්හිටුවීමක් ලෙස ක්‍රියාත්මක විය යුතු අතර, විත්තිකරු එසේ ක්‍රියා කළහොත්, තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවා ගැනීමට ආයතනයට හිමිකම තිබිය යුතු ය.

## II වන කොටස - ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂ විධිවිධාන

**13.** අධිකරණයේ ආඥාවලට යටත්ව, මේ පනත යටතේ සටහන් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක්, නියත තීන්දු ප්‍රකාශයක් කරනු ලැබූ අවස්ථාවක, එය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225 (3) වන වගන්තියට අනුකූලව පිස්කල්වරයා වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාවක් ලෙස සැලකිය යුතු අතර, රිට් ආඥා ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ නියමිත ආකාරයට එය ක්‍රියාත්මක කිරීම, පිස්කල්වරයා ගේ කාර්යය විය යුතු ය.

**14.** (1) 15 වන වගන්තියේ සඳහන් රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු විසින් පිස්කල්වරයාට ප්‍රතිරෝධය පානු ලැබුවහොත්, පිස්කල්වරයා, එම ප්‍රතිරෝධය පෑම පිළිබඳව අධිකරණයට වාර්තා කළ යුතු අතර, එවිට එම ප්‍රතිරෝධය පෑම හේතුවෙන් අධිකරණයට අපහාස කිරීමේ හේතුව මත ක්‍රියා නො කළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස, එම විරෝධය පෑ තැනැත්තාට නියම කරමින්, ඒ තැනැත්තාට විරුද්ධව අධිකරණය විසින් දැනුම්දීමක් නිකුත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී පිස්කල්වරයාට ප්‍රතිරෝධය පාන කවර හෝ තැනැත්තෙක්, අධිකරණයට අපහාස කිරීමේ වරදට වරදකරුවකු ලෙස සැලකිය යුතු අතර, තහනමට ගැනීමට අපේක්ෂිත දේපළ විනිශ්චිත ණයකරු නොවන වෙනත් තැනැත්තකුට අයත් බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුව හොත් මිස අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතින්, සහ (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය මගින් නියමිත දණ්ඩනවලට ඔහු යටත් විය යුතු ය.

(3) පිස්කල්වරයාට විරුද්ධවන තැනැත්තා අධිකරණයේ පෙනීසිට පිස්කල්වරයා විසින් තහනමට ගැනීමට අපේක්ෂා කරන ලද දේපළ, විනිශ්චිත ණයකරු හෝ විනිශ්චිත ණයකරු යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් හැර, යම් තැනැත්තකු අරභයා තමා විසින් දරමින් සිටින බවට හිමිකම් කියා සිටියහොත්, ඔහුගේ හිමිකම්පෑම අසාර්ථක වූ අවස්ථාවක් වී නම්, තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල හෝ නඩුවේ සියලු පරිවේෂණ සැලකිල්ලට ගනිමින් සුදුසුයයි අධිකරණය අදහස් කරන, ඒ මුදලින් යම් කොටසක් පියවීම සඳහා ඇප තබන ලෙස ඒ තැනැත්තාගෙන් ඉල්ලා සිටිය යුතු ය : නැතහොත්, අධිකරණයේ අභිමතය පරිදි, ඒ හිමිකම් පෑම විමසීම අවසාන කරන තුරු, තහනමට ගැනීමට අපේක්ෂිත දේපළ අනුමිත පිස්කල් භාරයේ රඳවා ගැනීම පිණිස පොරොන්දුවක් දෙන ලෙස ඒ තැනැත්තාට ඉඩ හැරිය හැකි ය.

**15.** (1) මේ පනත යටතේ නඩුවක් පවරනු ලැබූ කවර හෝ අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල ආකෘතියකින්, අධිකරණය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු විශේෂ ලේඛනයක ඒ නඩුව සටහන් කරනු ලැබිය යුතු ය.

(2) නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසු, විත්තිකරු විසින් හෝ ඔහුගේ සම්බන්ධතා නියෝජිතයා විසින්, යම් චංචල හෝ නිශ්චල දේපළ අන්සතු කරන ලද හෝ කවරාකාර වූ හෝ ක්‍රමයකින් අන්‍යාකාරයෙන් නියාදනය කරන ලද අවස්ථාවක, එකී අන්සතු කිරීම ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර, නීතිය අනුව බලාත්මක හෝ ක්‍රියාත්මක නොවිය යුතු ය ; තව ද, එම දේපළ පවතින්නේ කවරකුගේ අතේ වුව ද, තහනමට ගැනීමට විවෘත විය යුතු ය :

එසේ වුව ද, ඒ නඩුව නිශ්ප්‍රභ කරන ලද්දේ නම් හෝ නයිසයි තීන්දු ප්‍රකාශය අවලංගු කරන ලද්දේ නම්, ඒ අන්සතු කිරීම වලංගු විය යුතු ය ; තව ද,

තව දුරටත් එසේ වුව ද, නිත්‍ය තීන්දු ප්‍රකාශය ඉටු කරනු ලැබුවේ නම් ද, ඒ අන්සතු කිරීම වලංගු විය යුතු ය ; එහෙත් එසේ විය යුත්තේ, තහනමට නොගන්නා ලද අන්සතු කරනු ලැබූ සහ නිත්‍ය තීන්දු ප්‍රකාශය ඉටු කිරීමෙහි ලා අදළ කරනු ලැබූ දේපළ සම්බන්ධයෙන් පමණක් විය යුතු ය ; තව ද,

වැඩිදුරටත් එසේ වුව ද, ඒ දේපළ මිලට ගැනීමේ මුදල් ගෙවන අවස්ථාවේ දී හෝ පැවරුම් පත්‍රය ලියා අත්සන් කරන අවස්ථාවේ දී නයිසයි තීන්දු ප්‍රකාශය ගැන දැනීමක් නොමැතිව ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් ඒ දේපළ ලබාගත් පැවරුම් ලාභියකු අතට පත් වී ඇති හෝ එවැනි පැවරුම්ලාභියකුගෙන් වෙනත් පැවරුම්ලාභියකු අතට පත්වී ඇති දේපළ අරභයා (2) වන උපවගන්තිය අදළ නොවිය යුතු ය ; තව ද එවැනි කරුණු ඔප්පු කිරීමේ භාරය එවැනි පැවරුම්ලාභියකු සතු විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පවත්වාගෙන යා යුතු ලේඛනයට අමතරව, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, මේ පනත යටතේ නඩු පවරනු ලැබ ඇත්තේ කවර නම් විත්තිකරුවන්ට විරුද්ධව ද, ඒ විත්තිකරුවන්ගේ නම වල සුචියක් පවත්වාගෙන යා යුතු අතර, ඒ සුචිය අකාරාදී පිළිවෙලට සකස් කළ යුතු ය.

(4) ඒ ලේඛනය සහ සුචිය මහජනයාගේ පරීක්ෂාව සඳහා විවෘතව තැබිය යුතු අතර එහි ඇතුළත් වන සටහන් මහජනයා වෙත කෙරෙන බැලු බැල්මට පෙනෙන දැන්වීමක් විය යුතු ය.

(5) තහනමට ගන්නා ලද දේපළ පිළිබඳව, කවරකු විසින් හෝ කරනු ලැබ ඇති සියලු හිමිකම් පෑම් ඒ නඩුවේ දී ම සුදුස්සක් කොට අවසන් කළ යුතු අතර, එවැනි ඉල්ලීමක් මත වූ තීරණයක්, තහනමට ගන්නා ලද යම් දේපළක් ආපසු ගැනීම සඳහා වෙනත් යම් නඩුවක් පැවරීමට හෝ ඒ දේපළට යම් අයිතිවාසිකමක් ඇති බව දක්වීමට හෝ ඒ දේපළ පවරන ලද නඩුවේ වාසියට වූ තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමෙන් විකිණීමට යටත් වන බව ප්‍රකාශ කිරීමට බාධකයක් විය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ ඇතුළත් කිසිවක්, සංසරණයවීමේ දී නිර්ව්‍යාජ දරන්නකු අතට පත් වී ඒ නිර්ව්‍යාජ දරන්නාගේ අතෙහි ඇති මුදල්වලට හෝ මුදල් නෝට්ටුවලට ද නැතිහොත් නිර්ව්‍යාජ දරන්නකු අතේ ඇති වටිනාකමක් සඳහා වූ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රවලට ද අදළ නොවිය යුතු ය ; තව ද බඩු විකිණීමේ ආඥාපනතේ 22 වන හා 23 වන වගන්තිවලට ද නැතහොත් පිටසන් කිරීමෙන් හෝ ගෙනවිත් භාරදීමෙන් ඊට අදාළ බඩුවල අයිතිය නීතියෙන් හුවමාරුවන ප්‍රතිෂ්ඨාවක් සඳහා වූ යම් හිමිකම් පිළිබඳ ලේඛනයක් සද්භාවයෙන් දරන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට ද නැතහොත් ණයක් හෝ අය කිරීමක් පවරනු ලැබ ඇති තැනැත්තකුගේ බැඳීම්වලට ද නැතහොත් ව්‍යවස්ථාවකින් විත්තිවාචක කළ නොහැකි ලෙස ප්‍රකාශිත හෝ ස්වකීය හිමිකම් අනුප්‍රාප්තිකයා ගේ හිමිකම යටතේ දේපළ දරන්නකුගේ අයිතිවාසිකම්වලට ද ඉන් බලපෑමක් නොවිය යුතු ය.

## III වන කොටස

## අභියාචන පිළිබඳව

**16.** සිවිල් නඩු විධාන සංග්‍රහයේ 756 වන වගන්තියේ (7) වන උපවගන්තිය, ඒ වගන්තිය අගට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුවද, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ පවරන ලද යම් නඩුවක ක්‍රියා මාර්ගයේ දී කරන ලද යම් ආඥාවක් සම්බන්ධයෙන් අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක දී, අභියාචනාධිකරණය අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුවේ නම් මිස, අභියාචනය කිරීමට අවසර දෙනු ලැබූ කල්හි මුල් අධිකරණයේ නඩු කටයුතු නැවැත්විම නොකළ යුතු ය ; තව අභියාචනය කිරීමට අභියාචනාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අභියාචනය නිශ්ප්‍රභ කරනු ලැබුවේ නම්, පැමිණිලිකරුගේ සම්පූර්ණ ඉල්ලීම හෝ නඩුවේ සියලු පරිවේෂණ සැලකිල්ලට ගනිමින් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන ඒ මුදලින් යම් කොටසක් පියවීම සඳහා මුදලින් හෝ බැංකුකරුවකුගෙන් ලබාගත් ඇපයකින් ඇප තබන ලෙස අභියාචනාධිකරණය විසින් අභියාචකට නියම කළ යුතු ය.".

**17.** සිවිල් නඩු විධාන සංග්‍රහයේ 763 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශවල දී විනිශ්චිත ණයකරු විසින් දිය යුතු ඇපය, තීන්දු ප්‍රකාශයේ සඳහන් සම්පූර්ණ මුදලම හෝ නඩුවේ සියලු පරිවේෂණ සැලකිල්ලට ගනිමින් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන ඒ මුදලේ යම් කොටසක් හෝ විය යුතු ය.".

**18.** 1979 අංක 37 දරන පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 23 වන වගන්තියෙහි අවසානයට පහත දැක්වෙන අතුරු වගන්තිය එක් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශ සම්බන්ධයෙන් වූ විට, ඇතුළත් විය යුතු බැඳුම් කරයේ මුදල තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල හෝ නඩුවේ සියලු පරිවේෂණ සැලකිල්ලට ගනිමින් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන ඒ මුදලේ යම් කොටසක් හෝ විය යුතු ය."

## IV වන කොටස — විශේෂ විධිවිධාන පිළිබඳව

**19.** මේ පනතෙහි විධිවිධාන සලසා නොමැති කාර්ය පටිපාටිය පිළිබඳ යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් හෝ සම්බන්ධයෙන්, සමාන කාරණයක දී හෝ ප්‍රශ්ණයක දී (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය එම කාර්ය පටිපාටිය මෙම පනතේ විධිවිධාන වලට අනනුකූල නොවේ නම්, අධිකරණය විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය.

**20.** කිසියම් විශේෂ අවස්ථාවක දී හෝ කිසියම් විශේෂ කාර්යයක් සඳහා හෝ, මේ පනතේ කාර්ය සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍රය නියම කරනු ලැබ නොමැති අවස්ථාවක, අධිකරණය විසින් අනුමත කරනු ලබන ආකෘති පත්‍රයක්, ඒ අවස්ථාවේ දී හෝ ඒ කාර්ය සඳහා හෝ භාවිත කරනු ලැබිය හැකි ය.

**21.** ණය දෙන ආයතනයකට අයවිය යුතු :—

(අ) රුපියල් දෙලක්ෂ පණස් දහසක් හෝ ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍ය-වරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මුදල් ප්‍රමාණයක් නොඉක්ම වන්නාවූ ද, හෝ

(ආ) අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් ඇතුලත ඒ ණය දෙන ආයතනය විසින් ආපසු අයකර ගත යුතු වූ ද,

ණයක් මේ පනතෙන් නියම කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව ආපසු අයකර ගැනීම සඳහා ඒ ණය දෙන ආයතනය විසින් පවරනු ලබන කිසි නඩුවක්, ඒ ණය මුදලෙහි පොලිය වශයෙන් හිමිකම් පාන මුදල් ප්‍රමාණය, මුල් මුදල වශයෙන් අය විය යුතු මුදල ඉක්ම වන්නේ නම්, කිසි අධිකරණයක් විසින් භාර නොගත යුතු ය.

**22.** ණය මුදලක් ගෙවීම පැහැර හැරීම හෝ ප්‍රමාද කිරීම වෙනුවෙන් දණ්ඩනයක් වන කිසිම මුදලක් එම ණය මුදල අයකර ගැනීම සඳහා මේ පනත යටතේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව පවරන ලද නඩුවක දී අයකර ගනු නොලැබිය හැකි ය.

**23.** මේ පනත යටතේ පවරනු ලබන නඩුවක දී නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් පාර්ශ්වකරුවන් අතර එකඟත්වයකට එළඹ ඇති පොලිය ද, නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මුදල සම්පූර්ණයෙන් ම ගෙවන දිනය තෙක් මුළු මුදල මත, ඒ පොලී ප්‍රමාණය ම මත වූ පොලිය ද ගෙවන ලෙස, අධිකරණය විසින් නයිසයි තීන්දු ප්‍රකාශයෙහි අණ කරනු ලැබිය යුතු ය. පොලී ප්‍රමාණයක් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් එකඟ වී නොමැති විට, නඩුව පැවරූ දිනයේ සිට නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් ද, ඉන් ඉක්බිති ව නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට සම්පූර්ණ මුදල ගෙවන දිනය තෙක් මුළු මුදල මත ද වෙළෙඳ පොළෙහි පවත්නා ප්‍රමාණය අනුව වූ පොලියක් ගෙවන ලෙස අධිකරණය විසින්, නයිසයි තීන්දු ප්‍රකාශයෙහි අණ කරනු ලැබිය යුතු ය.

## V වන කොටස — විවිධ කරුණු

**24.** (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතෙහි සහ (80 වන අධිකාරය වූ) මුදල් ණයට දීමේ ආඥාපනතෙහි සඳහන් කිසිවක් ආයතනයකට හෝ ආයතනයක් සම්බන්ධ-යෙන් හෝ අදාළ නොවිය යුතු ය.

**25.** (1) (අ) චෙක්පත ගෙවීම සඳහා මුදල් හෝ ප්‍රමාණවත් මුදල් බැංකුවේ නැති බව දැන දැනම චෙක් පතක් ලියන ; හෝ

(ආ) ගෙවීමක් කිරීමට යම් බැංකුකරුවකුට බැඳීමක් නොමැතිවීමේ හේතුව නිසා හෝ ගෙවීම තහනම් කරනු ලැබීමේ හේතුව නිසා හෝ ගෙවීම කරනු නොලබන මුදල් ප්‍රමාණයක් ගෙවීමට බැංකු කරුවකුට අණ කරන ; හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් යම් ආයතනයක් සමඟ පවත්වාගෙන යනු ලබන ගිණුමකින් හෝ ඒ ආයතනය වෙත තැන්පත් කොට ඇති යම් අරමුදලකින් හෝ ඒ ආයතනයට අයවිය යුතු ණය මුදලක් හෝ ණයක් ගෙවීමෙහිලා තමාට මුදල් ප්‍රමාණයක් ගෙවීමට ආයතනයට බලය දෙන්නා වූ සහ ඒ තැනැත්තා විසින් ඒ අරමුදලෙහි ප්‍රමාණවත් අරමුදල් නොගෙවීමේ හේතුව නිසා හෝ තැන්පත් කරන ලද අරමුදල් ආපසු ලබා ගැනීමේ හේතුව නිසා හෝ දෙන ලද බලය ඒ තැනැත්තා විසින් තහනම් කරනු ලැබීම නිසා හෝ එම හේතුවලින් එක් හේතුවක් හෝ වැඩි ගණනක් නිසා ඒ ගෙවීම් ඒ ආයතනයට ගෙවීමට ඒ ආයතනයට නොහැකි වන : හෝ

(ඈ) දේශීය බිල් පත්‍රයක් භාර ගෙන එය නොගෙවීමෙන් එය අගරු කරන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක් දක්වා දීර්ඝ විය හැකි බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දස දහස සහ වරද සිදු කිරීමට සම්බන්ධ වූ චෙක්පතේ, අණකරයේ, බලපත්‍රයේ හෝ දේශීය බිල් පත්‍රයේ සම්පූර්ණ වටිනාකමින් සියයට දහය යන මේ මුදල් ප්‍රමාණ දෙකෙන් වඩා වැඩි මුදල් ප්‍රමාණයේ දඩයකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) ''චෙක්පත'', ''අගරු කිරීම'', ''බැංකුකරු'', ''දේශීය බිල් පත්‍රය'', සහ ''බිල් පත්‍රය'' යන යෙදුම් වල (82 වන අධිකාරය වන) විනිමය බිල් පත්‍ර ආඥපනතේ එම යෙදුම්වලට පිළිවෙළින් දී ඇති අර්ථ ද ''වංක'' යන යෙදුමට (19 වන අධිකාරය වන) දණ්ඩ නීති සංග්‍රහයේ 22 වන වගන්තියේ ඊට දී ඇති අර්ථයම ද තිබිය යුතු ය.

**26.** කලාපගමන ආඥපනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ආයතනයක් විසින් එම ආයතනයට අයවිය යුතු යම් ණයක් ආපසු අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත්තා වූ ද එම නඩුව මේ පනත ආරම්භ වන දිනයේ දී නොනිමිව පවතින්නා වූ ද අවස්ථාවක, එම ණය ආපසු අයකර ගැනීම සඳහා මේ පනත යටතේ නඩු පැවරීමට එම ආයතනයට හිමිකම තිබිය යුතු ය :

එසේ වුවද එම පළමු නඩුව පවරන දිනයේ දී ණය මුදල් සම්බන්ධයෙන් වූ නඩු නිමිත්ත කාලාපගමනය වී තිබූ අවස්ථාවක එවැනි නොනිම් නඩුවලට මේ වගන්තිය අදාළ නොවිය යුතුය.

**27.** (1) ආයතනයට අයවිය යුතු යම් ණයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ නඩුවක් පැවරීමට පෙර එම ආයතනයේ යම් ණය කරුවකු මිය යන්නා වූ ද ආයතනයක ණයකරුවකු හෝ මේ පනත යටතේ පවරන ලද නඩුවක පාර්ශ්වකරුවකු වූ හෝ පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු නඩුව පැවරීමට පසුව මිය යන්නා වූ ද අන්තිම කැමති පත්‍රය පිළිබඳව ප්‍රොබේට් බලපත්‍රය හෝ මියගිය තැනැත්තාගේ බූදලය පිළිබඳව අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කර නොමැති වූ ද අවස්ථාවක නඩුව පැවරීමට ඇති හෝ පවරා ඇති අධිකරණය විසින් එහි අභිමතය පරිදි, අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන තැනැත්තන් සිටිනම් ඒ අයට සිතාසි භාරදීමෙන් ද අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන පරීක්ෂණයකින් ද පසුව නඩුවේ කාර්ය සඳහා මියගිය තැනැත්තාගේ බූදලය නියෝජනය කිරීම සඳහා තැනැත්තකු පත් කරමින් ආඥවක් කළ යුතු අතර එම තැනැත්තා නඩුවට පාර්ශ්වකරුවකු කළ හැකි ය ; නැතහොත් පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පත්වීමක් කිරීමේ දී අධිකරණය විසින් ලසු පරීක්ෂණයකින් පසුව, අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා වශයෙන් පෙනී යන තැනැත්තා නියෝජිතයා වශයෙන් පත් කළ යුතු ය :

කෙසේ වුව ද එසේ පත් කරනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් අතර ආරාවුලක් ඇති අවස්ථාවක දී අධිකරණය විසින් මියගිය තැනැත්තාගේ බූදලයේ යහපත තකා, අධිකරණයේ මතය අනුව උචිත යයි අදහස් කරනු ලබන තැනැත්තකු (එම තැනත්තන්ගෙන් එක්කෙනෙකු හෝ වෙනත් යම් තැනත්තකු) පත් කළ හැකි ය.

**28.** 27 වන වගන්තිය යටතේ යම් පත්වීමක් කරනු ලැබුවා වූ ද එසේ පත් කරන තැනැත්තා නඩුවේ පාර්ශ්වකරුවකු වන්නා වූ ද අවස්ථාවක, (මියගිය ණයකරුගේ හෝ මියගිය තැනැත්තාගේ දේපළ ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා තහනම් කිරීම සහ විකිණීම ඇතුළුව) මේ පනත යටතේ පවරන ලද නඩුවේ දී කරන ලද සෑම ආඥාවක, නයිසයි තීන්දු ප්‍රකාශයක, නියත තීන්දු ප්‍රකාශයක, විකිණීමක හෝ දෙයකම මිය ගිය තැනැත්තාගේ පොල්මඃකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු මේ නඩුවට පාර්ශ්ව කරුවකු වූ මෙන්, ඊට සමාන ප්‍රතිඵලය තිබිය යුතු ය.

**29.** මේ පනත යටතේ පවරන ලද නඩුවක නියත තීන්දු ප්‍රකාශය සටහන් කිරීමෙන් පසුව ද තීන්දු ප්‍රකාශය ක්‍රියාවෙහි යෙදවීමට පළමුව ද ආයතනයක යම් ණයකරුවකු මිය යන හෝ වස්තු භංගත්වයට පත් හෝ සිහිවිකල් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලබන අවස්ථාවක නිසි ලෙස පත් කරන ලද අන්තිම කැමති පත්‍රයේ පොල්මඃකරු හෝ මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද නියෝජිතයකු හෝ අවස්ථාවෝචිත පරිදි බුන්වත් හෝ සිහිවිකල් තැනැත්තාගේ පැවරුම්කරු හෝ බූදලයේ කළමනාකරු නඩුවට පාර්ශ්වකරුවකු කර ඇත්නම් මිස, නියත ආඥාව ක්‍රියාවෙහි යෙදවීම හෝ බලාත්මක කිරීම සඳහා වූ කිසිම නඩු කටයුත්තක් ආරම්භ නොකළ යුතු ය ; එසේ ආරම්භ කර තිබුණත් එය බලරහිත විය යුතු ය.

**30.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ණය මුදල" යන්නෙන්, නඩුව පවරන වේලාවේ දී නිශ්චය වශයෙන් දැනගෙන ඇත්තා වූ හෝ නිශ්චය වශයෙන් දැනගැනීමට පුළුවන් වූ ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තා වූ ද, ඇපයක් ඇතිව හෝ නැතිව දෙන ලද්ද වූ ද හවුලේ වුව ද තනි තනිව වුව ද ගෙවිය යුතු වන්නා වූ ද, ණය දෙන ආයතනයක බැංකු කටයුත්තක්, ණය දීමේ කටයුත්තක්, මුදල් කටයුත්තක් හෝ වෙනත් ඊට සමාන ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් නිසා ඇති වූ බව එම ආයතනය විසින් කියා සිටිනු ලබන්නා වූ ද මුදල් ප්‍රමාණයක් අදහස් වන අතර ලියවිල්ලක් මගින් නොවූ පොරොන්දුවක් හෝ එකඟ වීමක් ඊට ඇතුළත් නොවේ ;

"ණය දෙන ආයතනය" යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ;

(ඇ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

(ඈ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව ;

(ඉ) (165 වන අධිකාරය වන) ලංකා සංවර්ධන මුල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද සංවර්ධන මුල්‍ය සංස්ථාව ; සහ

(ඊ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ මුදල් සැපයීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා ලියා පදිංචි කරන ලද සමාගමක්

අදහස් වේ ;

''වෙළෙඳපොළ අනුපාතිකය'' යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, ප්‍රවර්තන බැංකු පොලී අනුපාතික සැළකිල්ලට ගෙන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් තීරණය කරනු ලබන වාර්ෂික ප්‍රතිශත අනුපාතිකය අදහස් වේ.

''ප්‍රධාන නිලධරයා'' යන්නෙන්, එම ආයතනයේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ කළමනාකාරවරයකුගේ තත්ත්වයට නොඅඩු වෙනත් නිලධරයකු අදහස් වන අතර එම අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා හෝ කළමනාකාරවරයෙකු ගේ තත්ත්වයට නොඅඩු වෙනත් නිලධරයා විසින් විශේෂිතව බලය දෙන ලද එම ආයතනයේ වෙනත් යම් නිලධරයකු ඊට ඇතුළත් වේ.

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## පළමුවන උපලේඛනය (4 (2) වන වගන්තිය)

### නයිසයි තීන්දු ප්‍රකාශය පිළිබඳ පෝරමය

19 මස වන දින (විනිශ්චයකාරවරයාගේ නම හා ධුරය) ඉදිරිපිට මේ නඩුව සුදුස්සන් කිරිම සඳහා ඉදිරිපත් කරනු ලැබ, පැමිණිල්ල සහ ලේඛන කියවා බැලිමෙන්ද ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අඩංගු සම්ප්‍රකාශ ගැන සෑහීමට පත්වීයෙන් ද පසු ආඥා කර තීන්දු ප්‍රකාශ කරන වගනම්, රු..................ක මුදලක් ද.............. (දින) සිට ...................... දක්වා සියයට ................. ගණනේ පොලිය ද ඊට පසු මෙහි දිනයේ සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් එම අනුපාතිකය මත ම පොලිය ද නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බව ය. (තීන්දු ප්‍රකාශය නිශ්චල දේපළ භාරදීම සඳහා වන අවස්ථාවක දේපළ විස්තර කරන්න) සහනයය මුදල් හෝ නිශ්චල දේපළ හැර වෙනත් දෙයක් පිළිබඳ වන අවස්ථාවක සහනය දක්වන්න.

ඉහත නම සඳහන්..................................ගේ ගෙවල්, ඉඩම්, බඩු, ණය සහ අයවිය යුතු ණය තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් අධිකරණයේ මේ තීන්දු ප්‍රකාශය මගින් .................... ට විරුද්ධව පැමිණිලි කරු විසින් අයකර ගෙන ඇති මුදල ලබාගන්නා ලෙස ද මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කිරීමෙන් දින තිහක් ඇතුළත හෝ මේ අධිකරණය විසින් ඉඩ දෙන යම් දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත ඒ මුදල මේ අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙස ද....................පළාතේ පිස්කල් විසින් ඒ ඒ දේපළ විකුණූ මුදල හෝ මුදල් සහ තැනැත්තා හෝ තැනැත්තන් පිළිවෙලින් මේ අධිකරණයට දන්වන ලෙස ද .................... පළාතේ පිස්කල්ට මෙයින් අණකරනු ලැබේ. මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත්කළ පසු එය එම කාර්යය සඳහා අණපත්‍රයක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

තව ද 19........... මස ........... වන දින.............. (වේලාව) මෙම අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙසත් මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකිරීමට හේතු කිසිවක් ඇත්නම් ඒ හේතු දක්වන ලෙසත් එහි ඉහත කී................විත්තිකරු වන ඔබට මෙයින් නියම කරනු ලැබේ.

අත්සන් කළේ......................(විනිශ්චයකාරවරයාගේ නම සහ තනතුර) 19................මස.............. වන දින දී ය.

## දෙවන උපලේඛනය

### ලේඛනයේ ආකෘතිය

නඩුවේ පැමිණිලිකරුගේ විත්තිකරුගේ නයිසයි තීන්දු ප්‍රතිඵලය ඉටු කළ වෙනත්

| අංකය | නම | ප්‍රකාශය (නියත කලේද අහෝසි කලේද යන වග) | දිනය කරුණු |
|---|---|---|---|

## 1990 අංක 3 දරන උකස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

### උකස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**1.** මෙ පනත 1990 අංක 3 දරන උකස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) උකස් පනතේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

46. මෙ වගන්තිය බලාත්මකවීම ආරම්භවීමෙන් පසුව උකස් කරන ලද යම් ඉඩමක් සම්බන්ධයෙන් පවරන ලද යම් උකස් නඩුවක දී දෙනු ලබන තීන්දු ප්‍රකාශයක් මගින් සහ, එවැනි යම් උකසක් මත අයවිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා වූ යම් නඩුවක දී දෙනු ලබන තීන්දු ප්‍රකාශයක් මගින්, ඒ දේපළ යටතේ අය විය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඒ දේපළ නොවන වෙනත් කිසිදු දේපළක් විකිණීමට ආඥා නොකරනු ලැබිය යුතු අතර, එවැනි තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ දී, උකස් කර ඇති දේපළ නොවන වෙනත් කිසිදු දේපළක් විකිණීම හෝ විකිණීමට යටත් කිරීම නොකළ යුතු ය.

මෙ වගන්තියේ, ''උකසක් මත අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා වූ නඩුවක්'' යන්නට, නඩු පැවරීමට තුඩු දුන් නඩු නිමිත්ත උකසක් හේතු කොට ඇති වූවක් වුව ද නොඑසේ වුව ද, උකසක් මගින් ආරක්ෂිත කරන ලද යම් ණයක් අයකර ගැනීම සඳහා වූ යම් නඩුවක් ඇතුළත් වේ''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙහි ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 47අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :—

47අ. (1) මුල් මුදල රුපියල් එක් ලක්ෂ පනස් දහසකට වැඩි ණයක් ගෙවීම සඳහා ණය දෙන ආයතනයක් නමට උකස් බැඳුම්කරයක් ලියා අත්සන් කරන අවස්ථාවේ දී ම ඒ බැඳුම් කරය සහතික කරන නොතාරිස්වරයා විසින් ම සහතික කරනු ලබන්නා වූ ද එම සාක්ෂිකරුවන් විසින්ම සාක්ෂි දරනු ලබන්නා වූද පහත දැක්වෙන කාරණා, එනම්,—

(අ) 46 වන වගන්තියේ ප්‍රතිලාභ තමා විසින් අත්හරිනු ලබන බවටත් එසේ අත් හැරීමෙන් සිදුවන ප්‍රතිඵලය නොතාරිස්වරයා විසින් තමන්ට විස්තර කොට දෙන ලද බවටත් උකස්කරු විසින් කරන ලද විශේෂ ප්‍රකාශයක් ; සහ

(ආ) එවැනි අත්හැරීමක ප්‍රතිඵලය තමන් විසින් උකස්කරුට විස්තර කොට දෙන ලද බවට නොතාරිස්වරයා විසින් පිටසන් කොට කරන ලද අත්සන් කිරීමක්

ඇතුළත් වන්නා වූද වෙනම සාධන පත්‍රයක් උකස්කරු විසින් ලියා අත්සන් කර ඇති අවස්ථාවක දී, උකස් කර ඇති දේපළට අමතරව උකස්කරුට අයත් වෙනත් යම් දේපළක්, උකස් මත වූ නඩුවක තීන්දු ප්‍රකාශය මගින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විකිණීමට යටත් බවට ආඥා කරනු ලැබිය හැකි අතර ඒ

තීන්දු ප්‍රකාශ යටතේ විකුණනු ලැබිය හැකි ය. තව ද, එවැනි වෙනත් යම් දේපළක් තහනමට ගැනීමකට සහ විකිණීමකට, සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101 වන පරිච්ඡේදය) 218 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ආකාරයේ යම් නඩුවක දී, උකස් කරන ලද දේපළ විකුණා ඉන් උපලබ්ධ වන මුදල් තීන්දු ප්‍රකාශය ඉටු කිරීම පිණිස යොදවනු ලබන තෙක්, උකස් කර ඇති දේපළ නොවන උකස්කරු සතු වෙනත් යම් දේපළක් අල්ලා ගැනීම සහ විකිණීම සඳහා අධිකරණ විධානයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වෙනම සාධන පත්‍රයක් උකස්කරු විසින් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී, 46 වන වගන්තියේ ප්‍රතිලාභ අත් හරින බවට ඒ සාධන පත්‍රයෙන් විධිවිධාන සලස්වා ඇති බවත් එසේ ප්‍රතිලාභ අත් හැරීමේ ප්‍රතිඵලය වනුයේ උකස මත පවරනු ලබන නඩුවක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේදී උකසට තබා ඇති දේපළට අමතරව, උකස්කරු සතු වෙනත් දේපළ විකිණීමට යටත්වීම බවත් උකස්කරුට විස්තර කර දීම නොතාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ වගන්තියේ සඳහන් වන අමතර සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු නොගෙවිය යුතු ය.

(5) 69 වන වගන්තියේ සඳහන් වන ආකාරයේ සාධන පත්‍රයක් මගින් උකසක් ඇති කරනු ලැබ ණය දෙන ආයතනයක නිලධරයකු විසින් එය සහතික කොට ඇති අවස්ථාවක දී, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සහ (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා, උකස් බැඳුම්කරය සහතික කරන නොතාරිස්වරයා සම්බන්ධයෙන් ඒ විධිවිධානවල කර ඇති යම් සඳහනක් යට කී නිලධරයා සම්බන්ධයෙන් කර ඇති සඳහනක් සේ සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය බලාත්මක වීම ආරම්භවීමට පෙර ඇති කර ගන්නා ලද උකසක් මත වූ යම් නඩුවකට, මේ වගන්තියේ අඩංගු කිසිවක් අදාළ නොවන්නේ ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "ණය දෙන ආයතනය" යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව වූ බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ;

(ඇ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත යටතේ පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුව ;

(ඈ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකුව පනත යටතේ පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව ; සහ

(ඉ) 165 වන අධිකාරය වූ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත යටතේ පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව

අදහස් වේ.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස එහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය :—

"II අ වන කොටස

**නිශ්චල දේපළ පිළිබඳව පරාටේ බලය ක්‍රියාවේ යෙදවීමට බලය ඇති අවස්ථාවල දී මුදල් අයකර ගැනීම සඳහා වූ විශේෂ විධිවිධාන.**

62අ. නිශ්චල දේපළ ඇපයට තබාගෙන බැංකු හෝ වෙනත් ආයතන විසින් දෙන ලද ණය මුදල් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවලදී ඒ ණය මුදල් අයකර ගැනීම සඳහා ඇතැම් බැංකුවලට සහ වෙනත් ආයතනවලට ඇති පරාටේ බලය ක්‍රියාවේ යෙදවීමට ඒ බැංකුවලට සහ වෙනත් ආයතනවලට බලය පැවරෙන වෙනත් යම් නීතිවල විධිවිධානවලට අමතරව සහ ඒවාට හානියක් නොමැතිව මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

62ආ. (1) උකස් කරන ලද දේපළවල සන්තකය දුරීම හෝ ඒ දේපළ නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා යම් තැනැත්තකුට බලය දීමට බැංකුව හෝ යම් ආයතනයකට බලය ඇත්තා වූ අවස්ථාවක සිදුකර ඇති නැතහොත් සිදු කිරීමට ඉඩ ඇති යම් බාධකයක් හෝ විරෝධය පෑමක් හේතු කොට ගෙන ඒ ඉඩමේ සන්තකය ලබා ගැනීමට ඒ තැනැත්තාට නොහැකි වන්නා වූ හෝ නොහැකිවේ යයි ඔහු සැක කරන්නාවූ ද අවස්ථාවකදී, ඒ ඉඩම පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කොට, ඒ ඉඩමේ සන්තකය ඒ තැනැත්තා වෙත භාර දෙන ලෙස පිස්කල් නිලධරයාට විධාන කෙරෙන ආඥාවක් ඒ අධිකරණයෙන් ලබා ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත්තේ ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් පිස්කල් නිලධරයා වෙත නිකුත් කරන ලද අවස්ථාවක දී, ඔහු විසින් ඒ ආඥාව නොපමාව ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ ආඥාව ක්‍රියාත්මක කරන ලද ආකාරය ඔහු විසින් ලිඛිතව ඒ අධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ඒ ආඥාව අදාළ වන ඉඩමට ඇතුළු වීමට සහ ඒ ඉඩමේ පදිංචි යම් තැනැත්තකු ඉන් නෙරපා හැරීමට සහ ඒ බැංකුව හෝ ඒ ආයතනය සඳහා නැතහොත් එය වෙනුවෙන් ඒ ඉඩමේ සන්තකය භාර ගැනීමට බලය දෙන ලද නිලධරයා වෙත එහි සන්තකය භාර දීමට අවශ්‍ය වන බලහත්කාරයක් පිස්කල් නිලධරයා විසින් හෝ ඔහුගේ විධාන යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

62ඇ. උකස් කළ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් ද එය මිලදී ගත් ගැනුම්කරුට විකිණීමේ සහතිකය භාරදීමෙන් ද පසුව එළඹයි සන්තකය ලබා ගැනීමට ගැනුම්කරුට නොහැකි වන අවස්ථාවක, කොළඹ දිසා අධිකරණයට හෝ දේපළ පිහිටා ඇති ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසු ද විකිණීමේ සහතිකය ඉදිරිපත් කළ විට ද දේපළේ සන්තකය භාරදීම සඳහා වූ ආඥාවකට ගැනුම්කරු හිමිකම් ලැබිය යුතු ය.

62ඇ. 62ඇ වගන්තිය යටතේ වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඉදිරිපත් කිරීම ද ඒ ගැන සුදුස්සක් කිරීම ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව ලසු කාර්ය පටිපාටිය අනුව කළ යුතු ය. එවැනි එක් එක් ඉල්ලුම් පත්‍රයේ කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන සහ ඒ මත පවත්වන සියලු නඩු කටයුතු සඳහා මුද්දර ගාස්තු සහ වෙනත් ගාස්තු, තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ඉහත කී ඉල්ලුම් පත්‍රයට සමාන වටිනාකමක වූ නිශ්චල දේපළවල සන්තකය භාරදීම සඳහා දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා වූ ඉල්ලීමක් සඳහා හෝ එය ක්‍රියාවෙහි යෙදවීමට සම්බන්ධ හෝ ආනුෂංගික නඩු කටයුතු සඳහා ගෙවිය යුතු ඒ ඒ ගාස්තු ප්‍රමාණ අනුව ගෙවිය යුතු ය.

62ඉ. උකස් කළ දේපළ විකිණීමට උකස් ලාභියාට බලය දෙන නීතිය අනුව විකුණන ලද යම් නිශ්චල දේපළක්, ණයකරුගෙන් ස්වාධීන වූ හිමිකමක් යටතේ හෝ උකසට පළමුවෙන් නිසි ලෙස ලියා අත්සන් කරන ලද සහ නිසි ලෙස ලියා-පදිංචි කරන ලද සාධන පත්‍රයක් මගින් ඇති කරන ලද හිමිකමක් යටතේ යම් තැනැත්-තකුගේ සන්තකයේ හෝ පදිංචියේ ඇති අවස්ථාවක ගැනුම්කරුගේ අයිතිවාසිකම් අභිබවා එම තැනැත්තාගේ අයිතිවාසිකම්වලට ප්‍රමුඛත්වය ලැබිය යුතු අතර එම නිශ්චල දේපළෙහි සන්තකය භාරදීම සඳහා වූ ආඥාවකට ගැනුම්කරු හිමිකම් නො ලැබිය යුතු ය.

62ඊ. මීට ඉහතින් ඇති විධිවිධාන ප්‍රකාර විකුණන ලද යම් නිශ්චල දේපළක් ණයකරුගේ හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකුගේ හෝ බැංකුවට හෝ ආයතනයට දේපළ උකස් කරනු ලැබීමෙන් පසුව ණයකරු විසින් ඇති කරන ලද හිමිකමක් යටතේ හිමිකම් පාන යම් තැනැත්තකුගේ හෝ භුක්තියෙහි පවත්නා අවස්ථාවක, ගැනුම්කරු හෝ ඔහු වෙනුවෙන් සන්තකය භාර ගැනීම සඳහා ඔහු විසින් පත් කරනු ලැබූ තැනැත්තකු දේපළෙහි සන්තකයට පත් කිරීමෙන් එම දේපළ භාර දෙන ලෙස, දිසා අධිකරණය විසින් ආඥා කළ යුතු ය.

62උ. (1) උකස් හිමියාට දේපළ විකිණීමට බලය ලැබෙන නීතිය ප්‍රකාර විකුණන ලද යම් නිශ්චල දේපළක්, කුලී නිවැසියකුගේ හෝ උකස් ලියා අත්සන් කිරීමට පෙර ඇතුළත් වන ලද එකඟවීමක් ප්‍රකාර එය බුක්ති විඳීමට හිමිකම් ඇති වෙනත් තැනැත්තකුගේ හෝ බුක්තියෙහි පවත්නා, එහෙත් ඒ ගනුදෙනුව යථා පරිදි ලියා-පදිංචි කර නොමැති අවස්ථාවක, මෙහි පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය.

(අ) (i) තමාගේ වාසියට උකස ලියා අත්සන් කිරීම පිළිබඳව, උකස් ලාභියා විසින් කුලී නිවැසියාට හෝ බුක්තිය දරන තැනැත්තාට හෝ ඒ උකස ලියා අත්සන් කිරීමෙන් මාසයක් ඇතුළත ඉඩමේ නම සහ උකස් බැඳුම්කරය ලියාපදිංචි කර තිබෙන වෙළුම සහ පත් ඉරුව වැනි සම්පූර්ණ විස්තර ඇතුළත් දැන්වීමක් කර ඇත්නම් සහ ඒ දැන්වීම ලැබී මාසයක් ඇතුළත, මේ පනතේ පළමු වන උපලේඛනයේ 6 වන ආකෘති පත්‍රයට සාරානුකූල ලියවිල්ලක්, ඒ වෙළුමේ සහ පත්ඉරුවේ ලියාපදිංචි කිරීම, ඒ කුලී නිවැසියා හෝ බුක්තිය දරන වෙනත් තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත්, එවිට ගැනුම්කරු හෝ ඔහු වෙනුවෙන් සන්තකය භාර ගැනීම සඳහා ඔහු විසින් පත් කරනු ලැබූ තැනැත්තකු, දේපළෙහි සන්තකයට පත් කිරීමෙන් දේපළෙහි සන්තකය භාර දෙන ලෙස අධිකරණය විසින් ආඥා කළ යුතුය.

(ii) ගැනුම්කරුවකු හෝ වෙනත් තැනැත්තකු (අ) ඡේදය යටතේ සන්තකයට පත් කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, කුලී නිවැසියකු හෝ බුක්තිය දරන වෙනත් තැනැත්තකු සන්තකයෙන් බැහැර කරනු ලැබූ අවස්ථාවක, කුලී නිවැසියාගේ හෝ බුක්තියේ කාලසීමාව සැලකිල්ලට ගන්නා විට යුක්ති සහගත යැයි අධිකරණය කල්පනා කරන වන්දි මුදලක් ලැබීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු අතර, එසේ ආඥා කරන ලද වන්දි මුදල ගැනුම්කරුට සන්තකය ලැබීමෙන් පසුව පමණක්, ගැනුම්කරු විසින් කුලී නිවැසියාට හෝ බුක්තිය දරන තැනැත්තාට ගෙවිය යුතු ය.

(ආ) (i) තමාගේ වාසියට උකස ලියාපදිංචි කිරීම පිළිබඳව, උකස්ලාභියා විසින්, කුලී නිවැසියාට හෝ බුක්තිය දරන තැනැත්තාට හෝ ඒ උකස ලියා අත්සන් කිරීමෙන් මාසයක් ඇතුළත ඉඩමේ නම සහ උකස් බැඳුම්කරය ලියාපදිංචි කර තිබෙන වෙළුම සහ පත් ඉරුව වැනි සම්පූර්ණ විස්තර ඇතුළත් දැන්වීමක් කර ඇත්නම් සහ ඒ දැන්වීම ලැබී මාසයක් ඇතුළත, මේ පනතේ පළමුවන උපලේඛනයේ 6 වන ආකෘති පත්‍රයට සාරානුකූලව වූ ලියවිල්ලක්, ඒ දැන්වීමේ සඳහන් වෙළුමේ සහ පත් ඉරුවේ, ඒ කුලී නිවැසියා හෝ බුක්තිය දරන වෙනත් තැනැත්තා විසින් යථා පරිදි ලියා පදිංචි කර ඇත්නම් සහ ඒ පිළිබඳව වහාම උකස්ලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම්, විකිණීම සිදු වී ඇති බවට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වූ දැන්වීමක්, ඉඩමේ ප්‍රකටව පෙනෙන තැනක ඇලවීමෙන් සහ ණයකරුගේ සම්බන්ධතාවන් ගැනුම්කරු වෙත පවරා ඇති බව, අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයකට යම් පහසු ස්ථානයක දී කුලී නිවැසියාට හෝ බුක්තිය දරන තැනැත්තාට ප්‍රකාශයට පත් කිරීමෙන් සන්තකය භාර දෙන ලෙස දිසා අධිකරණය විසින් විධාන කළ හැකිය. එම ප්‍රකාශයට පත් කිරීමේ වියදම අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි අතර, ගැනුම්කරු විසින් එය කලින් ගෙවිය යුතු ය.

(ii) තමාගේ කුලී නිවැසි අයිතිවාසිකම් හෝ බුක්ති අයිතිවාසිකම වෙනුවට වන්දි වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් භාර ගැනීමට කුලී නිවැසියා හෝ බුක්තිය දැරීමට හිමිකම ඇති තැනැත්තා එකඟ වුවහොත්, එවිට, ගැනුම්කරු විසින් එම වන්දි මුදල අධිකරණයෙහි තැන්පත් කරනු ලැබීමෙන් පසුව පමණක් ගැනුම්කරු හෝ ඔහු වෙනුවෙන් බුක්තිය භාර ගැනීම සඳහා ඔහු විසින් පත් කරනු ලැබූ තැනැත්තා සන්තකයට පත් කිරීමෙන් සන්තකය භාර දෙන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(iii) දේපළ ව්‍යාපාරයක් හෝ පදිංචි ස්ථානයක් වන අවස්ථාවක, වන්දි මුදල් ප්‍රමාණය අවුරුදු පහක කුලිය විය යුතු අතර වෙනත් දේපළ සම්බන්ධයෙන් වන විට වන්දි මුදල එම කාරණයට අදාළ සියලු අවස්ථා ගත කරුණු අනුව යුක්තිසහගත බවට අධිකරණය විසින් සලකනු ලැබිය හැකි මුදල විය යුතු ය.

62ඌ. 62ඊ වගන්තිය යටතේ වූ සෑම ආඥාවක්ම සන්තකය භාරදීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන වගන්තිය යටතේ වූ ආඥාවක් ලෙස සැලකිය යුතු අතර 62උ වගන්තිය යටතේ වූ සෑම ආඥාවක් ම, සන්තකය භාරදීම සම්බන්ධයෙන් සිවිල් නඩු සංග්‍රහයේ 288 වන වගන්තිය යටතේ වූ ආඥාවක් ලෙස සැලකිය යුතු අතර, එසේ කරන ලද ආඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරය හා සමාන ආකාරයෙන් ක්‍රියාවේ යෙදවිය හැකි ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය අගට මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය එකතු කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**"6 වන ආකෘතිය**

**ඉඩමක බුක්තිය දැරීමේ අයිතියට අදාළ සාධක පත්‍රයක් ලියාපිදිංචි කිරීම සඳහා**

**ඉල්ලුම් පත්‍රය**

..............................ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙතය.

..............................හි (ලිපිනය) පදිංචි ..................... වන මම (සම්පූර්ණ නම) මෙහි පහත "ආ" ඡේදයෙහි විස්තර දක්වා ඇති එකහවීම ප්‍රකාර ඉඩමේ බුක්තිය දැරීමේ මගේ අයිතිවාසිකම මෙහි පහත 'අ' ඡේදයෙහි සඳහන් පත් ඉරුවල ලියාපදිංචි කිරීම සඳහා හෝ නොකඩවා ලියාපදිංචි කිරීම සඳහා.....................උකස් පනතේ.....................වන වගන්තිය යටතේ ඉල්ලුම් කරමි.

අ. වෙළුම :
පත් ඉරුව :
වෙළුම :
පත් ඉරුව :

ආ. බුක්තිය දැරීමේ මගේ අයිතිවාසිකම් එහි අයිතිකරු වන ....................................... විසින් ලියා අත්සන් කරන ලද.....................................වන දින දරන ඔප්පුව/සාධන පත්‍රය ප්‍රකාර වේ. නැතහොත් අයිතිකරු සමඟ වූ වාචික කුලී නිවැසි ගිවිසුමක් ප්‍රකාර වේ.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව වන රු ............................ක මුදල සඳහා මුද්දර මේ සමඟ ඉදිරිපත් කොට ඇත.

ඉල්ලුම්කරුගේ හෝ *අනුයෝජිතයාගේ අත්සන."

* අනුයෝජිතයා යන්නෙන් ඉල්ලුම්කරු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ අනුයෝජිතයකු අදහස් වේ.

## 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) (අ) දේපළ සම්බන්ධයෙන් වූ උකසක් මත බැංකුවක් මගින් යම් ණයක් ප්‍රදානය කරනු ලැබ ඇත්තා වූ, හෝ

(ආ) දේපළ සම්බන්ධයෙන් වූ උකසක් මත බැංකුවක් මගින් යම් ණයක් ප්‍රදානය කරනු ලැබුවා වූ යම් තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් වූ අන්තිම කැමති පත්‍රය පිළිබඳව ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ ලබාගෙන ඇත්තා වූ, හෝ තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් ඉල්ලීමක් කරනු ලැබ ඒ බූදලය නියෝජනය කිරීමට අධිකරණය විසින් පත් කරනු ලැබ ඇත්තා වූ, හෝ

(ආ) යම් ණයක් සඳහා වූ ඇපයක් වශයෙන් බැංකුවකට උකස් කරනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් කවර වූ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සිය කැමැත්තෙන් වූ සමර්පනයක් මගින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ පැවරී ඇත්තා වූ

සෑම තැනැත්තකුම, තමා වෙත වූ සියලු දැන්වීම් අමතනු ලැබිය හැකි ලිපිනයක් බැංකුව වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබීමට නියමිත යම් දැන්වීමක් ඒ උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයට ඔහු වෙත යොමු කරනු ලැබූ ලියාපදිංචි ලිපියක් මගින් තැපැල් මගින් යවනු ලැබුවහොත්, එය ඒ තැනැත්තා වෙත යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, සාමාන්‍ය තැපැල් කටයුතු අතරතුර ඒ ලිපිය භාරදෙනු ලැබිය යුත්තේ යම් වේලාවකදීද ඒ වේලාවේ දී එම ලිපිය භාරදීම ක්‍රියාත්මක කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද (1) වන උපවගන්තිය යටතේ තම ලිපිනය ලියාපදිංචි කිරීමට එවැනි යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඔහු අමතන ලද දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ යටත් පිරිසෙයින් දිනපතා පළ කෙරෙන ප්‍රවෘත්ති පත්‍ර තුනක බැංකුව විසින් පළ කරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීම අවසන් වරට පළකරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙහි ඒ දැන්වීම ඔහුට යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**3.** මුල් මුදල හෝ පොලිය හෝ ඒ දෙකම සම්බන්ධයෙන් යම් ණය මුදලක් මත ලැබිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරින කවර අවස්ථාවක වුවද පැහැර හැරීම, ණය මුදලෙන් ආපසු නොගෙවා ඇති සම්පූර්ණ කොටස සහ එතෙක් ඒ මත ලැබිය යුතුව තිබුණු පොලිය සම්බන්ධයෙන් කරන ලද පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින්, ස්වකීය අභිමතය අනුව 5 වන වගන්තියෙහි හෝ 4 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට ක්‍රියා කළ හැකි ය :

එසේ වුවද, මණ්ඩලය විසින් යම් කරුණක් සම්බන්ධයෙන් 5 වන වගන්තිය අනුව ක්‍රියා කර හෝ ක්‍රියා කිරීම ආරම්භ කර තිබෙන අවස්ථාවක, 4 වන වගන්තිය යටතේ යෝජනා සම්මතයක් මගින් පසුව යම් අවස්ථාවක ඒ කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු යයි හෝ අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නේ නම්, එසේ ක්‍රියා කිරීමෙන් කිසියම් අවස්ථාවක දී මණ්ඩලය වළක්වනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

**4.** 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් ණයක නොගෙවූ සම්පූර්ණ කොටස සහ විකිණීමේ දිනය දක්වා ඒ මත ලැබිය යුතු පොලිය සමග 13 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස, පැහැර හරිනු ලැබූ ඒ ණය වෙනුවෙන් ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යෝජනා සම්මතයෙහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට බලය දෙනු ලැබිය හැකිය.

**5.** (1) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු යෝජනා සම්මතයක් මගින්, එම යෝජනා සම්මතයෙහි නිශ්චිත යම් තැනැත්තකුට පැහැර හැරීම කරනු ලැබ ඇත්තේ යම් ණයක් සම්බන්ධයෙන්ද ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් දේපළකට ඇතුල්වීමට හෝ ඒ දේපළ සම්බන්ධයෙන් යම් ණය ගිවිසුම්වල නියමයන් කඩ කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දේපළ සන්තකයට ගෙන කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාමට ද උකස්කරු විසින් පැහැර හරිනු නො ලැබුවේ නම්, හෝ ඒ ගිවිසුමේ නියමයන් කඩ කරනු නොලැබුවේ නම්, ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ ඒ දේපළ පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ බලතලම ක්‍රියාත්මක කිරීමට ද බලය දෙනු ලැබිය හැකි ය.

(2) යම් පිරියතක, යන්ත්‍රයක හෝ වෙනත් චංචල දේපළක ඇපය මත යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායයක් සඳහා දෙන ලද යම් ණයක් මත බැංකුවට ලැබිය යුතු මුදල් කිසිවක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති කවර වූ විටෙක හෝ ඒ දේපළ සම්බන්ධයෙන් ණය ගිවිසුම්වල නියමයන් කඩ කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පිරියත, යන්ත්‍රය හෝ වෙනත් චංචල දේපළ පිහිටි කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායයට ඇතුළුවීමට සහ එය සන්තකයට ගැනීමට සහ ඒ නිශ්චල දේපළ ඔඩපනය කරනු ලැබුවේ නම් හෝ උකස් කරනු ලැබුවේ නම් ඒ ව්‍යවසාය පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඇති බලතලම ක්‍රියාත්මක කිරීමට ලියවිල්ලකින් නිශ්චිතව යම් තැනැත්තකුට මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි ය.

**6.** (1) යම් දේපළක් සම්බන්ධයෙන් 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට සාමාන්‍යයෙන් යෝජනා සම්මතය ප්‍රකාර ක්‍රියා කිරීම සහ විශේෂයෙන්ම—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට ;

(ආ) යම් ණයක් දෙනු ලැබුවේ යම් පිරියතක හෝ යන්ත්‍රයක ඇපය මත ද ඒ ණය පැහැර හරිනු ලැබ ඇත්නම්, ඒ පිරියතින් හෝ යන්ත්‍රයෙන් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් නිෂ්පාදනය කරන ලද බඩු විකිණීමට ;

(ඇ) ඒ දේපළෙන් ලැබෙන කුලී, ලාභ හෝ වෙනත් ආදායම් භාර ගැනීමට ;

(ඈ) ඒ දේපළ පාලනය කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී දරන ලද වියදම් ඒ දේපළෙහි ආදායමෙන් ගෙවීමට ;

(ඉ) තම සේවාවන් වෙනුවෙන් පාරිශ්‍රමිකය වශයෙන් නියම කිරීමට සුදුසු යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් මුදලක් (වේතොත්) දේපළෙන් තමාට ලැබෙන ඒ ආදාය-මෙන් තමා වෙත නතු කර ගැනීමට ; සහ

(ඊ) ඒ දේපළ සම්බන්ධයෙන් වූ උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණ-යෙන් ගෙවනු ලබන තෙක් හෝ (2) වන උපවගන්තිය යටතේ ඒ දේපළෙහි සන්තකය භාරදීමට මණ්ඩලය විසින් ඔහුට විධාන කරනු ලබන තෙක් හෝ ඒ දේපළෙහි සන්ත-කයෙහි රැඳී සිටීමට

හිමිකම් ඇත්තේය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ යෝජනා සම්මතය-යකින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකුම විසින්—

(අ) උකස්කරුගේ නඩත්තුව සඳහා මණ්ඩලය විසින් එහි අභිමතය අනුව නියම කරනු ලබන යම් මුදලක් (වේතොත්), ඒ දේපළෙහි ආදායමෙන් මාස්පතා උකස්කරුට ගෙවිය යුතු ය ;

(ආ) මෙහි මීන් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව, ඒ දේපළෙහි ආදායමෙන් ඉතිරිව ඇති ශේෂය, මණ්ඩලය විසින් විධාන කරනු ලබන තැනැත්තකුට හෝ තැනැත්-තන්ට හා එසේම විධාන කරනු ලබන ආකාරයට ත්‍රෛමාසිකව හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන අන්‍යාකාරයකින් ගෙවිය යුතු ය ;

(ඇ) ඒ දේපළ සම්බන්ධයෙන් ඔහු විසින් භාරගනු ලැබූ හෝ ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ පැහැදිලි සහ නිවැරදි වාර්තා, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල සීමා අනුව තැබීම ද මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ද කළ යුතු ය ; සහ

(ඈ) උකස්කරුට හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් තැනැත්තකුට ඒ දේපළෙහි සන්තකය භාර දිය යුතු අතර, මෙහි මින් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව ඒ දේපළෙහි ආදායමෙන් තම අතෙහි ඉතිරිව ඇති යම් ශේෂයක් මණ්ඩලයට ගෙවිය යුතු ය.

(3) උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලැබූ විට උකස් කරනු ලැබූ දේපළෙහි සන්තකය මණ්ඩලය විසින් උකස් කරුට පවාරණය කළ යුතු අතර, ඒ දේපළෙන් ලැබුණු ආදායමෙන් ඉතිරිව ඇති ශේෂය ඔහුට ආපසු දිය යුතු ය.

**7.** (1) (2) වන උපවගන්තියෙහි සලසනු ලැබූ අන්‍යාකාර විධිවිධාන හැර, ණය ගැනුම් කරුගේ මරණය සිදුවූව ද නැතහොත් ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ දේපළෙහි කවර වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් සමර්පනය කිරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට පැවරුණ ද යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් 4 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) ණය ගැනුම්කරුවකු මියගියවිට සහ ඔහුගේ අන්තිම කැමති පත්‍රය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය යම් තැනැත්තකුට නිකුත් කරනු ලැබ නොමැති අවස්ථාවක, කොළඹ දිසා අධිකරණය විසින් හෝ ණය ගැනුම්කරු විසින් බැංකුවට උකස් කරනු ලැබූ දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, බැංකුව විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට සහ අධිකරණය විසින් අණ කරනු ලබන පරිදි යම් තැනැත්තන් වෙතොත් ඒ තැනැත්තන් වෙත ඉල්ලීම පිළිබඳ දැන්වීමක් හෝ දීමෙන් පසුව සහ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම අනිසි ලෙස ප්‍රමාදවීමට ඉඩ ඇති බවට සෑහීමට පත්වන්නේ නම්, මේ වගන්තියේ කාර්ය සඳහා ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත්කළ හැකිය. තවද, ඒ ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට මේ උපවගන්තිය යටතේ තැනැත්තෙක් පත් කරනු ලබන්නේ නම් මිස, සහ එලෙස පත් කරනු ලබන තෙක් ඒ ණය ගැනුම්කරු විසින් කරනු ලැබූ යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් 4 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**8.** යම් දේපළක් විකිණීමට බලය දෙමින් 4 වන වගන්තිය යටතේ වූ සෑම යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් වූ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්වූ යටත් පිරිසෙයින් ප්‍රවෘත්ති පත්‍ර තුනක පළ කරනු ලැබිය යුතු ය. තවද, ණය ගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම් ඔහුට ද, 2 වන වගන්තියෙන් නියමිත පරිදි ඒ දේපළ සම්බන්ධයෙන් ඔහුගේ ලිපිය ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ සෑම තැනැත්තකුටම ඒ දැන්වීමේ පිටපත් යැවිය යුතු ය. තව ද, රජයෙන් දෙනු ලැබූ බද්දක් යටතේ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාවක් ඒ දේපළෙහි සමන්විත වෙතොත් ඉඩම් කොමසාරිස්වරයාට එහි පිටපතක් යැවිය යුතු ය.

**9.** 4 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ සෑම විකිණීමක් සම්බන්ධයෙන් දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක් ඒ විකිණීමක් සඳහා නියමකරන ලද දිනයට දින දහ හතරකට නොඅඩුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර ඒ දැන්වීමෙහි පිටපත්—

(අ) ණය ගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම්, ඔහුට ද යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් දැන්වීම 2 වන වගන්තිය යටතේ යැවීමට නියමිත සෑම තැනැත්තකුටම ද යැවිය යුතු ය ;

(ආ) විකුණනු ලැබිය යුතු දේපළෙහි හෝ ඒ අසළ අලවනු ලැබිය යුතු ය.

**10.** (1) ගෙවිය යුතු පොලිය සහ 13 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු කිසිවක් වෙතොත්, ඒ සමග ණය සම්බන්ධයෙන් නොගෙවා ඇති පංගුවේ සම්පූර්ණ මුදල විකිණීම සඳහා නියම කරන ලද දිනයට පෙර යම් වේලාවක දී මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, දේපළ විකුණනු නොලැබිය යුතු අතර ඒ දේපළ විකිණීම සඳහා 4 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය අනුව කටයුතු කිරීමෙහිලා වැඩිදුර පියවර කිසිවක් නොගත යුතු ය.

(2) පැහැර හැරීම කරනු ලැබුවේ යම් වාරිකයක් සම්බන්ධයෙන් ද ඒ වාරිකයේ මුදල සහ 13 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු කිසිවක් වෙතොත් එය, විකිණීම සඳහා නියම කරන ලද දිනයට පෙර යම් වේලාවක දී මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, දේපළ නොවිකිණිය යුතු බවට සහ ඒ දේපළ විකිණීම සඳහා 4 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් අනුව කටයුතු කිරීමෙහිලා වැඩිදුර පියවර කිසිවක් නොගත යුතු බවට මණ්ඩලය විසින් ස්වකීය අභිමතය අනුව විධාන කරනු ලැබිය හැකිය.

**11.** දේපළ උකස් කොට ඇත්තා වූ බැංකුවට හැර වෙනත් යම් තැනැත්තකුට යම් ආරම්භක ලංසුවට අඩුවෙන් එම දේපළ නොවිකිණිය යුතු වන්නේ ද එම මිල මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය.

**12.** (1) එකම දේපළක් ඇපය වශයෙන් ඇතිව බැංකුවක් විසින් ණය දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත්තා වූ සහ ඒ ණයවලින් එකක් හෝ වැඩි ගණනක් සඳහා ලැබිය යුතු යම් මුදලක් ගෙවීම සම්බන්ධයෙන් පැහැර හැරීමක් කරනු ලබන යම් අවස්ථාවක දී, වෙනත් ණය හෝ වෙනත් ණය අතුරින් කිසිවක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් කරනු නොලැබුව ද මේ පනතේ ඉහතින් වූ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද, මණ්ඩලය විසින් එවැනි යම් අවස්ථාවක දී 4 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ණය දෙකම හෝ සියලු ණය සම්බන්ධයෙන් බැංකුවට ලැබිය යුතු මුළු මුදල අයකර ගැනීම සඳහා දේපළ විකිණීමට බලය දෙනු ලැබිය හැකි අතර, ඒ අනුව මේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) 3 වන වගන්තියේ සිට 15 වන වගන්තිය (වගන්ති දෙක ම ඇතුළුව) දක්වා වූ වගන්තිවල ඇතුළත් කිසිවකින්, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව උකස්කරයක් මත ලැබිය යුතු මුදල අයකර ගැනීම තහනම් කරන්නේ යයි කියවීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

**13.** යම් ණයක් මත ලැබිය යුතු මුදලට අතිරේකව, ණය ගැනුම් කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගෙන්, මණ්ඩලය විසින්—

(අ) ණය දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කරනු ලැබූ උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්තිවලට අනුකූලව, බැංකුවට උකස් කරන ලද දේපළ මත බලාන්විත කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වූ වාරික සහ වෙනත් ගාස්තු ගෙවීමේදී සහ ණය ගැනුම්කරු විසින් ලියා අත්සන් කරනු ලැබූ ඒ උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්ති යටතේ බැංකුව විසින් දරනු ලැබීමට බලය දෙන ලද වෙනත් සියලු වියදම් සහ ගාස්තු ගෙවීමේ දී බැංකුව විසින් වියදම් කරන ලද සියලු මුදල් ;

(ආ) උකස් කරන ලද දේපළ විකිණීම සම්බන්ධයෙන් ප්‍රචාරක දැන්වීම් පළ කිරීමේ සහ ඒ දේපළ විකිණීමේ ගාස්තු :

එසේ වුවද (ආ) ඡේදය යටතේ දරන ලද ගාස්තු නියම කරනු ලබන පරිදි ණයෙහි යම් ප්‍රතිශතයක් නොඉක්ම විය යුතු ය.

**14.** උකස් කරනු ලැබූ දේපළ විකුණනු ලැබුවහොත්, උකස මත ලැබිය යුතු මුදල සහ 13 වන වගන්තිය යටතේ අයකර ගනු ලබන මුදල් සහ ගාස්තු, විකිණීමෙන් ලත් මුදලින් අඩුකර ගැනීමෙන් පසුව, ඉතිරිවන ශේෂයන් වෙතොත්, ඒ ශේෂය ණය ගැනුම් කරුට හෝ ණය ගැනුම්කරුට ලැබිය යුතු ගෙවීම භාර ගැනීමට නීත්‍යානුකූල හිමිකම ඇති යම් තැනැත්තකුට හෝ බැංකුව විසින් ගෙවිය යුතු ය. නැතහොත් මුදල් ගෙවිය යුත්තේ කවරකුටදැයි මණ්ඩලයට යම් සැකයක් ඇති විටක, උකස් කරනු ලැබූ දේපළ පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයට ඒ මුදල මණ්ඩලය විසින් ගෙවිය යුතු ය.

**15.** (1) උකස් කරනු ලැබූ දේපළ විකුණනු ලැබුවහොත් මණ්ඩලය විසින් විකිණීම පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එවිට ඒ දේපළට සහ ඒ දේපළ සම්බන්ධයෙන් ණය ගැනුම්කරුට ඇති සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාව ගැනුම්කරු වෙත සතු විය යුතු ය. තවද, ඉන්පසුව දේපළට සහ දේපළ සම්බන්ධයෙන් ණය ගැනුම්කරුගේ කවර වූ හෝ අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව, දේපළ බැංකුව වෙත උකස් කළ දිනයට අනතුරුව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් නියාදනයක් මගින් හෝ ඒ යටතේ හිමිකම් පාන යම් තැනැත්තකුට කවර වූ යම් හේතුවක් නියා විකිණීම අවලංගු කිරීමට හෝ ගැනුම්කරුට විරුද්ධව දේපළටහෝ දේපළ සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට හෝ යම් අධිකරණයක දී ඉල්ලා සිටිය නොහැකි විය යුතු ය.

(2) යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සහතිකයක්, එම දේපළ විකිණීමට අදාළව මේ පනතේ සියලු විධිවිධාන අනුව කටයුතු කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(3) ගැනුම්කරු බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු වන්නේ නම්, සහතිකය නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු ය. තවද, ගැනුම්කරු බැංකුව වන්නේ නම් සහතිකය නියම කරනු ලබන වෙනත්, ආකෘතියකට සාරානුකූල විය යුතු ය.

(4) විකිණීම පිළිබඳ සෑම සහතිකයක්ම, දේපළ සමර්පනය කිරීමක් වූවාක් ලෙස මුද්දර ගාස්තුවට හා අයකිරීම්වලට සහ නීතියෙන් බලය දෙනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහ වෙනත් ගාස්තුවලට යටත් විය යුතු අතර එකී සියලු ගාස්තු හා අය කිරීම් ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

(5) විකුණනු ලැබූ දේපළ රජයෙන් ලබාගත් බද්දක් යටතේ බදු ගැනුම්කරුවෙකුගේ සම්බන්ධතාවකින් සමන්විත වන අවස්ථාවක, එවිට, දේපළෙහි ගැනුම්කරු බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු වන්නේ නම්, තම අභිමතය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉඩම් කොමසාරිස්වරයා විසින් ගැනුම්කරු අනුමත කරනු ලැබ ඇත්නම් මිස, විකිණීම පිළිබඳ සහතිකය මණ්ඩලය විසින් අත්සන් කරනු නොලැබිය යුතු ය.

(6) රජයෙන් ලබාගත් බද්දක් යටතේ වූ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධිකම් සම්බන්ධයෙන් යම් ගැනුම්කරුවකු අනුමත කිරීමට (5) වන උපවගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්වරයා ප්‍රතික්ෂේප කරන කවර වූ අවස්ථාවක—

(අ) විකිණීම සම්බන්ධයෙන් ගැනුම්කරු විසින් බැංකුවට ගෙවන ලද සියලු මුදල් මණ්ඩලය විසින් ඔහුට ආපසු ගෙවිය යුතු ය.

(ආ) ඒ විකිණීම පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පළ කිරීමේ සහ ඒ විකිණීම් පැවැත්වීමේ වියදම්, 13 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගනු ලැබිය යුතු ගාස්තු ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව දේපළ නැවත විකුණනු ලැබිය යුතු ය.

**16.** (1) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක ගැනුම්කරු විසින්, කොළඹ දිසා අධිකරණය වෙත නැතහොත් ඒ දේපළ පිහිටියේ යම් ස්ථානයක ද ඒ ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, සහ 15 වන වගන්තිය යටතේ එම දේපළ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විකිණීම පිළිබඳ සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, එම දේපළෙහි සන්තකය භාරදීමේ ආඥාවකට ඒ ගැනුම් කරුට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක්ම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පටිපාටිය අනුව කරනු ලැබිය යුතු අතර, එලෙස සුදුස්සක් කරනු ලැබිය යුතු ය. තවද, ඒ එක් එක් ඉල්ලීමෙහි කාර්යය සඳහා ඉදිරිපත් කෙරෙන සියලු ලේඛන වෙනුවෙන් සහ ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන සියලු නඩු කටයුතු වෙනුවෙන් එම ඉල්ලීම අදාළ වන්නේ යම් දේපළකට ද එහි වටිනාකමට සමාන වටිනාකමක් ඇති යම් නිශ්චල දේපළක සන්තකය භාරදීම සඳහා දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉල්ලීම වෙනුවෙන් සහ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික නඩු කටයුතු වෙනුවෙන් තත්කාලයෙහි වලංගුව බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙළින් ගෙවිය යුතු අනුප්‍රමාණයක් අනුව මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම් ගෙවිය යුතු ය.

(3) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් ණය ගැනුම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ බැංකුවට එම දේපළ උකස් කිරීමට අනතුරුව, ණය ගැනුම්කරු විසින් ඇතිකරන ලද හිමිකමක් යටතේ හිමිකම් පාන යම් තැනැත්තකු විසින් හෝ පදිංචියට ගෙන ඇති අවස්ථාවක, දිසා අධිකරණය විසින්, ගැනුම්කරුට හෝ ඔහු වෙනුවෙන් දේපළෙහි සන්තකය භාර ගැනීමට ඔහු විසින් පත් කරනු ලබන යම් තැනැත්තකුට දේපළෙහි සන්තකය භාර දිය යුතු යයි ආඥා කරනු ලැබිය හැකිය.

(4) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් කුලී නිවැසියකු විසින් හෝ එහි පදිංචියට හිමිකම් ඇති වෙනත් තැනැත්තකු විසින් හෝ පදිංචියට ගෙන ඇති අවස්ථාවක, විකිණීම සිදු වූ බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දැන්වීමක්, දේපළෙහි ප්‍රකට ස්ථානයක ඇලවීමෙන් සහ ණය ගැනුම්කරුගේ සම්බන්ධතාව ගැනුම්කරුට පවරන ලද බවට පහසු ස්ථානයක දී අණ බෙර ගැසීමෙන් හෝ වෙනත් යම් ව්‍යවහාරික ක්‍රමයකින් හෝ අධිකරණය විසින් ප්‍රදාන කරනු ලබන වෙනත් ක්‍රමයකින් පදිංචිකරුට ප්‍රකාශනය කිරීමෙන් භාරදීම කරනු ලැබිය යුතු බවට දිසා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශනයේ වියදම අධිකරණය විසින් නියම කළ යුතු අතර, සෑම අවස්ථාවක දී ම ගැනුම්කරු විසින් එය කලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ වූ සෑම ආඥාවක් ම, අවස්ථාවෝචිත පරිදි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන හෝ 288 වන වගන්තිය යටතේ කරන ලද සන්තකය භාරදීම සඳහා වූ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සංග්‍රහයේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා ණය ගැනුම්කරු සහ ගැනුම්කරු පිළිවෙළින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ණය හිමියා ලෙස සලකා එසේ කරන ලද ආඥාවක් මෙන් සමාන ආකාරයකින් බලාත්මක කරනු ලැබිය හැකි ය.

**17.** විකුණනු ලැබූ දේපළ බැංකුව වෙනුවෙන් මිලට ගෙන ඇති අවස්ථාවක, මණ්ඩලය විසින්, ඒ දේපළ නැවත විකිණීමට පෙර යම් අවස්ථාවක, ඒ දේපළ විකුණනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල (තහනමට ගැනීමේ සහ විකිණීමේ මුදල ඇතුළුව) සහ වර්ෂයකට නියමිත අනුප්‍රමාණය නොඉක්මවන අනුප්‍රමාණයක් අනුව මුළු මුදල මත පොලිය ණය ගැනුම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට විකිණීම පිළිබඳ සහතිකයේ සහතික පිටපතක් මත ඒ බවට පිටසනක් කිරීමෙන් විකිණීම අවලංගු කරනු ලැබිය හැකි ය. එවැනි පිටසනක් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාල-යෙහි ලියාපදිංචි කරනු ලැබූ විට, විකිණීම මේ පනත යටතේ කරනු හෝ කරනු නොලැබූ ලෙස ණය ගැනුම්කරු වෙත එකී දේපළ නැවත සතුවන්නේය.

**18.** එසේ විකුණනු ලැබූ දේපළ බැංකුව වෙනුවෙන් මිලට ගනු ලැබ, 17 වන වගන්තිය යටතේ විකිණීම අවලංගු කරනු ලැබ නොමැති නම්, මණ්ඩලය විසින් යම් අවස්ථාවක දී දේපළ නැවත විකුණා 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ සහතික පිට පතක් මත පිටසනක් කිරීමෙන් ගැනුම්කරු විසින් මුල් විකිණීමේ දී අත්කර ගනු ලැබිය හැකි වූ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරුට පවරා දෙනු ලැබිය හැකි ය. මුල් විකිණීමේ දී ගැණුම් කරුවකුට දෙන සහතිකයට අවශ්‍ය ප්‍රමාණයේම මුද්දර ගාස්තුවට සහ අයකිරීම්වලට ඒ පිටසන යටත් විය යුතු අතර, එය ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට, ඉහත කී පරිදි, ඒ අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරු වෙත සතු විය යුතු ය.

**19.** මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුව වූ යම් විකිණීමකදී ණයක් ආපසු ගෙවීම පැහැර හැරීම නිසා විකුණන ලද යම් දේපළක් බැංකුව විසින් මිලට ගෙන ඇතොත්, ණය, පොලිය වියදම් සහ ගාස්තු සම්බන්ධයෙන් බැංකුවට ලැබිය යුතු යම් මුදලක් සඳහා එම දේපළ නැවත විකිණීමට බැංකුවට හැකිවීම පිණිස අවශ්‍ය කාලයට වඩා දීර්ඝ කාලයක් බැංකුව විසින් ඒ දේපළ තබා ගැනීම නොකළ යුතු ය.

**20.** බැංකුවට උකස් කරනු ලැබූ යම් දේපළක් විකිණීමට 4 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ තැනැත්තකුට ඒ විකිණීම කරගෙන යාමෙන් යුක්ති සහගත හේතුවක් නොමැතිව විරෝධය පාන්නා වූ අවහිර කරන්නා වූ හෝ වළක්වන්නා වූ යම් තැනැත්තෙක්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ දඩුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**21.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියම කර ඇත්තා වූ සියලු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළකල යුතු අතර, ඒ පළකිරීමේ දින සිට හෝ නියෝගවල සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට, හෝ ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගති-යක් නොමැති විය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**22.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි.—

"බැංකුව" යන්නෙන්—

(අ) (397 වන අධිකාරය වූ) ලංකා බැංකුව ආඥපනතින් පිහිටුවන ලද ලංකා බැංකුව ;

(ආ) 1961 අංක 29 දරන මහජන බැංකුව පනතින් පිහිටුවන ලද මහජන බැංකුව ;

(ඇ) 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද යම් බැංකුවක් හැර, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් වාණිජ බැංකුවක් අදහස් වන අතර, (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව පනතින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව ඊට ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය ;

බැංකුවක් සම්බන්ධයෙන් වන විට "මණ්ඩලය" යන්නෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ බැංකුවේ කළමනාකරණය හෝ පරිපාලනය තත්කාලයෙහි භාරව සිටින කවර වූ නාමයකින් හෝ නිල නාමයකින් හඳුන්වනු ලබන යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"ණය" යන්නෙන් මුදලින් වූ ණයක් අදහස් වන අතර, කවර වූ නාමයකින් හෝ නිල නාමයකින් හඳුන්වනු ලබන යම් අයිරාවක් හෝ අත්තිකාරමක් හෝ වෙනත් යම් මූල්‍ය පිළිසරණක් ඊට ඇතුළත් වේ ;

"දේපළ" යන්නෙන් යම් චංචල හෝ නිශ්චල දේපළක් අදහස් වන අතර, රජයෙන් ලබාගත් බද්දක් යටතේ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාව පිළිබඳ උකසක් මගින් ණයක් සුරැකුම් කරනු ලැබූ අවස්ථාවක බදු ගැනුම්කරුගේ අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාව ඊට ඇතුළත් වේ.

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]**

**1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 15 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි "වරදකරු විය යුතු අතර" යන වචන වෙනුවට "වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "රුපියල් දෙසීයය දක්වා ව්‍යාප්ත විය හැකි දඩයකින් අයිතිකරුට දඬුවම් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "අයිතිකරු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසීයක් නොඉක්මවන දඩයකට අයිතිකරු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** 29 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

29අ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලබන අවස්ථාවක—

(අ) එම පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම ;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම ; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොවූ මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම

වරදකට වරදකරු විය යුතු ය :

එසේ වුව ද, එම වරද තමාගේ දැනීමක් නොමැතිව සිදු කරන ලද බව හෝ, එම වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි අනලස්භාවයෙන් තමා ක්‍රියා කළ බව හෝ එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ ලේකම්වරයා විසින් හෝ එම ව්‍යාපාරික ආයතනයේ හවුල්කරු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු එම වරද සඳහා වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.".

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 1990 අංක 9 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**1979 අංක 58 දරන ගොවිජන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත, 1990 අංක 9 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 27 වන වගන්තිය, එහි අගට, මෙහි පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"මේ උපවගන්තියේ කාර්ය සඳහා "සම්බන්ධතාවක්" යන්නට අඳ ගොවියකුගේ "අඳ" අයිතිවාසිකම් ද, ඒ ඉඩමේ බදු ගැනුම්කරුවකුගේ අයිතිවාසිකම් සහ "තට්ටුමාරු" අනුව භුක්ති විඳින ඉඩමක හවුල්කරුවන්ගේ බහුතරයේ අයිතිවාසිකම් ද ඇතුළත් වේ.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

29. (1) යම් කෘෂිකාර්මික ඉඩමක උකසක් හෝ බැඳීමක් මත ප්‍රදානය කර ඇති යම් ණය මුදලක් සහ ඒ ණය මුදලේ පොලිය සම්බන්ධයෙන්, මේ කොටසේ විධිවිධාන යටතේ පැහැර හැරීමක්කර ඇති හෝ කරනු ලැබ ඇතැයි සැලකෙන අවස්ථාවක, නියමිත බැංකුව විසින් දැන්වීමක් මගින්, ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමි ගොවියා හෝ බුත්තිකරු ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම, ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනුගත කර තැබිය යුතු අතර ඒ අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ මුදල අයවිය යුතුව ඇතැයි තීරණය කරනු ලබන යම් මුදලක් වෙතොත් ඒ මුදල ඉක්මවිය හැකි වුව ද එය නොතකා, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ම, අය කර ගත යුතු ය.

(3) සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති මුදල, ඒ සහතිකයේ නම් කර ඇති පැහැර හරින්නාගෙන් නියමිත බැංකුවට අය විය යුතු බවට, නියමිත බැංකුව විසින් තත් කාර්යය සඳහා බලය දී ඇති නිලධරයකුගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ මුදල ඒ පැහැර හරින්නාගෙන් ඒ බැංකුවට අය විය යුතු බවට, (2) වන උපවගන්තියේ කාර්ය සඳහා බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේය.

(4) පැහැර හරින්නා අඳ ගොවියකු වන්නා වූ ද එකී පැහැර හැර ඇති මුදල (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ආපසු අයකර ගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි හෝ අනවස්ථෝචිත බවට නියමිත බැංකුව විසින් කොමසාරිස්වරයාට වාර්තා කරන්නා වූ ද අවස්ථාවක, විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ මුදල ආපසු අය කර ගත නොහැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, නියමිත බැංකුවට ඒ මුදල ගෙවනතෙක් ඒ පැහැර හරින්නාගේ අඳ අයිතිවාසිකම කොමසාරිස්වරයා විසින් අත්හිටුවිය හැකි ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කවර හෝ අධිකරණයක පවරනු ලබන සියලු නඩු කටයුතුවලට, ඒ අධිකරණයේ අනෙකුත් සියලු කටයුතු අභිබවා ප්‍රමුඛත්වය ලැබිය යුතු අතර, කෙසේ වුවත්, නියමිත බැංකුව විසින් නඩු කටයුතු පවරනු ලැබීමේ සිට මාස හයක් ඇතුළත අවසන් කළ යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්,

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව මෙහි පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) නියමිත බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද යම් ණය මුදලක්, සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ බුත්තිකරු විසින්, අවස්ථාවෝචිත පරිදි යම් බෝග වැවීම සඳහා හෝ වෙනත් කෘෂි නිෂ්පාදන සඳහා නැතහොත් ගව ආදී සතුන්, ගව ආදී සතුන්ගේ ආහාර හෝ කෘෂිකාර්මික උපකරණ මිල දී ගැනීම සඳහා යොදාගෙන ඇත්තා වූ අවස්ථාවක, ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුගෙන් හෝ බුත්තිකරුගෙන්, ඒ නියමිත බැංකුවට අය විය යුතු හෝ ඒ අයිතිකරු හෝ බුත්තිකරු විසින් නියමිත බැංකුවට ගෙවිය යුතු ඒ ණය මුදල—

(අ) ඉඩමේ බෝග කෙරෙහි හෝ වෙනත් කෘෂි නිෂ්පාදන කෙරෙහි ; සහ

(ආ) ගව ආදී සතුන්, ගව ආදී සතුන්ගේ ආහාර හෝ කෘෂිකාර්මික උපකරණ කෙරෙහි

ප්‍රථම වැය බරක් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ප්‍රථම වැය බරෙහි විෂය වස්තුව සමන්විත වන දේපළ තහනමට ගෙන විකිණීමෙන්, නියමිත බැංකුව විසින්, ඒ ප්‍රථම වැය බර බලාත්මක කළ හැකිය.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 1990 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1990 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතේ 41 වන වගන්තියෙහි "නිශ්චල දේපළක්" යන වචන වෙනුවට "චංචල හෝ නිශ්චල හෝ දේපළක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1990 අංක 13 දරන භාර ලදුපත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**භාර ලදුපත් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 13 දරන භාර ලදුපත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) භාර ලදුපත් ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (v) වන ඡේදයේ ඇති ''නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වන පොරොන්දුවක්'' යන වචන වෙනුවට ''නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වන පොරොන්දුවක් ;'' යන වචන ආදේශ කිරීමෙන්,

(2) එම උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

''(vi) රක්ෂණය කළ හැකි සියලුම අවදානම්වලට එරෙහිව භාණ්ඩ රක්ෂණය කළ හැකි සම්පූර්ණ වටිනාකමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් වන ආකාරයට ම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක්.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (v) ඡේදයේ ඇති ''නියෝජිත ආයතනයට අවසරදීම සඳහා වන පොරොන්දුවක්'' යන වචන වෙනුවට ''නියෝජිත ආයතනයට අවසරදීම සඳහා වන පොරොන්දුවක් ;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

''(vi) එම භාණ්ඩ අපනයනය කරන තුරු, රක්ෂණය කළ හැකි සියලුම අවදානම්වලට එරෙහිව එම භාණ්ඩ රක්ෂණය කළ හැකි සම්පූර්ණ වටිනාකමටම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් වන ආකාරයටම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක්.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇති (iv) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(iv) භාර ලදුපත ලියා අත්සන් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා යම් කඩ කිරීමක් සිදු කරන්නේ නම් හෝ භාර ලදුපතේ සඳහන් වන පොරොන්දුවක් වන අවස්ථාවෝචිත පරිදි 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ (3) වන උප වගන්තියේ නැතහොත් 3 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුවකට එකඟව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් හෝ ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ නියෝජිත ආයතනයට ගෙවීමට ඇති හෝ අයවීමට ඇති මුදල බවට භාර ලදුපතේ සඳහන් වන මුදලට අඩු නොවන්නා වූ ද එම මුදලේ තුන්ගුණයට වැඩි නොවන්නා වූ ද මුදලක් දඩ වශයෙන් ගෙවීමට හෝ ඔහු යටත් විය යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :

4අ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම හෝ ලේකම් වරයකුම ද ;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එම ව්‍යාපාර ආයතනයේ සෑම කොටස්කරුවකුම ද ; සහ

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තෙක්ම ද

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුමක් නොමැතිව බවට හෝ එම වරද සිදුකිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට එම සංස්ථාවේ අධ්‍යක්ෂ වරයා හෝ නිලධරයා හෝ එම ව්‍යාපාර ආයතනයේ කොටස්කරු ඔප්පු කරන්නේ නම්, ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

5. (1) මේ ආඥාපනතෙහි "අනුමත ණය නියෝජිත ආයතනය" යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලයලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ;

(ඇ) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව ;

(ඉ) 6 වන වගන්තිය යටතේ ආඥවක් කරනු ලැබ ඇත්තේ යම් සමාගමක් හෝ සමූපකාර සමිතියක් හෝ සම්බන්ධයෙන් ද, ඒ සමාගම හෝ සමූපකාර සමිතිය

අදහස් වේ ;

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් ආයතනයක් විසින් භාර ලදුපත් ලියා අත්සන් කිරීමේ ප්‍රතිඡ්ඨාව වශයෙන් ණය දීමේ හෝ ණය පහසුකම් සැලසීමේ බලය, එම ආයතනය පිහිටුවීමේ සහ එම ආයතනය වෙත කාර්යය සහ කර්තව්‍ය පවරන පනත මගින් එම ආයතනය වෙත පවරනු ලැබ නැත්නම්, මේ පනතේ ඇති කිසිවකින් එසේ ණය දීමට හෝ ණය පහසුකම් සැලසීමට එම ආයතනයට බලය පවරන ලෙස සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ බලය පවරන බවට තේරුම් නොගත යුතු ය.''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එකතු කරනු ලැබේ :—

6. වාණිජ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය ස්ථාවරත්වයක් සහ තත්ත්වයක් ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සඳහන් නොකරන ලද කිසියම් සමූපකාර සමිතියකට හෝ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යයි ප්‍රකාශ කිරීම, ජාතික ආර්ථිකයේ යහපත පිණිස යෝග්‍ය වන්නේ යයි වාණිජ අධ්‍යක්ෂවරයා අදහස් කරන අවස්ථාවල, ඔහු විසින් එම විධිවිධාන එසේ අදාළ විය යුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.''.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

**නිශ්චිත නියමයන්ට අනුකූලව දේශීය භාර ලදුපත් ලියා අත්සන් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාද විධි විධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) ශ්‍රී ලංකාවේ දේශය ඇතුළත ප්‍රවාහනය කිරීමේ සහ විකිණීමේ කාර්ය සඳහා භාණ්ඩ මිල දී ගැනීමට තමා අදහස් කරන බවට යම් තැනැත්තකු විසින් යම් අනුමත ණය නියෝජිත ආයතනයක් වෙත කරනු ලබන ප්‍රකාශයක් මත, එම භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ කාර්ය සඳහා සහ එම භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ විකිණීම සම්බන්ධයෙන් ද, එම භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ විකිණීම සඳහා සූදානම් කිරීම සම්බන්ධයෙන් ද සිදුවන වියදම පියවීමේ කාර්ය සඳහා (මෙහි මින්මතු 'දේශීය භාර ලදුපතක්' යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ විධි

විධානවලට අනුකූල වූ ලේඛනයක් එම නියෝජිත ආයතනයේ නමට ලියා අත්සන් කිරීමෙන් එම තැනැත්තා විසින් එම නියෝජිත ආයතනයෙන් ණයක් අයිරාවක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් අත්තිකාරම් මුදලක් ලබා ගන්නා අවස්ථාවක දී, එම භාර ලදුපත සම්බන්ධයෙන් ද එය අදාළ වන භාණ්ඩ සම්බන්ධයෙන් ද 3 වන වගන්තියේ විධිවිධාන අදාළ කරගත හැකි විය යුතු ය.

(2) මෙම උපවගන්තියේ විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම සඳහා, (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවල දී යම් තැනැත්තකු විසින් ලියා අත්සන් කරනු ලබන ලේඛනයක, එම ලේඛනය අදාළවන භාණ්ඩ සම්බන්ධයෙන් එම තැනැත්තා එකඟවන පහත දක්වෙන පොරොන්දු අන්තර්ගත විය යුතු ය :—

(අ) එම ලේඛනය ලියා අත්සන් කරනු ලබන්නේ යම් නියෝජිත ආයතනයක නමට ද එම නියෝජිත ආයතනය සඳහා භාණ්ඩ භාරයේ තබා ගැනීම සඳහා ද භාණ්ඩ හෝ ඒවා අන්තර්ගත පෙට්ටි හෝ ආවරණ යම් නිශ්චිත ආකාරයකට ලකුණු කිරීම සඳහා ද එම භාණ්ඩ ප්‍රවාහනය හා විකිණීම කරන තුරු ඒවා නිශ්චිත පරිශ්‍රයක තබා ගැනීම සඳහා ද වන පොරොන්දුවක් ;

(ආ) එම භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් හෝ එම මුදලින් යම් නිශ්චිත ප්‍රමාණයක් භාරයේ තබා ගැනීම සඳහා සහ එම මුදල් ලැබෙන ආකාරයට වරින්වර නියෝජිත ආයතනය වෙත ගෙවීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඇ) රක්ෂණය කළහැකි සියලුම අවදානම්වලට එරෙහිව භාණ්ඩ රක්ෂණය කළහැකි සම්පූර්ණ වටිනාකමට ම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වල ආකාරයට ම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක් ;

(ඈ) එම භාණ්ඩ හෝ එම භාණ්ඩවලින් යම් භාණ්ඩයක් මුදල් වලට හැර අන්‍යාකාරයකට නොවිකිණීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඉ) තත් කාලයේ දී ප්‍රවාහනය කරනු නොලැබ හෝ විකුණනු නොලැබ තිබිය හැකි යම් භාණ්ඩයක්, තත් කාර්ය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත නියෝජිත ආයතනය වෙත හෝ නියෝජිත ආයතනයේ නියමය පරිදි භාරදීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඊ) කලින් දැනුම් දීමක් නොමැතිව වරින්වර එම භාණ්ඩ තබා ඇති පරිශ්‍රයට ඇතුළු වී එම පරිශ්‍රය පරීක්ෂා කිරීමට ද එම පරිශ්‍රයේ තිබිය හැකි භාණ්ඩ ගණනය කිරීමට ද නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වූ පොරොන්දුවක් ;

(උ) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී සහ විකිණීමේ දී අයිතිය පිළිබඳ ලේඛන සහ එම භාණ්ඩවලට අදාළ වෙනත් ප්‍රවාහන ලේඛන භාර දෙන ලෙස නියෝජිත ආයතනය ඉල්ලා සිටියහොත් එසේ භාරදීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඌ) එම භාණ්ඩ, නියෝජිත ආයතනයේ නමට නිශ්චිත පරිශ්‍රයක හෝ ගුදමක ගබඩා කිරීම සඳහා වූ පොරොන්දුවක් ; සහ

(එ) දේශීය භාර ලදුපතට අදාළ ප්‍රවාහන ලේඛන, භාණ්ඩ සහ විකිණීමෙන් ලැබෙන මුදල්, එම දේශීය භාර ලදුපත ලියා අත්සන් කළ තැනැත්තාගේ වෙනත් යම් සහ සියලුම ප්‍රවාහන ලේඛන, භාණ්ඩ සහ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් බැහැරව වෙන් වශයෙන් තැබීම සඳහා වූ පොරොන්දුවක්.

(3) එම උපවගන්තියේ දැක්වෙන පොරොන්දුවලට අමතරව, යම් පොරොන්දුවක්, කොන්දේසියක් හෝ නියමයක් එම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබීම, (2) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් වළක්වනු ලබන බවට සලකනු නොලැබිය යුතු ය.

**3.** (1) 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු විසින් දේශීය භාර ලදුපතක් ලියා අත්සන් කරනු ලැබ, එම ලදුපත අදාළ වන භාණ්ඩවලට ලියා අත්සන් කරනු ලැබ, එම ලදුපත අදාළ වන භාණ්ඩවලට බලපාන විකුණුම් බිල් පත්‍රයක් ලෙස එය ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක දී එම භාර ලදුපතේ සඳහන් යම් මුදලක් එම ලදුපත යටතේ නියෝජිත ආයතනය වෙත ගෙවීමට ඇති හෝ නොගෙවා ඇති කාල සීමාව තුළ දී පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය. :—

(අ) යම් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමේ දී වෙනත් යම් තැනැත්තකු විසින් භාණ්ඩ තහනමට ගනු ලැබීමේ දී, තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු ලැබුවේ යම් නඩුවක් අතරතුර දී ද එම නඩුවේ දී එම අධිකරණය වෙත නියෝජිත ආයතනය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් නියෝජිත ආයතනය විසින් තෝරාගනු ලැබ අධිකරණය විසින් අනුමත කරනු ලැබූ වෙන්දේසිකරුවකු විසින් හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට සහ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි විධාන වලට යටත්ව, භාණ්ඩ විකිණිය යුතු බවට විධාන කරන ආඥාවක් ලබා ගැනීම සඳහා නියෝජිත ආයතනයට හිමිකම් තිබිය යුතුය. එම භාණ්ඩ විකිණීමේ දී විකිණීමෙන් ලැබුන මුදලින්, දේශීය භාර ලදුපත යටතේ අයවිය යුතු මුදල් තබා ගැනීමට නියෝජිත ආයතනයට හිමිකම් ඇති අතර, විකිණීමෙන් ලැබුන මුදලින් යම් මුදලක් ඉතිරිව ඇත්නම් එම මුදල අධිකරණයට ගෙවනු ලැබිය යුතු ය. තව ද එම මුදල, එම භාණ්ඩ තහනමට ගනු ලැබුවේ යම් තීන්දු ප්‍රකාශයක් යටතේ ද එම තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබුන මුදල ලෙස සැලකිය යුතු ය.

(ආ) දේශීය භාර ලදුපත ලියා අත්සන් කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා බුන්වත් භාවයට පත් වුවහොත්, දේශීය භාර ලදුපත අදාළ වන්නේ යම් භාණ්ඩ සඳහා ද එම භාණ්ඩ නියෝජිත ආයතනය වෙත භාර දිය යුතු බවට සහ ඒවා ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් නියෝජිත ආයතනය විසින් තෝරා ගනු ලැබ අධිකරණය විසින් අනුමත කරනු ලැබූ වෙන්දේසිකරුවකු විසින් හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට සහ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව විකුණනු ලැබිය යුතු බවට විධාන කරන ආඥාවක් එම බුන්වත් භාවය පිළිබඳ නඩු කටයුතු විභාග වෙමින් පවත්නා අධිකරණයෙන් ලබා ගැනීමට එම නියෝජිත ආයතනයට හිමිකම් තිබිය යුතු ය. එම භාණ්ඩ විකිණීමේ දී විකිණීමෙන් ලැබෙන මුදල් වලින් දේශීය භාර ලදුපත යටතේ නියෝජිත ආයතනයට අයවිය යුතු මුදල තබා ගැනීමට එම ආයතනයට හිමිකම් තිබිය යුතු අතර, විකිණීමෙන් ලැබුන මුදලින් ඉතිරි යම් මුදලක් ඇත්නම් එම මුදල, බුන්වත් පුද්ගලයාගේ බූදලයෙන් පැවරුම්කරුගේ බැරට අධිකරණය වෙත ගෙවනු ලැබිය යුතු ය ;

(ඇ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුවකට අනුකූලව නියෝජිත ආයතනය වෙත යම් භාණ්ඩ භාරදෙනු ලැබූ අවස්ථාවක දී, එම භාණ්ඩ ඉවත් කර ගැනීමෙන් පසුව හෝ දේශීය භාර ලදුපත

ලියා අත්සන් කළ තැනැත්තා එකඟ වන්නේ නම්, භාණ්ඩ තබා ඇති පරිශ්‍රයේදී ම හෝ එසේ භාර දෙනු ලැබූ භාණ්ඩ නියෝජිත ආයතනය විසින් විකුණනු ලැබිය හැකි ය. භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් දේශීය භාර ලදුපත යටතේ නියෝජිත ආයතනයට අයවිය යුතු මුදල තබා ගැනීමට එම ආයතනයට හිමිකම් තිබිය යුතු අතර යම් මුදලක් ඉතිරිව ඇත්නම් එම මුදල දේශීය භාර ලදුපත ලියා අත්සන් කළ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) දේශීය භාර ලදුපත ලියා අත්සන් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා යම් කඩකිරීමක් සිදු කරන්නේ නම් හෝ දේශීය භාර ලදුපත අන්තර්ගත පොරොන්දුවක් වන 2 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුවකට එකඟව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් හෝ ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ නියෝජිත ආයතනයට ගෙවීමට ඇති හෝ අය වීමට ඇති මුදල බවට දේශීය භාර ලදුපතේ සඳහන් වන මුදලට අඩු නොවන්නා වූ ද එම මුදලේ තුන් ගුණයට වැඩි නොවන්නා වූද මුදලක් දඩ මුදල් වශයෙන් ගෙවීමට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) දේශීය භාර ලදුපතක් යටතේ අයවිය යුතු මුදල, අනුමත ණය නියෝජිත ආයතනයට ගෙවීම හෝ එම ආයතනය විසින් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන සැලසීම, එම මුදල අයකර ගැනීමේ කාර්යය සඳහා හෝ එම මුදලින් යම් කොටසක් දැනටමත් ගෙවනු ලැබ ඇති හෝ අයකර ගනු ලැබ ඇති අවස්ථාවක දී අයවීමට ඇති ඉතිරි මුදල අයකර ගැනීමේ කාර්යය සඳහා නියෝජිත ආයතනයට යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්මයක් ලැබී ඇත්තේ යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක විධි විධාන යටතේ ද එම විධිවිධානවලට ආදේශ කිරීම හෝ එම විධිවිධාන හීන කිරීම සඳහා නොව එම විධිවිධානවලට අමතරව විය යුතු ය.

**4.** මේ පනත යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක දී,—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම හෝ ලේකම්වරයකුම ද ;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම කොටස්කරුවකුම ද ; සහ

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තකුම ද

එම වරදට වරදකරු වන ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුමක් නොමැතිව බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා සියළු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට හෝ එම මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එම ව්‍යාපාර ආයතනයේ කොටස් කරුවකු හෝ ඔප්පු කරන්නේ නම් එම තැනැත්තා එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

**5.** (1) මේ පනතෙහි " අනුමත ණය නියෝජිත ආයතනය " යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලයලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ;

(ඈ) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ;

(ඉ) 6 වන වගන්තිය යටතේ ආඥවක් කරනු ලැබ ඇත්තේ යම් සමාගමක් හෝ සමුපකාර සමිතියක් හෝ සම්බන්ධයෙන් ද, ඒ සමාගම හෝ සමුපකාර සමිතිය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ), සහ (ඈ) ඡේදවල සඳහන් යම් ආයතනයක් විසින් දේශීය භාර ලදුපත් ලියා අත්සන් කිරීමේ ප්‍රතිෂ්ඨාව වශයෙන් ණය දීමේ හෝ ණය පහසුකම් සැලසීමේ බලය, එම ආයතනය පිහිටුවීමේ සහ එම ආයතනය වෙත කාර්ය සහ කර්තව්‍ය පැවරීමේ පනත මගින් එම ආයතනය වෙත පවරනු ලැබ නැත්නම් මේ පනතේ ඇති කිසිවකින් එසේ, ණය දීමට හෝ ණය පහසුකම් සැලසීමට එම ආයතනය වෙත බලය පවරන ලෙස සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ බලය පවරන බවට තේරුම් නොගත යුතු ය.

**6.** වාණිජ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය ස්ථාවරත්වයක් සහ තත්ත්වයක් ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සඳහන් නොකරන ලද කිසියම් සමුපකාර සමිතියකට හෝ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යයි ප්‍රකාශ කිරීම, ජාතික ආර්ථිකයේ යහපත පිණිස, යෝග්‍ය වන්නේ යයි වාණිජ අධ්‍යක්ෂවරයා අදහස් කරන අවස්ථාවල, ඔහු විසින් එම විධිවිධාන එසේ අදාළ වියයුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත

[සහතිකය සටහන් කළේ 1990 මැයි මස 8 වන දින]

**ආර්ථිකයේ සියලු අංශයන්ට සහ විශේෂයෙන්ම, අවිධිමත් අංශයට ණය බෙදී යාම පහසු කරවීමේ අදහසින් යුතුව ණය දෙන ආයතන වලින් ණය ගැනුම්කරුවන්ට අදාළ වන ණය තොරතුරු එක්රැස් කිරීම පිණිස ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පිහිටුවීම සඳහා සහ කාර්යාංශයේ කොටස් හිමියන්ට ඒ තොරතුරු සැපයීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

**1.** මේ පනත, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## 1 වන කොටස

## ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පිහිටුවීම

2. (මෙහි මින් මතු ' කාර්යාංශය ' යනුවෙන් සඳහන් කරනු ලබන) '' ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය '' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ ද එහි කොටස් හිමියන් වන තැනැත්තන් ගෙන් සමන්විත වූ ද කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

3. කාර්යාංශය, 2 වන වගන්තියෙන් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු ය. තවද, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ද තිබිය යුතු අතර, ඒ නාමයෙන් කාර්යාංශය විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

4. කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය වෙතැයි සලකන කාර්යාංශයේ ශාඛා කාර්යාල සහ අනුයෝජිතයන් කොළඹ හැර ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානවල ඇති කරනු ලැබිය හැකි ය.

5. (1) කාර්යාංශයේ කටයුතු පිළිබඳ පරිපාලනය සහ කළමනාකරණය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු ' මණ්ඩලය ' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතු ය :—

(i) මණ්ඩලයේ සභාපති විය යුතු, මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් ;

(ii) මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(iii) ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන, ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(iv) මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන, මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(v) ලංකා බැංකුව සහ මහජන බැංකුව හැර කොටස් හිමි බලපත්‍රලත් වාණිජ බැංකු විසින් තෝරා පත්කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක් ;

(vi) කොටස් හිමි මූල්‍ය සමාගම් විසින් තෝරා පත්කරනු ලබන තැනැත්තෙක් ;

(vii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, ජාතික සංවර්ධන බැංකුවේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලවලින් නම් කරනු ලබන තැනැත්තෙක් ;

(viii) කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී ධුරය දරන තැනැත්තා.

(2) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන, කාර්යාංශයේ අධ්‍යක්ෂවරුන්ගේ ධුර කාලය, ඒ අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකය, රැස්වීම් සහ කාර්යාංශයේ මුද්‍රාව සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු ය.

(3) මේ පනතින් කාර්යාංශය වෙත පිරිනැමුණු හෝ නියම කෙරුණු හෝ පැවරුනු සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

6. ආර්ථිකයේ සියලු අංශයන්ට සහ විශේෂයෙන් ම අවිධිමත් අංශයට ණය බෙදී යාම පහසු කරවීමේ අදහසින් යුතු ව, ණය දෙන ආයතනවල ණය ගැනුම්කරුවන් සහ අනාගත ණය ගැනුම්කරුවන් පිළිබඳ වෙළෙඳ ණය සහ මූල්‍ය තොරතුරු රැස් කිරීම සහ සැසඳීම ද ඉල්ලීම් මත කාර්යාංශයේ ණය දෙන ආයතන වන කොටස් හිමියන් වෙත ණය තොරතුරු සැපයීම ද කාර්යාංශයේ කර්තව්‍යය විය යුතු ය.

7. කාර්යාංශය විසින් ස්වකීය කර්තව්‍යයන් ඉටුකිරීමේ දී, පහත දැක්වෙන බලතල සහ කාර්ය සියල්ලම හෝ ඒවායින් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය :—

(අ) ණය දෙන ආයතනවල ණය ගැනුම්කරුවන් හෝ අනාගත ණය ගැනුම්කරුවන් පිළිබඳ වෙළෙඳ, ණය සහ මූල්‍ය තොරතුරු රැස්කිරීම සහ සැසඳීම ;

(ආ) එසේ රැස්කළ තොරතුරු තැන්පත් කිරීම ;

(ඇ) ඉල්ලීම් මත සහ රහස්‍යතාවෙන් යුතුව ණය තොරතුරු සැපයීම සහ ඒ තොරතුරු සැපයිය යුතු ආකෘති ලබාදීම ;

(ඈ) ණය දෙන ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම් කරුවන් පිළිබඳ දත්ත බැංකුවක් පවත්වාගෙන යාම ;

(ඉ) ණය තොරතුරු සැපයීම සඳහා අවශ්‍යය යි කාර්යාංශය සලකන ගාස්තු අයකිරීම ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගැනීම හා දැරීම සහ ඒ දේපළ බදුදීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(උ) යම් වාණිජ බැංකුවක ජංගම සහ තැන්පත් ගිණුම් විවෘත කිරීම සහ සමාප්ත කිරීම ;

(ඌ) කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සාමාන්‍යාධිකාරිවරයකු පත්කිරීම ;

(එ) කාර්යාංශයේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ඒ) කාර්යාංශයේ සේවයෙහි නියුක්ත තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් පිහිටුවීම සහ ශුභ සාධන හා විනෝද පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් එවැනි පහසුකම් ලබාදීම ;

(ඔ) එසේ පත් කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය තීරණය කිරීම ;

(ඕ) කාර්යාංශයේ අරමුදලින් ඒ පාරිශ්‍රමික ගෙවීම ;

(ක) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ඇතුළුවීම සහ ඒවා ඉටුකිරීම ;

(ග) කාර්යාංශයේ වැඩ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ච) සාමාන්‍යයෙන් කාර්යාංශයේ වැඩ කටයුතු නිසි ලෙස කරගෙන යාම පහසු කරවීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේවල් කිරීම.

8. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ශ්‍රී ලංකාවේ කවර වූ හෝ ස්ථානයක කාර්යාංශයේ අනුයෝජිතයන් පත් කරනු ලැබිය හැකිය.

## II වන කොටස

## මුදල්

9. (1) කාර්යාංශයේ අනුමත කළ ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් සියය බැගින් වූ කොටස් දස ලක්ෂයකට බෙදූ රුපියල් දස කෝටියක් විය යුතු ය.

(2) කාර්යාංශයේ නිකුත් කළ ප්‍රාග්ධනය මණ්ඩලය විසින්, කලින් කල තීරණය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

10. (1) මුදල් මණ්ඩලය හෝ ණයදෙන ආයතනයක් හෝ නොවන කිසිම තැනැත්තකු කාර්යාංශයේ කොටස් මිලදී ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) කාර්යාංශයේ ආරම්භක කොටස් නිකුත් කිරීම සඳහා ඉල්ලීම් කැඳවීම සහ භාර ගැනීම මුදල් මණ්ඩලය විසින් කළ යුතු අතර, ඒ ඉල්ලීම් ලැබුණුවිට, පහත දැක්වෙන අනුපාත අනුව, මුදල් මණ්ඩලය විසින්, මුදල් මණ්ඩලයට සහ ණය දෙන ආයතනවලට කොටස් වෙන්කර දෙනු ලැබිය යුතු ය :—

| | |
|---|---|
| මුදල් මණ්ඩලය — | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පනස් එකක් ; |
| බලපත්‍රලාභී වාණිජ බැංකු — | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට තිහක් ; සහ |
| වෙනත් ණය දෙන ආයතන— | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට දහනවයක්. |

(3) ආරම්භක කොටස් නිකුත් කිරීමෙන් පසුව, කාර්යාංශයේ කිසිදු කොටස් වෙන්කර දීමක් හෝ පැවරීමක් මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව මිස නොකළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කොටස් වෙන්කර දීමක් හෝ පැවරීමක් සඳහා අනුමතය දීමේ දී කාර්යාංශයේ කොටස් හිමිකම සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් අනුපාත පවත්වා ගෙන යන බව සහතික කිරීමට මුදල් මණ්ඩලය වෑයම් කළ යුතු ය.

11. යම් කොටස් හිමියකුගේ වගකීම ඔහුගේ කොටස් මත නොගෙවූ මුදලක් වේනොත් ඒ මුදලට සීමා විය යුතු ය.

12. (1) කාර්යාංශය විසින් මාස හයකට නොවැඩි කාලසීමා සඳහා මහ බැංකුවෙන් කලින් කල මුදල් ප්‍රමාණ ණයට ගැනීම, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඒ පිළිබඳ පොලිය සහ ආපසු ගෙවීම් පිළිබඳ නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කාර්යාංශය විසින් ලබා ගන්නා ණය මුදල්වල එකතුව, කාර්යාංශයෙන් ගෙවා නිමි ප්‍රාග්ධනයට සමාන මුදලකට වඩා කිසිම විටෙක දී වැඩි නොවිය යුතු ය.

13. ආර්ථිකයේ අවිධිමත් අංශය හා සම්බන්ධ කරුණු පිළිබඳව කටයුතු කිරීමේ කොට්ඨාසයක් ද ඇතුළුව කාර්යාංශයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි කොට්ඨාස මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

14. (1) (මෙහි මින් මතු " අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යාංශයේ ම අරමුදලක් කාර්යාංශයට තිබිය යුතු ය.

(2) අරමුදලට—

(අ) කාර්යාංශයේ ප්‍රාග්ධනයට දායක මුදල් වශයෙන් කාර්යාංශය විසින් ලබන සියලු මුදල්,

(ආ) කාර්යාංශය විසින් කරනු ලබන ආයෝජන මත ලාභ වශයෙන් කාර්යාංශය ලබන සියලු මුදල්,

(ඇ) කාර්යාංශය විසින් සලසනු ලබන සේවාවන් සඳහා කාර්යාංශය ලබන සියලු මුදල් , සහ

(ඈ) කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කාර්යාංශය ලබන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කාර්යාංශයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේදී කාර්යාංශය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

15. කාර්යාංශයට අයත් කවර වූ හෝ මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

16. (1) කාර්ය මණ්ඩල ශුභ සාධනය සඳහා වන පොදු සංචිත අරමුදලක් මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය යුතු අතර ඊට කාර්යාංශයේ ශුද්ධ ලාභවලින් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණ පවරනු ලැබිය හැකි ය.

(2) කාර්ය මණ්ඩල ශුභ සාධනය සඳහා වූ සංචිත අරමුදල, කාර්යාංශයේ නිලධරයන්ට සහ සේවකයන්ට පුහුණු කිරීම්, නිවාස සහ ශුභ සාධන පහසුකම් සැපයීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට යොදනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය තීරණය කරන වෙනත් කාර්ය සඳහා මණ්ඩලය විසින් සංචිත අරමුදල් පිහිටුවනු ලැබිය යුතු ය.

17. කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

18. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මාස දොළහක් නොඉක්මවන කාල පරිච්ඡේදය අනුව විගණකාධිපතිවරයා විසින් කාර්යාංශයේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

(2) කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් පත් කරනු ලැබිය යුතු අතර, කාර්යාංශයට අදළ විගණකාධිපතිවරයාගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒ විගණකවරයාගේ හෝ විගණකවරුන්ගේ සේවාවන් උපයෝගි කර ගැනීමට තමා අදහස් කරන බව ඔහුට හෝ ඔවුන්ට දන්වනු ලැබිය යුතු ය. ඉන් පසුව ඒ විගණකවරයා හෝ විගණකවරුන් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත්කරනු ලබන සෑම සුදුසුකම් ලත් විගණකවරයකු විසින් ම විගණකාධිපතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) විගණකවරයා විසින් කාර්යාංශයේ ගිණුම් පිරික්සිය යුතු අතර, ශේෂ පත්‍රවල නිවැරදි බව නිසැකව දැන, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පහත දැක්වෙන පරිදි වාර්තා කරනු ලැබිය යුතු ය :—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් තමා ලබා ගත්තේ ද නැද්ද යන බව, සහ

(ආ) කාර්යාංශයේ පොත්වලින් පෙන්වා ඇති පරිදි සහ තමාට ලැබුණු උපරිම තොරතුරු සහ කරන ලද පැහැදිලි කිරීම් අනුව කාර්යාංශයේ වැඩ කටයුතු පිළිබඳ සත්‍ය හා නිවැරදි දර්ශනයක් පෙන්නුම් කෙරෙන අයුරින් වාර්තාවේ සඳහන් ශේෂ පත්‍රය තමාගේ මතය අනුව නිසි ලෙස පිළියෙල කර තිබේද යන බව.

(5) ශේෂ පත්‍රයේ නිවැරදි බව නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා කාර්යාංශයේ යම් ශාඛාවක් සම්බන්ධයෙන්, කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය වෙත යවන ලද්ද වූ ද නිවැරදි බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙන ලද නිලධරයා විසින් නිවැරදි බවට සහතික කරන ලද්ද වූ ද ඒ ශාඛාවේ ගිණුම් පොත්වලින් ගන්නා ලද යම් පිටපත් හෝ උධෘත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතය ඇතිව විගණකාධිපතිවරයා විසින් පිළිගනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියෙහි " සුදුසුකම්ලත් විගණකවරයා " යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු ව ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන තැනැත්තකු, නැතහොත්

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු ව ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් සෑම නේවාසික හවුල්කරුවකු විසින් දරනු ලබන ගණකාධිකාරි ව්‍යාපාරික ආයතනයක් අදහස් වේ.

**19.** (1) යම් වර්ෂයක් වෙනුවෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ වර්ෂයට අදළ පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක් අමාත්‍යවරයා සහ සියලුම කොටස් හිමියන් වෙත යැවීමට සලස්වනු ලැබිය යුතු ය :—

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව.

(ආ) ශේෂ පත්‍රය.

(ඇ) ලාභා'ලාභ ගිණුම, සහ

(ඈ) කාර්යාංශයේ වැඩ පිළිබඳ විස්තරයක් දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත එවන ලද ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය.

## III වන කොටස

### පොදු විධිවිධාන

**20.** (1) මේ පනත යටතේ වූ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් මණ්ඩලය විසින්, කාර්යාංශයේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරන ලද යම් නිලධරයකු විසින්, ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය මණ්ඩලය විසින් ඔහුට දෙනු ලබන විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් පැවරීමක් කරනු ලැබ ඇත ද එසේ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කළ හැකි ය.

**21.** (1) කාර්යාංශය විසින් හෝ කාර්යාංශය විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු කාලපරිච්ඡේදය ඇතුළත ඒ ණය දෙන ආයතනයෙන් ණය ගත් ණය ගැනුම්කරුවන්ට අදාළ ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු සියලු වාර්තා සහ තොරතුරු කාර්යාංශය වෙත හෝ කාර්යාංශය විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු වෙත සැපයිය යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් ණය දෙන ආයතනයක් පිහිටුවන යම් නීතියක හෝ වෙනත් නීතියක හෝ ඒ ණය දෙන ආයතනය සහ ණය ගැනුම්කරු අතර ඇතිකර ගත් යම් ගිවිසුමක හෝ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත ඒ දැන්වීමේ නියමවලට අනුකූලව ක්‍රියා කිරීම, ඒ දැන්වීම මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට නියම කරනු ලබන ණය දෙන ආයතනයක කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම වලට අනුකූලව (1) වන උපවගන්තිය යටතේ සපයන ලද වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක් පළ කිරීම හෝ කාර්යාංශයේ කොටස් හිමියකු වන ණයදෙන ආයතනයක ඉල්ලීම මත ඒ කොටස් හිමියාට නැතහොත් කාර්යාංශයේ කර්තව්‍ය ඉටුකිරීමේ දී හැර වෙනත් යම් තැනැත්තකුට දැනුම්දීම හෝ කාර්යාංශය විසින් නොකළ යුතු ය.

**22.** (1) මේ පනතේ කාර්ය සඳහා හෝ යම් නීතියක් මගින් නියම කරනු ලැබූ විට දී හැර, කාර්යාංශයේ කිසිම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවකයකු හෝ විසින්, මේ පනත යටතේ කාර්යාංශය වෙත සපයන ලද යම් තොරතුරක් හෙළි කිරීම හෝ මේ පනත යටතේ කාර්යාංශය වෙත සපයන ලද යම් වාර්තාවක් හෝ වෙනත් තොරතුරක්, යම් අධිකරණයක් හෝ වෙනත් ආයතනයක් ඉදිරියේ තැබීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා හෝ යම් නීතියක් මගින් නියම කරනු ලැබූ විටදී හැර, කාර්යාංශයේ කොටස් හිමියකු වන යම් ණය දෙන ආයතනයක ව්‍යාපාරයේ සේවයේ නියුක්ත කිසිම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු, මේ පනත යටතේ කාර්යාංශය වෙත සපයන ලද යම් තොරතුරක් හෙළි කිරීම හෝ මේ පනත යටතේ කාර්යාංශය වෙත සපයන ලද යම් වාර්තාවක් හෝ වෙනත් යම් තොරතුරක් යම් අධිකරණයක් හෝ වෙනත් ආයතනයක් ඉදිරියේ තැබීම නොකළ යුතු ය.

**23.** (1) කාර්යාංශයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ කාර්යාංශයේ සියලු නිලධරයන් සහ සේවකයන් විසින් ම, තම කාර්ය භාර ගැනීමට පෙර, කාර්යාංශයේ වැඩ කටයුතු පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාවක් පිළිපදින බවට පොරොන්දුවීමේ ප්‍රකාශනයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශනයෙන්, තම කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන කරුණු කිසිවක් පහත සඳහන් අවස්ථාවලදී හැර හෙළි නොකිරීමට පොරොන්දු විය යුතු ය :—

(අ) අධිකරණයක් විසින් හෝ ඒ කරුණු අදාළ වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් නියම කරනු ලැබූවිට, සහ

(ආ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයකට අනුකූලතාව දැක්වීම සඳහා.

(2) කාර්යාංශයේ කොටස් හිමියකු වන යම් ණය දෙන ආයතනයක ව්‍යාපාරයේ සේවයේ නියුක්ත සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින්ම, එම ණය දෙන ආයතනය විසින් කාර්යාංශයෙන් ලබාගත් ණය හෝ මූල්‍ය තොරතුරු සහ ඊට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාවක් පිළිපදින බවට පොරොන්දුවීමේ ප්‍රකාශනයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශනයෙන් එවැනි යම් තොරතුරක් හෝ කාරණයක් පහත දැක්වෙන අවස්ථාවලදී හැර හෙළි නොකිරීමට පොරොන්දු විය යුතු ය :—

(අ) (i) අධිකරණයන් විසින්,

(ii) ඒ තොරතුරු අදාළ වන තැනැත්තා විසින්

නියම කරනු ලැබූ විට,

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක යම් විධිවිධානවලට අනුකූලතාව දැක්වීම සඳහා.

**24.** (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කළැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කාර්යාංශයට විරුද්ධව, හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කාර්යාංශයේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ විසින් සද්භාවයෙන් කරන ලද හෝ කළැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව හෝ

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශයට ගෙවන ලද හෝ කාර්යාංශය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කළැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අයකරගනු ලබතොත් හැර, අරමුදලින් ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබිය යුතු ය.

**25.** කාර්යාංශයට විරුද්ධ ව ඉදිරිපත් කරනු ලබන කවර වූ හෝ නඩුවක දී පෞද්ගලික ව මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකුට හෝ ඔහුගේ දේපළවලට හෝ විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

**26.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියමිත සියලුම කරුණු හෝ ඒවායින් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

**27.** (1) (අ) 21 වන වගන්තිය යටතේ, තමා වෙත එවන ලද දැන්වීමක නියමවලට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක දැන දැන ම අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන,

(ආ) 21 වන වගන්තිය යටතේ තමා වෙත එවන ලද යම් දැන්වීමක නියමවලට අනුකූල ව ක්‍රියා කිරීම, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන,

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නීතියක් කඩකරන,

(ඈ) කාර්යාංශයේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු වශයෙන්, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම හෝ ස්වකීය කාර්ය කිරීම මගින් හෝ ඒ සම්බන්ධයෙන් තමා ලබා ගත් යම් තොරතුරක්, ඒ තොරතුර හෙළි කිරීමට තමාට මේ පනතින් බලය දෙන ලද කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළිකරන,

(ඉ) කාර්යාංශයේ කොටස් හිමියකු වන යම් ණය දෙන ආයතනයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු වශයෙන් එම ණය දෙන ආයතනය විසින් කාර්යාංශයෙන් ලබාගත් යම් ණය හෝ මූල්‍ය තොරතුරක් ඒ තොරතුර හෙළි කිරීමට තමාට මේ පනතින් බලය දෙන ලද කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළි කරන

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය ;

එසේ වුව ද, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු ඒ වරද කරන ලද්දේ තමාගේ දැනීමක් නොමැතිව බව හෝ ඒ වරද කිරීම වලක්වාලීමට තමා සියලු උද්යෝගය යෙදවූ බව හෝ ඔප්පු කරතහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

(4) 27 (1) (අ) හෝ (ආ) යටතේ කරන ලද වරදෙහි අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, රුපියල් පනස් දහසකට නො වැඩි මුදලක් සඳහා මණ්ඩලය විසින් ඒ වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමේ දී මණ්ඩලය විසින් ලබාගන්නා සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ලංකා බැංකුව" යන්නෙන්, (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත මගින් පිහිටුවන ලද ලංකා බැංකුව අදහස් වේ,

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ,

"ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව" යන්නෙන්, (165 වන අධිකාරය වූ) සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද සංවර්ධන මූල්‍ය සංස්ථාව අදහස් වේ.

"මුදල් සමාගම" යන්නෙන්, මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ,

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ,

"ණය දෙන ආයතන" යන්නෙන්—

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්,

(ආ) මුදල් සමාගමක්,

(ඇ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව,

DISCARDED

(ඈ) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව,

(ඉ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව,

(ඊ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව,

අදහස් වේ,

" මුදල් මණ්ඩලය " යන්නෙන්, මුදල් නීති පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ.

" ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව " යන්නෙන්, 1979 අංක 2 දරන ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුව අදහස් වේ,

" ජාතික ඉතිරිකිරීමේ බැංකුව " යන්නෙන්, 1971 අංක 3 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුව අදහස් වේ,

" මහජන බැංකුව " යන්නෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් පිහිටුවන ලද මහජන බැංකුව අදහස් වේ.

" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව " යන්නෙන්, 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අදහස් වේ.

## උපලේඛනය

(5 වන වගන්තිය)

### අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ විධිවිධාන

**1.** සභාපති හැර, සෑම අධ්‍යක්ෂවරයකු සහ (5) (1) (VIII) වගන්තියේ සඳහන් අධ්‍යක්ෂවරයකු ම, මරණය ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් වුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, නැවත නම් කරනු ලැබීමට හෝ නැවත තෝරාපත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුවද, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය හිස් කළ අධ්‍යක්ෂවරයකු වෙනුවට නම් කරනු ලැබූ හෝ තෝරාපත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු තමා අනුප්‍රාප්තවන අධ්‍යක්ෂවරයාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

**2.** රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් කාලපරිච්ඡේදයක් තුළ සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකි වේ නම්, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය ; නැතහොත් තෝරාපත් කරනු ලැබිය හැකි ය.

**3.** අධ්‍යක්ෂවරයකු නම් කරන හෝ තෝරාපත් කරන තැනැත්තා හෝ තැනැත්තන් විසින් කිසිදු හේතුවක් නොදක්වා ඒ අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

**4.** (සභාපති සහ 5(1) (VIII) වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරයා නොවන) අධ්‍යක්ෂවරයකු සභාපති වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම සභාපති විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

**5.** මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, පාරිශ්‍රමික හා වෙනත් ගෙවීම් අධ්‍යක්ෂවරුන්ට අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**6.** (1) මණ්ඩලයේ සභාපතිවරයා, පැමිණ සිටී නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක දී, පැමිණ සිටින අධ්‍යක්ෂවරුන් තමන් අතුරින් සභාපතිවරයකු තෝරාපත් කර ගත යුතු ය.

(2) මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වරක් සහ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වාර ගණනක් රැස්විය යුතු ය.

(3) යම් රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් සිව් දෙනකු විය යුතු අතර, ගණපූරණය පිළිබඳ නියමයට සහ මේ උපලේඛනයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳ වූ කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් රීති මගින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න පැමිණ සිටින අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක් ඇති වූ විටක දී මුලසුන දරන අධ්‍යක්ෂවරයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

7. මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුතු කිසිවක් අධ්‍යක්ෂවරුන් අතරේ පුරප්පාඩුවක් තිබීම හෝ යම් අධ්‍යක්ෂවරයකු පත් කිරීමේදී වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල නොවිය යුතු ය.

8. (1) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ, සැලසුම් කළයුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව සභාපතිගේ භාරයේ තිබිය යුතු ය.

(3) යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කාර්යාංශයේ මුද්‍රාව තැබීම මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමන් පැමිණි බවට සලකුනක් වශයෙන් සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් කළ යුතු සභාපති සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, නොකළ යුතු ය.

(4) කාර්යාංශයේ මුද්‍රාව තැබූ සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්තරයක් කාර්යාංශය විසින් පවත්වාගෙන යා යුතු ය.

9. (අ) මුදල් මණ්ඩලය වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපති වරයාට ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම මුදල් මණ්ඩලය මගින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(ආ) මුදල් මණ්ඩලය විසින්, සභාපතිවරයා කවර විටකදී වුවද ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

10. කාර්යාංශය විසින් ඇති කරනු ලැබීමට යෝජිත යම් ගිවිසුමක් විෂයෙහි කෙළින්ම හෝ වක්‍ර ලෙස සම්බන්ධතාවක් ඇති යම් අධ්‍යක්ෂවරයකු විසින්, ඒ සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳව මණ්ඩලයේ රැස්වීමකදී හෙළි කළ යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා, ඒ ගිවිසුම පිළිබඳ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය. තවද, ඒ සාකච්ඡාව කරගෙන යන අතරතුර දී හෝ ඒ ගිවිසුම ඇති කෙරෙද්දී ඔහු ඒ රැස්වීමෙන් ඉවත් විය යුතු ය.

## 1990 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 12 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1990 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ‘‘ ප්‍රධාන ප්‍රඥප්තිය ’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (LIV) වන අනුඡේදයේ ‘‘ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම සහ ’’ යන වචන වෙනුවට ‘‘ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම ;’’ යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (LV) වන අනුඡේදයේ (III) වන විෂයයෙහි ‘‘ භාර අරමුදලේ ලාභ සහ ආදායම්. ’’ යන වචන වෙනුවට ‘‘ භාර අරමුදලේ ලාභ සහ ආදායම ; සහ ’’ යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(3) ඒ ඡේදයේ අන්තිමට පහත දක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

" (LVI) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනතින් පිහිටුවන ලද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XVI) වන අනුඡේදයේ " යම් දේපළක් අත්කර ගැනීමෙන් පසුව අවුරුදු විසි පහකට නොඅඩු කාලයකට පසුව " යන වචන වෙනුවට " යම් දේපළක් අත්කර ගැනීමේ දිනයෙන් අවුරුදු විසිපහකට නොඅඩු කාලයකට පසුව " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇඇඇඇ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී, ඒ සංගමය විසින් ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් හෝ ක්‍රීඩා පනතේ අර්ථානුකූල යම් ක්‍රීඩාවකට සහභාගි වන අතරතුර ඒ තක්සේරු වර්ෂයේ දී, විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම (ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද යුක්තිසහගත වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදලක් අඩු කිරීමෙන් පසු) ඒ සංගමය විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබුවහොත්, ඒ ලාභ සහ ආදායම ;" ;

(2) ඒ වගන්තියේ (ත) ඡේදයේ " අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක්," යන වචන වෙනුවට " අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ද) ඡේදයේ " අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් " යන වචන වෙනුවට " අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(4) ඒ වගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

" (න) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශීය සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය ලබා දෙනු ලැබූ හෝ සලසා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ගෙවන ලද මුදලක රුපියල් දෙදහසක් නොඉක්මවන කොටස." .

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (1) වන උපවගන්තියේ " 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1990 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1991 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඈඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22ඈඈඇ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

22ඈඈඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක් ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම් නොවන) 3 (අ) වගන්තියේ අර්ථානුකූල ලාභ සහ ආදායම්, ඒ සමාගම ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු දහයක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ කාර්යය සඳහා අනුමත කරනු ලැබුවා වූ ද බඩු නිෂ්පාදනය කිරීමෙහි හෝ අපනයනය කිරීමෙහි නිරත වන ව්‍යවසායවලට පමණක් අවදානම් ආයෝජන ප්‍රාග්ධනය සැලැස්වීමේ ව්‍යවසායක් පවත්වාගෙන යාමෙහි නිරත වන්නා වූ ද සමාගමකට (1) වන උප වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය ".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ " 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබ," යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් අත්කර ගනුලැබ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ—

(අ) ඒ ඡේදයේ (III) වන අනුඡේදයේ—

(i) "1987 අප්‍රේල් මස 1 වන දින හෝ " සිට " යම් තැනැත්තකු " දක්වා ඇති සියලු ඉලක්කම් සහ වචන වෙනුවට " එම තැනැත්තා විසින් ඉදිකරනු ලැබුවා වූ ද 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබුවා වූ ද යම් සුදුසුකම් ලත් ගොඩනැගිල්ලක් එම තැනැත්තා " යන වචන සහ ඉලක්කම් සහ;

(ii) "අනුප්‍රමාණ අනුව දීමනාවක් " යන වචන වෙනුවට " අනුප්‍රමාණ අනුව දීමනාවක් ;" යන වචන

ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iv) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එම තැනැත්තා විසින් අත්කර ගන්නා ලද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නා වූ නිර්නේවාසික ඉඩ පහසුකම් ඒකකයක් සම්බන්ධයෙන් ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක එය ප්‍රයෝජනයට ගැනීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය අත්කර ගැනීමේ වටිනාකම මත වර්ෂයකට සියයට දහයක අනුප්‍රමාණය අනුව දීමනාවක් ;" සහ

(ඇ) ඒ ඡේදයේ අතුරු විධානයේ "(iii) වන අනුඡේදයෙහි හෝ " යන වචන සහ ඉලක්කම් වෙනුවට "(iii) වන අනුඡේදයෙහි හෝ (iv) වන අනුඡේදයෙහි " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; තව ද

(3) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන වැඩිදුරටත් වූ අතුරු විධානය එකතු කිරීමෙන් :—

" එසේ ම තවදුරටත් බොල් ණය හෝ අඩමාන ණය සම්බන්ධයෙන් (ඌඌ) ඡේදයෙහි සඳහන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ ජාතික සංවර්ධන බැංකුව විසින් මේ ඡේදය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් මුදලක්, අවස්ථාවෝචිත පරිදි (ඌඌ) ඡේදයෙහි සඳහන් ඒ සංස්ථාවේ හෝ ඒ බැංකුවේ ඒ ඒ පොදු සංචිත වලින් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයකට අඩු කරනු ලැබිය යුතු ය. තව ද ඒ පොදු සංචිතයෙහි මුදල ඉක්මවන යම් අතිරික්තයක් වෙතොත් ඒ අතිරික්තය මේ ඡේදය යටතේ අඩු කරනු ලැබිය යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ජජ) ඡේදය (ට) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ නැවත අක්ෂර යොදන ලද (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඩ) 32 (2) වන වගන්තියේ සඳහන් යම් මුදලක් ගෙවීම සඳහා යම් සංචිතයකට හෝ ප්‍රතිපාදනයකට පවරන ලද (23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඩ) ඡේදයෙහි සඳහන් යම් වාර්ෂික ගෙවීමක් නොවන) යම් මුදලක් ;".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "(අ) ඡේදයෙහි සඳහන් " යන වචන වෙනුවට "(අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි හෝ සඳහන් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ (viii) වන පරිච්ඡේදයේ " බදු අනුප්‍රමාණ " යන වචන වෙනුවට " බදු අනුප්‍රමාණ සහ බදු බැර " යන වචන ආදේශ කිරීමෙන් ඒ පරිච්ඡේදයේ ශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය, (vi) වන ඡේදය සහ (v) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; හෝ

(iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; හෝ

(v) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1988 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඇ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; හෝ

(vi) 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඈ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; " තවද

(2) ඒ වගන්තියේ (3ඇ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3ඇ) යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමෙහි, ඒ තැනැත්තා විසින් වෙනත් යම් තැනැත්තකු වෙතින් ත්‍යාග කිරීමෙන් හෝ උරුමවීමෙන් අත්කර ගන්නා ලද යම් නිශ්චල දේපළක අයිතිය සම්බන්ධයෙන් වූ වෙනස්වීමකින් උද්ගත වන ප්‍රාග්ධන ලාභ කිසිවක් ඇතුළත් වන අවස්ථාවක, මේ වගන්තියේ (3අ) උපවගන්තියේ සහ (3ආ) උපවගන්තියේ හෝ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (xvi) වන අනුඡේදයේ කාර්ය සඳහා, පළමුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමේ දිනය දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය. ".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 32ඉ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

32ඉ. 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධානයන් අදාළ වන පුද්ගලයකු නො වන යම් පුද්ගලයකුගේ, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කළ හැකි ආදායමේ, යම් සේවානියුක්තියකින් ලබන්නා වූ ලාභ (එම ලාභයේ 32(2) වන වගන්තියේ සඳහන් යම් මුදලකින් සමන්විත වන්නා වූ යම් කොටසක් වේ ද එම කොටස හැර) අඩංගු වන අවස්ථාවක, එම පුද්ගලයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වන ආදායම් බද්දෙන්, රුපියල් නව සියයක මුදලක් හෝ, සේවානියුක්තියෙන් ලබන එම ලාභවලට ආරෝපනය කරනු ලැබිය හැකි වන ආදායම් බදු මුදල, යන මේ දෙකින් කවර වූ හෝ අඩු මුදල, අඩු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ සේවා නියුක්තියෙන් ලබන එම ලාභවලට ආරෝපනය කරනු ලැබිය හැකි වන ආදායම් බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ සේවා නියුක්තියෙන් ලබන ලාභයට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම, දරන අනුපාතයම වන අනුපාතයක්, යම් මුදල් ප්‍රමාණයකට ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු වන ආදායම් බදු මුදල දරන්නේ ද එම මුදල් ප්‍රමාණය විය යුතු ය.''.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයේ (i) වන අනු ඡේදයේ '' සියයට තිස් තුනයි තුනෙන් එකකට ; සහ '' යන වචන වෙනුවට '' සියයට තිස්තුනයි තුනෙන් එකකට ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) අනුඡේදයෙහි '' 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(iii) ඒ තක්සේරු වර්ෂය 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම්, සියයට පහළොවකට ;'';

(ඈ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ඇ) (මෙහි මින් මතු '' අදාළ තක්සේරු වර්ෂය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ණයක් නොවන ආකාරයකින් ආණ්ඩුව විසින් ප්‍රාග්ධනයෙන් සියයට හැත්තෑ පහකට නො අඩු ප්‍රමාණයක් සලස්වනු ලබන යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ලාභවලින් (අ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද අඩු කිරීමෙන් පසුව ඒ තක්සේරු වර්ෂය සඳහා වූ එහි ලාභවල ශේෂයෙන් සියයට විසිපහකට සමාන මුදලක් විය යුතු ය :

එසේ වුවද 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සංස්ථාවේ බදු අය කළ හැකි ආදායම් ආගණනය කිරීමට පදනම් කරගත් ලාභවලින් අදළ තක්සේරු වර්ෂයේ දී බෙදහරිනු ලැබූ යම් දළ ලාභාංශවල එකතු ප්‍රමාණය—

(i) ඒ ශේෂයෙන් සියයට විසිපහකට වඩා අඩු නොවන අවස්ථාවක, මේ ඡේදයේ විධිවිධාන අදළ නොවිය යුතු ය ; තවද

(ii) ඒ ශේෂයෙන් සියයට විසිපහකට අඩුවන අවස්ථාවක, අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ රාජ්‍ය සංස්ථාව මේ ඡේදය යටතේ යටත් වන බද්ද, ඒ ශේෂයෙන් සියයට විසිපහක, එම ලාභාංශවල එම ප්‍රමාණය ඉක්මවන අතිරික්තයට සමාන මුදලක් විය යුතුය.

මේ ඡේදයේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ලාභවලට ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් වූ එහි ලාභ ඇතුළත් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.'' සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ '' නිල ලැයිස්තු ගත පොදු සමාගම '' යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ '' සුදුසුකම් ලබන බෙදහැරීමකින් සමන්විත වන්නේ ඒ ලාභාංශයේ යම් කොටසක් ද ඒ කොටසට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් බද්දේ එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට '' ඒ ලාභාංශයට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් සමාගම් බද්දෙත් එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් වශයෙන් සැලකිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ '' එම ලාභාංශයෙහි යම් කොටසක් සුදුසුකම් ලබන බෙද හැරීමකින් සමන්විත වන්නේ නම්, එම කොටස මත, ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්දට සමාන මුදලක් '' යන වචන වෙනුවට '' එම ලාභාංශයට ආරෝපණය කරනු ලැබිය හැකි අත්තිකාරම් සමාගම් බද්දට සමාන මුදලක් '' යන වචන ආදේශ කිරීමෙන් ;

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ '' 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් සහ 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම් තිබිය යුතු ය ;'' යන ඉලක්කම් සහ වචන වෙනුවට—

''(අ) 1980 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට ;

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට ; සහ

(ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට පහළොවකට

සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම් තිබිය යුතු ය : '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ඊ) (ඇ) ඡේදයේ (ii) වන හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන් ලාභාංශයකින් ගෙවනු ලබන ඒ ලාභාංශයේ කොටසක් සම්බන්ධයෙන් වෙනත් වාසික සමාගම් විසින් ගෙවන ලද අත්තිකාරම් සමාගම් බද්ද,''; තවද

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ '' ඔහුට ලැබිය යුතු ය ; තවද '' යන වචන වෙනුවට '' ඔහුට ලැබිය යුතු ය ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රමාණය සියයට විසිපහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට විසිපහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම් ඔහුට ලැබිය යුතු ය ; තවද '' සහ

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රමාණය සියයට දහතෙන් තුනකින් වැඩි කළ යුතු අතර එකී සියයට දහතෙන් තුනට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය ;''.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ '' 8 වන වගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 8 වන වගන්තියේ (ඇ) ඡේදයේ සහ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට පෙරාතුව ම දැක්වෙන ශීර්ෂයේ '' සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු හා සම්බන්ධ සමාගම්වල '' යන වචන වෙනුවට '' සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු හා සම්බන්ධ තැනැත්තන් '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ හැර අන් සෑම තැනකම

" සමාගමක " යන වචනය වෙනුවට " තැනැත්තකුගේ " යන වචනය ද " සමාගම විසින් " යන වචන වෙනුවට " තැනැත්තා විසින් " යන වචන ද ; "සමාගමට" යන වචන වෙනුවට " තැනැත්තාට " යන වචන ද, ආදේශ කිරීමෙන් ;

(2) එහි (ආ) ඡේදයේ—

(අ) (i) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ මුළු ලාභ සහ ආදයම එම සමාගමේ අපනයන ලාභ සහ ආදයමට දරන අනුපාතයම වන අනුපාතයක්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ගෙවිය යුතු වන ආදයම් බද්දට යම් මුදලක් දරන්නේ ද එම මුදල ;

(ආ) එහි (ii) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

(ii) නිර්වාසික වන සමාගමක් සම්බන්ධයෙන් වන විට, එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ මුළු ලාභ සහ ආදයම එම සමාගමේ අපනයන ලාභ සහ ආදයමට දරන අනුපාතයම වන අනුපාතයක්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් සහනයක් අඩු කිරීමෙන් පසු 34 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ ගෙවිය යුතු වන ආදයම් බද්දට යම් මුදලක් දරන්නේ ද, එම මුදල ; සහ

(ඇ) එහි (ii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

(iii) සමාගමක් නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ මුළු ලාභ සහ ආදයම එම තැනැත්තාගේ අපනයන ලාභ සහ ආදයමට දරන අනුපාතයම වන අනුපාතයක්, එම තැනැත්තා ම තක්සේරු වර්ෂය සඳහා 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් සහනයක් අඩු කිරීමෙන් පසු ගෙවිය යුතු වන ආදයම් බද්ද, යම් මුදලකට දරන්නේ ද එම මුදල

ඉන් අදහස් වේ.".

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි " අපනයන කටයුතුවල නිරත සමාගම්වල " යන වචන වෙනුවට " අපනයන කටයුතුවල නිරත තැනැත්තන්ගේ " යන වචන ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2ආ) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ (2අ) උපවගන්තියේ සඳහන් යම් විස්තරයක්, යම් ප්‍රභවයකින් ව්‍යුත්පන්න වූ ආදායමේ මුදලට අදාළ වෙතොත්—

(අ) ඒ ආදායම් ප්‍රභවයට අදාළව නිතිපතා ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ නම්, ඒ ගිණුම් අනුව ආගණනය කරනු ලැබූ මුදල විය යුතු ය, තවද

(ආ) ඒ ආදායම් ප්‍රභවයට අදාළව නිතිපතා ගිණුම් පවත්වා ගෙන යනු නොලබන්නේ නම්, වාර්තාව සපයන තැනැත්තා විසින් ඒ ප්‍රභවයෙන් ව්‍යුත්පන්න වූ ආදායමේ මුදල ලෙස සද්භාවයෙන් විශ්වාස කරන මුදල විය යුතු ය.".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ (ii) වන ඡේදයේ " මේ ඡේදයේ කාර්යය සඳහා " යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය තෙක් වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" මේ ඡේදයේ කාර්යය සඳහා " ආදායම් බද්ද " යන්න,—

(අ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂය සඳහා 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්ද ඊට ඇතුළත් නොවිය යුතු ය ; තව ද,

(ආ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂයට ඉහතින් වූ තක්සේරු වර්ෂය (එය මෙහි මින් මතු " ඉහතින් වූ වර්ෂය " යනුවෙන් සඳහන් කරනු ලැබේ) සඳහා, (පදිංචි නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් සහනාධාරයක් හැර) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් කර තිබුණු නිදහස් කිරීමක් ඉහතින් වූ වර්ෂයේ දී නතර කරන ලදුව ඒ ආදායම සහ ලාභ ඒ තැනැත්තාගේ බද්ද ගෙවිය යුතු ආදායම ආගණනය කිරීමේ දී ඒ තක්සේරු වර්ෂය සඳහා ගණන් ගනු ලැබ තිබුණේ නම්, ඒ ආදායම් වර්ෂයට ඉහතින් වූ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු ආදායම් බද්ද ඉන් අදහස් වේ.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඇආ) කිසිම දේපළ තහනමට ගැනීමක් ක්‍රියාත්මක කරනු නොලැබුව ද යම් පැහැර හරින්නකුට විරුද්ධව මේ වගන්තිය යටතේ කටයුතු කරගෙන යාමේ දී යම් නිලධරයකු විසින් දරන ලද යුක්තිසහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හරින්නාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" අයිතිකරු " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

" හවුල් ව්‍යාපාරය " යන්නෙහි, යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුගේ බෙදිය හැකි ලාභයේ හෝ බෙදිය හැකි අලාභයේ කොටස වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සමග හවුලේ බෙදා ගනු ලැබීම පිණිස වූ යම් නියෝජනය කිරීමක්, භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක්, පැවරීමක්, බෙරුම් කිරීමක් හෝ වෙනත් වැඩපිළිවෙළක් ඇතුළත් නොවන්නේ ය.".

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ IV වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ කොටසේ (ආ) ඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ කොටස අවසානයේ දී පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

පළමුවන රු. 200,000 සම්බන්ධයෙන්—කිසිවක් නැත.
ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන්—සියයට 05
ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන්—සියයට 10
ඉතිරි කොටස සම්බන්ධයෙන්—සියයට 15."

**24.** (1) මේ පනතේ 7 (1) වගන්තියෙන් සහ 7 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 (1) වන වගන්තියට කරන ලද සංශෝධනය 1987 මාර්තු මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) පිළිවෙලින් මේ පනතේ 11 (1) වන වගන්තියෙන් සහ 11 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 (2) වන වගන්තියට (පළමුවන උපලේඛනයේ II ඇ කොටසට අදාළ වන තාක් දුරට) සහ 32 (3ඇ) වගන්තියට කරන ලද සංශෝධන 1988 මාර්තු මස 25 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 13 (1) (ආ) වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 (1) (ආ) වගන්තියට කරන ලද සංශෝධනය 1985 දෙසැම්බර් මස 31 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) පිළිවෙලින් මේ පනතේ 14 වන වගන්තියෙන් සහ 15 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 ආ වගන්තියට සහ 38 (2) වන වගන්තියට කරන ලද සංශෝධන 1988 සැප්තැම්බර් මස 8 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 1990 අංක 31 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 අගෝස්තු මස 24 වන දින]

**1989 අංක 18 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 31 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1989 අංක 18 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි " රුපියල් හාරදහස් දෙසිය දහනම කෝටි අසූලක්ෂයක්" යන වචන වෙනුවට, "රුපියල් පන්දහස් තුන්සිය දහනව කෝටි අසූලක්ෂයක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

## 1990 අංක 39 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 12 වන දින]

**1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 39 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලබන) 1988 අංක 30 දරන පනතෙහි IV වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ IVඅ වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය :—

### IVඅ වන කොටස

### අංකිත ගිණුම

34අ. (1) මුදල් මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කරනු ලබන නියමයක් මගින් වාසික නොවන්නා වූ හෝ විදේශ රටවල පුරවැසියන් වන්නා වූ හෝ ගනුදෙනුකරුවන් වෙනුවෙන්, අංකිත බැංකු ගිණුම් පවත්වාගෙන යාමට බලපත්‍රලාභී වාණිජ බැංකුවකට අවසර දෙනු ලැබිය හැකි ය.

(2) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් විදේශ රටවල පුරවැසියන් වන්නා වූ හෝ වාසික නොවන්නා වූ හෝ ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන අංකිත ගිණුම් පහසුකම්, ජංගම ගිණුම්, තැන්පත් ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් කෙරෙහි ව්‍යාප්ත විය හැකි නමුත්, ණය පහසුකම් කෙරෙහි එය ව්‍යාප්ත නොවිය යුතු ය.

(3) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අංකිත ගිණුමක තැන්පත් කිරීම සඳහා භාරගනු ලබන සියලුම මුදල්, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන විදේශීය ව්‍යවහාර මුදල් වලින් විය යුතු ය.

(4) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කර ඇති අංකිත ගිණුමක අයිතිකරු, එම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරණු ලබන, එම බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් විසින් පමණක් දැන සිටිනු ලැබිය යුතු ය.

34ආ. (1) ගණුදෙනුකරුවකු වෙනුවෙන් අංකිත ගිණුමක් පවත්වාගෙන යන බලපත්‍රලාභී වාණිජ බැංකුවක සෑම නිලධරයකු ම සහ තමාගේ තත්ත්වයේ හෝ නිලයේ හෝ හේතුවෙන් එම අංකිත ගිණුමට අදළ, එම බැංකුවේ වාර්තාවලට, ලේඛනවලට, ලිපි ගණුදෙනුවලට හෝ වෙනත් යම් දේ වලට කිසියම් ප්‍රවේශයක් ඇති සෑම තැනැත්තකුම, එම ගිණුම් අදළ වන ගණුදෙනුකරුගේ යහපත පිණිස, එම දේවල අඩංගු කරුණු සම්බන්ධයෙන් පරම රහස්‍යතාව රැකිය යුතුය.

(2) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ගනුදෙනුකරුවකු වෙනුවෙන් අංකිත ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවක, අංකිත ගිණුමෙහි අයිතිකරුගේ අනන්‍යතාව සම්පූර්ණයෙන්ම අනුලංඝනීය විය යුතු ය. තවද, එම අංකිත ගිණුමෙහි අයිතිකරුගේ නම හෝ අනන්‍යතාවය හෝ පිළිබඳ කවර වූ හෝ යම් තොරතුරක්, කිසියම් පුද්ගලයෙක්, සංස්ථාවක්, බැංකුවක්, අධිකරණයක්, ආයතනයක්, අස්තිත්වයක්, දෙපාර්තමේන්තුවක්, නිලධරයෙක්, අනුයෝජිතයෙක්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ වෙනත් යම් ආණ්ඩුවක නියෝජිතයෙක් හෝ වෙනත් යම් නෛතික හෝ ස්වාභාවික හෝ තැනැත්තෙක්, අධිකරණ හෝ හමුදමය අධිකාරියක් හෝ වෙත එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකුවක සෑම නිලධරයකු ම සහ (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම තැනැත්තකු ම විසින් දෙනු ලැබීම, කියනු ලැබීම නැතහොත් හෙළිදරව් කරනු ලැබීම—

(අ) එසේ කිරීමට අවසරය එම අංකිත ගිණුමෙහි අයිතිකරු විසින් දෙනු ලැබුවහොත් ; හෝ

(ආ) එම අංකිත ගිණුමෙන් උද්ගත වන්නා වූ බැංකු ගිණුමක් සම්බන්ධයෙන්, එම අංකිත ගිණුමෙහි අයිතිකරු විසින් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට එරෙහිව හෝ එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් එම අංකිත ගිණුමෙහි අයිතිකරුට විරුද්ධව හෝ නඩු කටයුතු ආරම්භකර ඇත්නම් ; හෝ

(ඇ) (i) කිසියම් අධිකරණයක, විෂ මත් ද්‍රව්‍ය හෝ පැහැර ගෙන යෑම් හෝ පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාවේ යෙදවීමේ කිසියම් නීතියක් යටතේ පවරනු ලැබ ඇති කිසියම් නඩු කටයුත්තක දී ඒ නීතියෙහි කිසියම් විධිවිධානයක් මගින් එසේ හෙළිදරව් කරන ලෙස නියම කර ඇත්නම් ;

(ii) එම ගිණුම්වල මුදල්, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සමන්විත කරන කිසියම් ක්‍රියාවක් තවදුරටත් කර ගෙන යාම පිණිස, යොදා ගෙන ඇති බවට හෝ දැනටත් යොදා ගන්නා බවට වූ හේතුව මත, ඒ සඳහා වූ ඉල්ලීමක් පිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මගින් එසේ හෙළිදරව් කරන ලෙස නියම කර ඇත්නම් ;

මිස, නොකළ යුතුය.

34ඇ. (1) අංකිත ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ද, 20 වන වගන්තියෙහි හෝ 21 වන වගන්තියෙහි හෝ කාර්යයන් සඳහා බලපත්‍ර ලාභී වාණිජ බැංකුවක තැන්පතු වගකීම් ආගණනය කිරීම පිණිස එම ගිණුම්වල තිබෙන්නා වූ මුදල් ඇතුළත් කිරීම හෝ අත් හැරීම හෝ ඇතුළුව එම ගිණුම් සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

34ඈ. මේ පනතේ කාර්යයන් සඳහා—

(i) '' විදේශ රටක පුරවැසියා '' යන යෙදුමෙන් ශ්‍රී ලංකාවෙහි පුරවැසියකු නොවන්නා වූ හෝ ශ්‍රී ලංකාවෙහි සහ වෙනත් කිසියම් රටක පුරවැසියකු වන්නා වූ හෝ තැනැත්තකු අදහස් වේ ;

(ii) '' වාසික නොවන '' යන්නට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ ඇති අර්ථය ම විය යුතු ය ;

(iii) '' අංකිත ගිණුම '' යන යෙදුමෙන් අංකයකින්, සංකේත වචනයකින් හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමයකින් පමණක් හඳුනාගනු ලබන, මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද ගිණුමක් අදහස් වේ.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(1අ) 34ආ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක්, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනකට නොවැඩි කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් මිලියනයකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම ද, එම වරද දැනුවත්ව හෝ ඕනෑකමින් ම හෝ එයින් වෙනත් යම් තැනැත්තකුට අලාභයක් හෝ හානියක් සිදු වේ යයි විශ්වාස කිරීමට හේතු ඇතිව හෝ කරනු ලබන අවස්ථාවක, අවුරුදු පහකට නො අඩු වූ ද අවුරුදු දහයකට නොවැඩි වූ ද කාල සීමාවක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් එක් මිලියනයක් හෝ එම ගිණුමෙහි තිබෙන බවට දක්වා ඇති හෝ හෙළිදරව් කර ඇති ප්‍රමාණය මෙන් ශ්‍රී ලංකා මුදලින් දෙගුණයක් යන මේ දෙකින් වඩා වැඩි මුදලක දඩයක් ගෙවීමට ද ඔහු යටත් විය යුතු ය.'' ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි '' (1) වන උපවගන්තිය යටතේ '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' (1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය හෝ යටතේ '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1990 අංක 42 දරන දේශීය ආදයම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදයම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 42 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම ඡේදයේ (LV) වන අනුඡේදයේ (iii) වන විෂයයෙහි "භාර අරමුදලේ ලාභ සහ ආදායම ; සහ" යන වචන වෙනුවට "භාර අරමුදලේ ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ (LVI) වන අනුඡේදයේ "රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම ඡේදයේ අවසානයට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

"(LVII) 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත මගින් පිහිටුවන ලද උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ;

(LVIII) රතු කුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව ; සහ

(LIX) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ—

(අ) (VIII) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(IX) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සේවා නියුක්තයකුගේ"

(ආ) "(I) වන, (II) වන, (III) වන, (VI) වන, (V) වන, (VI) වන, හෝ (VII) වන, විෂයන්හි සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට '(I) වන, (II) වන, (III) වන, (IV) වන, (V) වන, (VI) වන, (VII) වන, (VIII) වන, හෝ (IX) වන විෂයයන්හි සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ඌ) ඡේදයේ ''ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකාර ආයතනය හෝ කොළඹ ක්‍රමය කාර්යාංශය හෝ ආසියානු සංවර්ධන බැංකුව'' යන වචන වෙනුවට ''ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකාර ආයතනය, කොළඹ ක්‍රමය කාර්යාංශය, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, හෝ රතු කුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව'' යන වචන ආදේශ කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදය, ''17 වන, 17අ වන, 18 වන, 19 වන, 20 වන, 20 අ වන, 20ආ වන, 20ඇ වන, 21 වන, 22 වන, 22අ වන, 22ආ වන, 22 ඇ වන හෝ 22 ඈ වන වගන්ති යටතේ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''17 වන, 17 අ වන, 17ඇ වන, 17 ඈ වන, 18 වන, 19 වන, 20 වන, 20 අ වන, 20 ආ වන, 20 ඇ වන, 21 වන, 22 අ වන, 22 ආ වන, 22 ඇ 22 ඈ වන, 22 ඈඇඈ වන හෝ 22 ඈඇඈඇ වන වගන්ති යටතේ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (මෙම සංශෝධනය ඉංග්‍රීසි පිටපතට පමණක් අදාළවේ)

(2) එම ඡේදයේ (XVI) වන අනුඡේදයේ ''ඇතිවන වෙනස් වීමෙන්'' යන වචන වෙනුවට ''ඇතිවන වෙනස් වීමෙන් ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) (XVI) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

''(XVII) යම් පුද්ගලයකුට අයත් වූ ද, විකිණීමට පෙරාතුවම යම් ව්‍යාපාරයක වත්කමක් නොවූවා වූද යම් දේපළක්, 1990 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු විකිණීමෙන් ලැබෙන මුළු මුදල, එම විකිණීමේ දිනයෙන් එක් අවුරුද්දක් ඇතුළත, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර පහත දැක්වෙන යම් සමාගමක එනම්—

(අ) 17ඇ වගන්තියේ, 22ඈඇඈ වගන්තියේ හෝ 22ඈඇඈඇ වගන්තියේ සඳහන් යම් සමාගමක ; හෝ

(ආ) 17ඉ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් කරගෙන යන්නා වූ සමාගමක (එහෙත් එකී සමාගමෙහි මතු සඳහන් පරිදි ආයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය එකී ව්‍යවසායේ නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ කාර්යය සඳහාම පමණක් බවට එකී සමාගම විසින් සහතික කරනු ලබන්නේ නම්)

පවත්නා කොටසක් නොවන්නා වූ යම් සාමාන්‍ය කොටසක් මිලට ගනු වස් ආයෝජනය කරනු ලබන්නේ නම්, එකී විකිණීමෙන් පැන නගින යම් ප්‍රාග්ධන ලාභයක් :

එසේ වුවද යම් තක්සේරු වර්ෂයක් සඳහා එම පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙන්, එම ආයෝජනය වෙනුවෙන් දීමනාවක් 31 වන වගන්තිය යටතේ අඩු කර ඇත්නම් මේ අනුඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

එසේම තවදුරටත් එම මිළ දී ගැනීමේ දිනයෙන් පසු පස් අවුරුද්දක් ඇතුළත ඒ පුද්ගලයා ගේ මරණයෙන් හැර අන් ආකාරයකින් එසේ මිලදී ගත් කොටසේ අයිතියෙහි වෙනසක් සිදු වන අවස්ථාවක—

(i) අයිතියේ එම වෙනස සිදුවූ කොටස මිල දී ගැනීම සඳහා ආයෝජනය කරන ලද මුදලට ආරෝපණය කළ හැකි එම ප්‍රාග්ධන ලාභයේ කොටස සම්බන්ධයෙන් මේ අනුඡේදය යටතේ ප්‍රදානය කර ඇති ආදායම් බද්දෙන් නිදහස් කිරීම ප්‍රදානය කර නොතිබුණේ නම් එම ප්‍රාග්ධන ලාභය ඇතිවන තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයා යටත් විය හැකිව තිබූ ආදායම් බද්ද ; සහ

(ii) එම ප්‍රාග්ධන ලාභය උද්ගත වූ තක්සේරු වර්ෂය සඳහා පනවන ලද ආදායම් බද්ද

යන දෙකෙහි වෙනසින් සංයුක්ත වන අතිරේක තක්සේරුවක්, මේ පනතේ කුමක් සඳහන්ව ඇතද එම විකිණීම සිදු කරන ලද තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයා සම්බන්ධයෙන් කළ යුතු අතර ඒ අනුව තක්සේරු දැන්වීම, අභියාචනය සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන ඒ අතිරේක තක්සේරුවට අදාළ විය යුතු ය.

මේ අනුඡේදයේ කාර්ය සඳහා ''අයිතියේ එම වෙනස සිදුවූ කොටස මිලදී ගැනීම සඳහා ආයෝජනය කරන ලද මුදලට ආරෝපනය කළ හැකි එම ප්‍රාග්ධන ලාභයේ කොටස'' යන්නෙන් මේ අනුඡේදයේ සඳහන් දේපළ විකිණීමෙන් ලැබුණු මුළු මුදලට, එම ප්‍රාග්ධන ලාභය දරන අනුපාතයට වන අනුපාතයක් අයිතියේ එම වෙනස සිදුවූ කොටස මිලදී ගැනීම සඳහා ආයෝජනය කරන ලද මුදලට, යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද එම මුදල් ප්‍රමාණය අදහස් වේ.

(xviii) 22ඈඈඈ වන වගන්තියේ සඳහන් යම් අවදානම් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමක් විසින් වෙනත් යම් සමාගමක දරනු ලබන වෙනත් යම් සමාගමක යම් කොටසක් හෝ ස්කන්ධයක් විකිණීමෙන් ;

(xix) 22ඈඈඈ වන වගන්තියේ සඳහන් යම් ඒකක භාරයක් විසින් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් දරනු ලබන වෙනත් යම් සමාගමක දරන කොටසක් හෝ ස්කන්ධ එම ඒකක භාරය විසින් හෝ අන්‍යෝන්‍ය අරමුදල විසින් විකුණනු ලැබීමෙන් ;

(xx) යම් තැනැත්තකු විසින් දරනු ලබන යම් ඒකක භාරයක හෝ යම් අන්‍යෝන්‍ය අරමුදලක යම් ඒකකයක්, එම තැනැත්තා විසින් එම ඒකකය අත්කර ගැනීමේ දිනයෙන් එක් අවුරුද්දකට පසු එම තැනැත්තා විසින් විකිණීමෙන් ;

(xxi) නිල ලැයිස්තු ගත සමාගමක යම් කොටසක් යම් තැනැත්තකු විසින් අත්කර ගැනීමේ දින සිට එක් අවුරුද්දකට පසුව ඒ කොටසෙහි අයිතිය වෙනස් වීමෙන් ;''.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම ප්‍රඥප්තියේ 17ආ, 17ඇ, 17ඈ, 17ඉ, 17ඊ, සහ 17උ වන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය.:—

17ආ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක, (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු යම් ලාභ සහ ආදායම් හැර) (3) වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම, එම ව්‍යවසාය ව්‍යාපාරය කරගෙන යාම් ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 1990 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ව්‍යාපාරය කරගෙන යාම ආරම්භ කළා වූද ;

(ආ) මේ වගන්තිය අදාළ වන ව්‍යවසායක් බවට, ප්‍රතිපත්ති සැළසුම් සහ ක්‍රියාත්මක කිරීමේ විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අනුමත කරන ලද්දා වූද ;

(ඇ) කළු තේ තොග, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ඔට්ටුපාලු, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, ගෙඩි පොල්, පොල් කෙඳි හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් වෙළඳ ද්‍රව්‍යයක් හැර, යම් කෘෂිකාර්මික නිෂ්පාදන ද්‍රව්‍යයක් හෝ අපනයනයට යොමුවූ වෙළඳ ද්‍රව්‍යයක් නැවත විකිණීම සඳහා මිළට ගැනීමේ යෙදී සිටින්නා වූ ද ;සහ

(ඈ) කලින් පැවති යම් ව්‍යාපාරයක්, බෙදීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවූවක් නොවන යම් ව්‍යවසායක් වූද

ව්‍යවසායකට අදාළ වේ.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ''යම් කෘෂිකාර්මික හෝ අපනයනයට යොමු වූ වෙළඳ ද්‍රව්‍යයක්'' යන්නෙන්—

(i) යම් කෘෂිකාර්මික පලදාවක් ; හෝ

(ii) යම් කෘෂිකාර්මික පලදාවකින් නිෂ්පාදිත යම් වෙළඳ ද්‍රව්‍යයක් ; හෝ

(iii) අපනයනය කිරීම සඳහා යම් අපනයනකරුවකුට සැපයීමට අදහස් කර ඇති නිෂ්පාදිත භාණ්ඩයක්

අදහස් වේ.

17ඇ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 1990 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවා වූ ;

(ආ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මේ වගන්තිය අදාළ සමාගමක් වශයෙන් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ;

(ඇ) (i) කාර්මික භාණ්ඩ හෝ කාර්මික කාර්යාවලි සම්බන්ධයෙන් පුරෝගාමී ස්වභාවයක කාර්මික ව්‍යවසායක් ; හෝ

(ii) නිෂ්පාදන කාර්යාවලි සම්බන්ධයෙන් හෝ කොම්පියුටර් සියුම් උපකරණ සහ කොම්පියුටර් ආශ්‍රිත සංවර්ධනය සම්බන්ධයෙන් හෝ කාර්මික මෝස්තර සම්බන්ධයෙන් හුහුණුවීම සැලසීම සඳහා වූ ව්‍යවසායක්

කරගෙන යාමෙහිලා පමණක් නිරත යම් සමාගමකට අදළ විය යුතු ය.

එසේ වුවද, ඒ ව්‍යවසාය, කලින් පැවතියා වූ යම් ව්‍යාපාරයක් බෙදීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු ලැබූ ව්‍යවසායක් නොවිය යුතු ය.

17ඈ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම විසින්, ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක, කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 1990 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලැබුවා වූ ද ;

(ආ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, මේ වගන්තිය අදළ සමාගමක් වශයෙන් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූද ; සහ

(ඇ) යම් ස්ථානයක දී, භාණ්ඩ සහ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා වූ ව්‍යවසායන් විස්සකට නොඅඩු සංඛ්‍යාවක් සඳහා එක් එක් ව්‍යවසායේ අනන්‍ය ප්‍රයෝජනය පිණිස වර්ග අඩි දෙදහසකට නොඅඩු බිම් ප්‍රමාණයක් ඇතුළුව ඒ ස්ථානයේ දී උප ව්‍යුහ පහසුකම් සලසන යම් ව්‍යවසායක් කරගෙන යාමෙහි ලා පමණක් නිරතව ඇත්තා වූ

යම් සමාගමකට අදළ විය යුතු ය ;

එසේ වුවද ඒ ව්‍යවසාය කලින් පැවතියා වූ යම් ව්‍යාපාරයක් බෙදීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවන ලද ව්‍යවසායක් නොවිය යුතු ය.

17ඉ. (1) 1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස යටතේ ලියාපදිංචි කරන ලද යම් අක්වෙරළ සමාගමකට (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම් හැර) (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් ලැබෙන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායම, (සාධාරණ වියදම් වශයෙන් කොමසාරිස්

ජනරාල්වරයා විසින් අදහස් කරනු ලබන යම් මුදලක් ඉන් අඩුකර) එම ලාභ සහ ආදයම ශ්‍රී ලංකාවටම ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, එම සමාගම එසේ ලියාපදිංචි කරනු ලැබූ තක්සේරු වර්ෂය ආරම්භයේ සිට අවුරුදු පහක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන පහත දැක්වෙන යම් ව්‍යවසායකට, එනම්—

(අ) මේ වගන්තිය අදාළ වන ව්‍යවසායක් වශයෙන් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද ;

(ආ) රක්ෂණය හෝ ගුවන් ගමන් හෝ ණය මුදල් ප්‍රතිරක්ෂණය හෝ ණය මුදල් සමූහනය, අන්තර් ජාතික උපදේශයක සේවා හෝ එම සේවාවන් දෙකක හෝ වැඩි ගණනක සංයෝජනයක සේවාවන් සැපයීමට අදළ අක්වෙරළ සේවාවල ගෙඩබිමේදී යෙදී සිටින්නාවූ ද

යම් ව්‍යවසායකට අදළ විය යුතු ය.

17ඊ. (1) බඩු හෝ වෙළඳ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සෑදීම සඳහා වූද (2) වන උප වගන්තියේ සඳහන් වූ ද යම් ව්‍යවසායක් ව්‍යාප්ත කිරීමට ආරෝපණය කළ හැකි යම් ලාභ සහ ආදයම, අදළ දිනයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල පරිච්ඡේදයක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) ස්වකීය නිෂ්පාදන ධාරිතාව ව්‍යාප්ත කිරීමෙහි ලා රුපියල් මිලියන පහකට නොඅඩු අලුත් ප්‍රාග්ධන වියදමක්, අදළ දිනයේ සිට මාස දෙළහක කාල පරිච්ඡේදයක් ඇතුළත දරා ඇත්තා වූ ද ;

(ආ) මේ වගන්තිය අදළ වන ව්‍යවසායක් වශයෙන් කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අනුමත කරන ලද්දවූ ද ;

(ඇ) ඒ ව්‍යවසාය අදළ දිනයෙන් ආරම්භ වන වර්ෂයේ අවසන් දිනයේ දී සේවයේ නියුක්ත කර සිටින්නා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලකට දයක මුදල් එක් එක් සේවා නියුක්තයා වෙනුවෙන් ගෙවනු ලැබ ඇත්තා වූ ද සේවා නියුක්තයන් සංඛ්‍යාව, අදළ දිනයට පෙරාතුවම වූ මාස දෙළහකට අඩු නොවන අඛණ්ඩ කාලසීමාවක් තුළ ඒ ව්‍යවසායෙහි සේවයේ නියුක්ත කර සිටියා වූ උපරිම සේවා නියුක්තයන් සංඛ්‍යාව විසිපහකට අඩු නොවන සංඛ්‍යාවකින් ඉක්මවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරන්නා වූ ද

යම් ව්‍යවසායකට අදළ විය යුතු ය :

එසේ වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු පහක කාලසීමාව ඇතුළත යම් තක්සේරු වර්ෂයක් තුළදී ඒ ව්‍යවසායේ සේවයේ නියුක්ත කර සිටින්නා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලකට ඒ ව්‍යවසායේ සෑම සේවා නියුක්තයින්ම

වෙනුවෙන් දයක මුදල් ගෙවනු ලැබ ඇත්තා වූ ද සේවා නියුක්තයන් සංඛ්‍යාව, එකී උපරිමය විසිපහකින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් නොඉක්මවන අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් ඒ ව්‍යවසායේ එම තක්සේරු වර්ෂය සඳහා වූ එම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා සහ යම් කාර්මික ව්‍යවසායක් සම්බන්ධයෙන්—

(අ) යම් තක්සේරු වර්ෂයකට අදාළව, "ව්‍යවසායක් ව්‍යාප්ත කිරීමට ආරෝපණය කළ හැකි" යන යෙදුමෙන්—

(i) සියයට දහයකින් නැතහොත් ඒ තක්සේරු වර්ෂයේ හෝ ඊට ආසන්නයේ හෝ ශ්‍රී ලංකාවෙහි පැවති උද්ධමන අනුපාතිකය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන දන්වීමක් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි වෙනත් ප්‍රතිශතයකින් අඩුකළ ඒ තක්සේරු වර්ෂය සඳහා (ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ඒ ව්‍යවසායෙහි ලාභ සහ ආදායමෙහි,

(ii) ඒ ව්‍යවසාය අදළ දිනයට පූර්වයෙන් අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක් ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් ඇති අවස්ථාවක, අදළ දිනයට පූර්ව අවුරුදු තුනක් සඳහා ගණන් බලන ලද නැතහොත් ඒ ව්‍යවසාය අදළ දිනයට පූර්වයෙන් අවුරුදු තුනකට අඩු කාලයක් ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් ඇති අවස්ථාවක එසේ ව්‍යාපාර කටයුතු කර ඇති සම්පූර්ණ කාලසීමාව සඳහා ගණන් බලන ලද ඒ ව්‍යවසායෙහි සාමාන්‍ය වාර්ෂික ලාභ සහ ආදායම ඉක්මවන,

අතිරික්ත ප්‍රමාණය අදහස් වේ.

(ආ) "අදළ දිනය" යන යෙදුමෙන්, 1990 අප්‍රේල් මාසයට කලින් නොවූ සහ 1992 මාර්තු මාසයට පසුව නොවූද ඒ ව්‍යවසාය කරගෙන යන තැනැත්තා විසින් හෝ ඒ ව්‍යවසාය හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යන අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ තෝරාගනු ලැබ, ඒ මාසයේ අවසාන දිනයේ සිට දවස් තිහකට වඩා පසු නොවී කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දනුම් දෙනු ලැබුවා වූ ද යම් ලිත් මාසයක පළමුවන දිනය අදහස් වේ ;

එසේ වුවද "අදළ දිනය" කොමසාරිස් ජනරාල්වරයා වෙත එසේ දනුම් දෙනු ලැබ නොමැති අවස්ථාවකදී, 1990 අප්‍රේල් මස 1 වන දිනය, අදළ දිනය ලෙස සැලකිය යුතු ය.

(ඇ) "අලුත් ප්‍රාග්ධන වියදම" යන යෙදුමෙන්, ඒ ව්‍යවසාය විසින් නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම අරමුණු කරගෙන (යම් ඉඩම් හෝ යම් ගොඩනැගිලි හැර) අලුත් නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම පිණිස කරගෙන යන තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් දරන ලද වියදම් අදහස් වේ :

එසේ වුව ද අලුත් උපකරණ නොවන නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම පිණිස දරන ලද වියදම්—

(i) ඒ නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම ආර්ථික වශයෙන් යුක්ති යුක්ත බව ; සහ

(ii) ගැනුම් මිල ඒ නිෂ්පාදන උපකරණවල සාධාරණ වෙළෙඳ වටිනාකම බව

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වියදම අලුත් ප්‍රාග්ධන වියදම් ලෙස නොසැලකිය යුතු ය ;

එසේ ම තවදුරටත්, අදාළ දිනයේ දී හෝ අදාළ දිනයට පෙර ඒ ව්‍යාපාරයේ වත්කම්වල කොටසක් වූ යම් උපකරණයක්, අදාළ දිනයෙන් පසුව ප්‍රතියෝජනය කිරීම, අලුත් ප්‍රාග්ධන වියදම් නොවන සේ සැලකිය යුතු ය.

17උ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් බස්රථයක් ධාවනය කරවීමෙන්, මගී ප්‍රවාහනය සඳහා වන යම් ව්‍යාපාරයක් ලබන්නා වූ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම, ඒ බස්රථය මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් පළමුවෙන් ලියාපදිංචි කළ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් තුළ ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) අලුත් බස්රථයක් වන ;

(ආ) 1990 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර, මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් පළමුවරට ලියාපදිංචි කරන ලද බස් රථයක් වන ; සහ

(ඇ) රියදුරා අත්හැර මගීන් තිස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් සඳහා ආසන ධාරිතාවක් ඇති කවර හෝ බස් රථයකට අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ''යම් බස් රථයකින් ලැබෙන ලාභ සහ ආදායම්'' යන යෙදුම යම් තක්සේරු වර්ෂයක් හා සම්බන්ධව සහ මගී ප්‍රවාහනය සඳහා වන යම් ව්‍යාපාරයක් හා සම්බන්ධව යෙදෙන විට, ඒ ව්‍යාපාරය විසින් මගී ප්‍රවාහනයෙන් ලබන ලාභ සහ ආදායම, ඒ ව්‍යාපාරයෙන් ධාවනය කරවන සියලු බස්රථවලින් මගීන් ප්‍රවාහනය කිරීමෙන් ඒ ව්‍යාපාරයට ලැබෙන මුළු දළ ලැබීම්වලට දරන අනුපාතයම වන අනුපාතයක්, යම් මුදල් ප්‍රමාණයකට ඒ බස්රථයේ මගීන් ප්‍රවාහනය කිරීමෙන් ලැබෙන දළ ලැබීම් දරන්නේ ද ඒ මුදල් ප්‍රමාණය අදහස් වේ.''.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

එහි '' ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.'' යන වචන වෙනුවට '' ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය :

එසේ වුව ද එවැනි සැපයීමක්, ඉහත කී ආකාරයේ වූ ණයවර ලිපියකින් ආවරණය කිරීම අවස්ථානුකූල නොවන බව හෝ ප්‍රායෝගික නොවන බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, එම සැපයුම් එසේ ආවරණය නොවී තිබුණ ද, මේ වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කිරීම අදාළ විය යුතු බව—

(අ) ඒ සැපයුම, ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියකින් ආවරණය වී ඇත්නම් හෝ ඒ සැපයුම අදාළ අපනයනය ඇත්ත වශයෙන් ම කරන ලද බවට ඔහුට සෑහීමට පත්වීමට අවශ්‍ය වෙනත් එවැනි ලේඛන සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් ; සහ

(ආ) ඒ අපනයනවල විදේශ විනිමය වටිනාකම ප්‍රේෂණය කරන ලද්දේ යම් බැංකුවකට ද ඒ බැංකුව විසින් ඒ සැපයුමට අදාළ අපනයනවල විදේශ විනිමය අගය ලැබී ඇති බව සහතික කර ඇත්නම්,

ඔහු විසින් විධාන කළ යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්,

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇ වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර එය ඒ ප්‍රඥප්තියේ 22 ඇඇඇඇ වගන්තිය ලෙස බල සහිත විය යුතු ය :—

22ඇඇඇඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක (23 වන වගන්තිය යටතේ අගය ක්ෂයවීම සම්බන්ධයෙන් දීමනාවක් ප්‍රදානය කර ඇති, යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලත් යම් ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම, ඒ ඒකක භාරය හෝ අන්‍යොන්‍ය අරමුදල ව්‍යාපාර කටයුතු කරගෙන යාම් ආරම්භ කළ වර්ෂයේ සිට ගණන් බලන ලද අවුරුදු පහක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන මේ වගන්තිය අදාළ වන්නා වූ ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් බවට, 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින්, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඒකක භාරයකට හෝ අන්‍යොන්‍ය අරමුදලකට අදාළ විය යුතු ය.''.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉඉඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (ඉඉඉඉ) ඒ තැනැත්තා විසින්, කරගෙන යන යම් වෙළඳාමක දී හෝ ව්‍යාපාරයක දී ඔහු ප්‍රයෝජනයට ගන්නා යම් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා ඔහුගේ නමින් බලපත්‍රය ලබා ගැනීම පිණිස ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ඔහු විසින් 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරන ලද යම් ගෙවීමකින් දහයෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් :

එසේ වුවද ඊට පසුව පූර්ව තක්සේරු වර්ෂවල දී අඩු කරන ලද මුදල් ප්‍රමාණවල එකතුව එම ගෙවූ මුදලට සමාන වන්නේ නම්, එවැනි යම් ගෙවීමක් වෙනුවෙන් මේ ඡේදයේ විධිවිධාන යටතේ යම් අඩු කිරීමක් කිසිම තැනැත්තෙකු වෙනුවෙන් නොකළ යුතු ය.''.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා පිළිවෙළින් ඒ ප්‍රඥප්තියේ 23අ සහ 23ආ වගන්ති ලෙස බල පැවැත්විය යුතු ය :—

23අ. (1) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත (එක් තොගයක් වශයෙන් වූ '' කලු තේ '', ක්‍රෙප් රබර්, ෂීට් රබර්, ඔට්ටපාලු, පොල්තෙල්, කපාපු පොල්, කොප්පරා, ගෙඩි පොල්, පොල් කොහු හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය ගැන සැලකිලිමත්ව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන දැන්වීමක් මගින් නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි වෙනත් එවැනි වෙළෙඳ ද්‍රව්‍ය නොවන) යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය කිරීමෙහි නිරත යම් ව්‍යවසායකින් යම් වාසික තැනැත්තකු විසින් ලබන ලාභ හෝ ආදායම් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් අනුමත අපනයන වෙළෙඳපොල වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකමක කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වැය කර තිබෙන යම් මුදල් ප්‍රමාණයක් වෙනුවෙන්, එසේ වැය කර ඇති මුදල් ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදල් ප්‍රමාණයක අඩුකිරීමක් සඳහා ඉඩ දිය යුතු ය.

(2) (අ) (i) යම් වෙළෙඳ සල්පිලකට හෝ වෙළෙඳ ප්‍රදර්ශනයකට සහභාගි වන සේවා නියුක්තයන් දෙදෙනකුට වැඩි සංඛ්‍යාවකට ගෙවූ පාරිශ්‍රමික වශයෙන්;

(ii) යම් වෙළෙඳ කාර්යාලයක නියුක්තකර සිටින සේවා නියුක්තයන් තිදෙනකුට වැඩි සංඛ්‍යාවකට ගෙවූ පාරිශ්‍රමික වශයෙන් ; හෝ

(iii) යම් සේවා නියුක්තයකුට ගෙවූ පාරිශ්‍රමිකය විනිමය පාලකවරයා විසින් අනුමත කර තිබෙන මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම්, ඒ පාරිශ්‍රමිකය වශයෙන්

වැය කරන ලද කවර හෝ මුදල් ප්‍රමාණයක් වෙනුවෙන්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කිසිදු අඩුකිරීමක් සඳහා ඉඩ නොදිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා—

(i) " සේවා නියුක්තයා " යන්න, වෙළෙඳ සල් පිලක්, වෙළෙඳ ප්‍රදර්ශනයක් හෝ වෙළෙඳ කාර්යාලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, එයින් ඒ වෙළෙඳ සල්පිල හෝ වෙළෙඳ ප්‍රදර්ශනය පැවැත්වෙන කාලසීමාව ආරම්භ වීමට නැතහොත් ඒ වෙළඳ කාර්යාලය විවෘත කළ දිනයට පෙරාතුව ම වූ දොළොස් මාසයකට නො අඩු අඛණ්ඩ කාලසීමාවක් තුළ (1) වන උපවගන්තියේ සඳහන් යම් වාසික තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ සිටියා වූද කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර තිබෙන යම් අර්ථසාධක අරමුදලකට ඔහු වෙනුවෙන් ඒ වාසික තැනැත්තා විසින් ඒ සේවා නියුක්ති කාලසීමාව සඳහා නොකඩවා දායක මුදල් ගෙවා ඇත්තා වූ ද යම් සේවා නියුක්තයකු අදහස් වේ ;

(ii) " ගෙවූ පාරිශ්‍රමිකය " යන්න යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් යෙදෙන විට එයින්, ඒ වෙළෙඳ සල්පිල හෝ වෙළෙඳ ප්‍රදර්ශනය නැතහොත් ඒ වෙළෙඳ කාර්යාලයේ සේවා නියුක්තිය හා සම්බන්ධ සේවා නියුක්තයා වෙනුවෙන් ගමනා ගමනය, නවාතැන් පහසුකම්, යැපීම් හෝ වෙනත් යම් වියදම් වශයෙන් දරන ලද වියදම් අදහස් වේ.

(ආ) ඒ කාර්යාලය පිහිටා ඇති රටෙහි දී ආදයම මත වන බද්දකට යටත්වන ස්ථිර ආයතනයක් ඒ ව්‍යවසායට ඇත්තේ නම් (1) වන උප වගන්තිය යටතේ කිසිදු අඩු කිරීමක් සඳහා ඉඩ නොදිය යුතු ය ;

(ඇ) ඒ මුදල වෙනුවෙන් 23 වන වගන්තිය යටතේ අඩු කිරීමක් සඳහා ඉඩ දී ඇත්නම්, (1) වන උපවගන්තිය යටතේ, කිසිදු අඩු කිරීමක් සඳහා ඉඩ නොදිය යුතු ය ;

(ඈ) 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙර හෝ 1995 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව වැය කරන ලද කවර හෝ මුදල් ප්‍රමාණයක් වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ කිසිදු අඩු කිරීමක් සඳහා ඉඩ නොදිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) " විදේශ වෙළෙඳ පොළ සංවර්ධන ක්‍රියාකාරකම් " යන යෙදුමෙන් (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහාම පමණක් වූ—

(i) ශ්‍රී ලංකාවෙන් පිටත පැවැත්වෙන යම් වෙළෙඳ සල්පිලකට හෝ වෙළෙඳ ප්‍රදර්ශනයකට සහභාගී වීම ;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක යම් වෙළෙඳ කාර්යාලයක් පවත්වාගෙන යාම ;

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත පළ කරනු ලබන යම් ප්‍රකාශනයක යම් ප්‍රචාරක දැන්වීමක් පළ කිරීම ;

(iv) යම් මිළ දර්ශනයක්, කුඩා පොතක් හෝ වෙනත් ප්‍රචාරක විස්තර පත්‍රිකා පිළියෙල කිරීම , මුද්‍රණය කිරීම සහ පළ කිරීම ; හෝ

(v) වෙනත් යම් ක්‍රියාකාරකමක්

අදහස් වේ.

(ආ) " අනුමත " යන්නෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ නිර්දේශය මත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ඔහු විසින් අනුමත බව අදහස් වේ.

(ඇ) " ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත " යන්න යම් වෙළෙඳ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන්නා වූ ද—

(i) ශ්‍රී ලංකාවේ දී ඒ වෙළෙඳ ද්‍රව්‍යයට එකතු කරන ලද අගය ඒ වෙළෙඳ ද්‍රව්‍යයේ (නැව් කුලී සහ රක්ෂණ ගාස්තු අය කිරීමට පෙර) අපනයන මිළෙන් සියයට හතළිහකට අඩු නොවන බවට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කර ඇත්තා වූ ; හෝ

(ii) ශ්‍රී ලංකාවේ දී ඒ වෙළෙඳ ද්‍රව්‍යයට එකතු කරන ලද අගයෙහි ශ්‍රම සහභාගය, ඒ වෙළෙඳ ද්‍රව්‍යයට ශ්‍රී ලංකාවේ දී එකතු කරනු ලැබූ මුළු අගයෙන් සියයට හැටකට අඩු නොවන බවට, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කර ඇත්තා වූ ද

වෙළෙඳ ද්‍රව්‍යයක් අදහස් වේ.

23ආ. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමෙහි නිරත යම් ව්‍යවසායකින් යම් තැනැත්තකු විසින් ලබන ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් යම් විද්‍යාත්මක, කාර්මික හෝ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා හෝ ඒ ව්‍යවසායෙහි සේවයේ නියුක්ත කර සිටින යම් සේවා නියුක්තයකු ශ්‍රී ලංකාවේ දී පුහුණු කිරීම සඳහා හෝ දරන ලද වියදම් මෙන්

දෙගුණයකට සමාන මුදල් ප්‍රමාණයක අඩු කිරීමක් සඳහා ඒ පර්යේෂණ කටයුතු හෝ පුහුණුව ඒ වෙළෙඳ ද්‍රව්‍යය නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට හෝ ඒ වෙළෙඳ ද්‍රව්‍යයේ ගුණාත්මක තත්වය උසස් කිරීමට හෝ කෙළින්ම සම්බන්ධ වන්නේ නම්, ඉඩ දිය යුතු ය.

(2) (අ) 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙර හෝ 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව හෝ දරන ලද යම් වියදමක් වෙනුවෙන් ;

(ආ) (i) 23 වන වගන්තියේ විධිවිධාන යටතේ වූ අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු ලැබ තිබෙන යම් වියදමක් වෙනුවෙන් ; හෝ

(ii) 24 වන වගන්තියේ විධිවිධාන යටතේ අඩු කිරීමක් සඳහා ඉඩදෙනු ලැබිය නොහැකි යම් වියදමක් වෙනුවෙන්

(1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කිසි අඩුකිරීමක් සඳහා ඉඩ නොදිය යුතු ය.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) ''(5ආ) වන උපවගන්තියේ සහ (5ඇ) වන උප වගන්තියේ '' යන ඉලක්කම් සහ වචන වෙනුවට ''(5ආ) වන උපවගන්තියේ, (5ඇ) වන උප වගන්තියේ සහ (5ඈ) වන උපවගන්තියේ '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) '' ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද සුදුසුකම් ලබන සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම ඒ සුදුසුකම් ලබන ගෙවීමට සමාන ප්‍රමාණයක දීමනාවක් (5) වන, (5අ) වන, (5ආ) වන උපවගන්තියේ, සහ (5ඇ) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව 30 වන වගන්තියේ කාර්ය සඳහා අඩු කරනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට '' ඒ තක්සේරු වර්ෂයේදී ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන සුදුසුකම් ලබන සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම, ඒ සුදුසුකම් ලබන ගෙවීමට සමාන ප්‍රමාණයක දීමනාවක් (5) වන උපවගන්තියේ, (5අ) වන උපවගන්තියේ, (5ආ) වන උපවගන්තියේ (5ඇ) වන උපවගන්තියේ සහ (5ඈ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව 30 වන වගන්තියේ කාර්ය සඳහා අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, 17ඇ වගන්තියෙහි හෝ 22ඇඇඇ වගන්තියෙහි හෝ 22ඇඇඇ වගන්තියෙහි සඳහන් හෝ 17ඊ වගන්තියෙහි සඳහන් ව්‍යවසායක් පවත්වාගෙන යන සමාගමක යම් පවත්නා කොටසක් හැර, යම් සාමාන්‍ය කොටසක් මිලට ගැනීමේ දී 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1990 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින් සුදුසුකම් ලබන ගෙවීමක් කරනු ලබන අවස්ථාවක 1990 නොවැම්බර් මස 30 වන දින හෝ ඉන් පෙර කොමසාරිස්-ජනරාල්වරයා අමතනු ලබන ලිඛිත සන්දේශයක් මගින් ඒ තැනැත්තා එසේ තීරණය කළහොත් මේ වගන්තියේ කාර්ය සඳහා එම සුදුසුකම් ලබන ගෙවීම 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ දී කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් '';

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(i) (ආ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (vii) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඇතිකොට පරිපාලනය කරනු ලබන සෙවන අරමුදලට ",

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ—

" අනුමත ව්‍යවසායක " යන වචන වෙනුවට " (ට) ඡේදයෙහි සඳහන් අනුමත ව්‍යවසායක් නොවන අනුමත ව්‍යවසායක " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (ix) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (x) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට " ; සහ

(iv) ඒ උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ට) (i) 17ඇ වගන්තියෙහි හෝ 22ඇඇඇ වගන්තියෙහි හෝ 22ඇඇඇඇ වගන්තියෙහි හෝ සඳහන් කරනු ලැබුවා වූ , හෝ

(ii) තනිකරම යම් ව්‍යවසායක නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමේ කාර්ය සඳහා වන බවට එසේ ආයෝජනය කරනු ලැබූ මුදල ඒ සමාගම විසින් සහතික කරනු ලැබ ඇත්නම්, 17ඊ වගන්තියෙහි සඳහන් ව්‍යවසායක් පවත්වාගෙන යන්නා වූ

සමාගමක් වන යම් අනුමත ව්‍යවසායක පවත්නා කොටස් හැර, සාමාන්‍ය කොටස් මිලට ගැනීමෙහි දී, යම් තැනැත්තකු විසින් ආයෝජනය කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් :

එසේ වුවද එසේ ආයෝජනය කරනු ලැබූ මුදල 14 වන වගන්තියේ (අ) ඡේදයේ (XVII) වන අනුඡේදයේ සඳහන් යම් විකිණීමකින් ලත් සම්පූර්ණ මුදලින් වන අවස්ථාවක, ඒ විකිණීමෙන් උද්ගත වන ප්‍රාග්ධන ලාභ සම්බන්ධයෙන් ආදායම් බද්දෙන් නිදහස් කිරීමක් 14 වන වගන්තිය යටතේ දී ඇත්නම්, මේ වගන්තිය යටතේ කිසිම දීමනාවක් අඩු කරනු නොලැබිය යුතුය.".

(3) ඒ වගන්තියේ (5ඇ) උපවගන්තියෙහි " 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5ඇ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (5ඈ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම—

(i) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේයයි සැලකෙන (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) සහ (ට) ඡේදවල සඳහන් ගෙවීම් හැර සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් පනස් දහසක් යන දෙකින් කවර වූ හෝ අඩු මුදල නොඉක්මවිය යුතුය ;

(ii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේයයි සැලකෙන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් පනස් දහසක් නොඉක්මවිය යුතු ය ;

(iii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේයයි සැලකෙන (2) වන උපවගන්තියේ (ට) ඡේදයෙහි සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතු ය ; සහ

(iv) මේ උපවගන්තියේ (i) වන සහ (ii) වන ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල සමස්තය සම්බන්ධයෙන් රුපියල් පනස් දහසක් නොඉක්මවිය යුතු ය." ; තව ද

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ " (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් " යන වචන වෙනුවට "(ආ) , (ඇ), (ක), (ග), හෝ (ට) ඡේදවල සඳහන් " යන වචන ආදේශ කිරීමෙන් :

(6) ඒ වගන්තියේ (7අ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (7ආ) (2) වන උපවගන්තියේ (ට) ඡේදයෙහි සඳහන් යම් කොටසක් මිලට ගැනීම සඳහා කරන ලද යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් (1) වන උපවගන්තිය යටතේ දීමනාවක් අඩු කරනු ලැබ ඇති අවස්ථාවක, සහ ඒ මිලට ගැනීමේ දිනයට පසුව අවුරුදු පහක කාලසීමාවක් ඇතුළත ඒ කොටස මිලට ගනු ලැබූ පුද්ගලයාගේ මරණය සිදුවීමෙන් හැර, අන්‍යාකාරයකින් ඒ කොටසෙහි අයිතිය සම්බන්ධයෙන් වෙනසක් ඇතිවන අවස්ථාවක, එවිට, ඒ දීමනාව ඒ තැනැත්තාට දී ඇත්තේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, ඒ දීමනාව දෙනු නොලැබුවේ නම්, දීමනාව දෙනු ලැබූ තැනැත්තා යටත් විය හැකි වූ ආදායම් බද්ද සහ ඒ තක්සේරු වර්ෂය සඳහා අය කරනු ලැබූ බදු මුදල අතර වෙනසින් සමන්විත වන අතිරේක තක්සේරුවක්, මේ පනතෙහි කුමක් සඳහන්ව ඇත ද, ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව තක්සේරු දැන්වීමට, අභියාචනයට සහ වෙනත් කටයුතුවලට අදාළ මේ පනතේ විධිවිධාන ඒ අතිරේක තක්සේරුවට අදාළ විය යුතුය." ; තවද

(7) ඒ උපවගන්තියේ (8) වන උපවගන්තියේ ''(ඇ) සහ (ක) ඡේදවල'' යන අකුරු සහ වචන වෙනුවට ''(ඇ), (ක) හෝ (ට)'' යන අකුරු සහ වචන ආදේශ කිරීමෙන් '

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3ආ) උපවගන්තියේ '' යම් තැනැත්තකු විසින් යම් දේපළක් අත්කර ගැනීමෙන් වර්ෂ දෙකකට වැඩි '' වන වචන වෙනුවට '' යම් තැනැත්තකු විසින් යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් නොවන්නා වූ යම් දේපළක් අත්කර ගැනීමෙන් වර්ෂ දෙකකට වැඩි '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3ආ) වගන්තියේ '' කාල පරිච්ඡේදයක් තුළ දී ඒ දේපළෙහි අයිතිය වෙනස්වීම හේතු කොටගෙන '' යන වචන වෙනුවට '' කාල පරිච්ඡේදයක් තුළ දී යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් නොවන්නා වූ ඒ දේපළෙහි අයිතිය වෙනස්වීම හේතුකොට ගෙන '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (3ආ) වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'' (3ආආ) යම් තැනැත්තකු විසින් යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් අත්කර ගැනීමේ දිනයට පසු එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත ඒ කොටසෙහි අයිතිය වෙනස් වීමෙන් උද්ගතවන යම් ප්‍රාග්ධන ලාභයක් ඒ තැනැත්තාගේ බදු අයකළ හැකි ආදායමෙහි ඇතුළත් වන්නා වූ, සහ (මෙහි මින්මතු මේ උපවගන්තියෙහි '' අදල ආදායම් කොටස '' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ආදායමේ කොටස් මත ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට විස්සක් ඉක්මවන්නා වූ අවස්ථාවක, එවිට, ආදායමේ අදළ කොටස් සම්බන්ධයෙන් වූ බද්ද පහත දැක්වෙන පරිදි ආගණනය කළ යුතු ය :—

(අ) ආදායමේ අදළ කොටස ඒ ප්‍රාග්ධන ලාභයේ මුදල ඉක්මවන්නේ නම් —

(i) ඒ ප්‍රාග්ධන ලාභයේ මුදලට සමාන ආදායමේ ඒ කොටස් මත ගෙවියයුතු බද්ද සියයට විස්සක අනුප්‍රමාණය අනුව විය යුතු ය ; තවද

(ii) ආදායමේ අදළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද, මේ පනත යටතේ ඊට අදළ වන පරිදි සියයට දහයට ඉහළ යම් අනුප්‍රමාණයන් අනුව ආගණනය කරනු ලැබිය යුතු ය ; තවද

(ආ) ආදායමේ අදළ කොටස ඒ ප්‍රාග්ධන ලාභයේ මුදල නොඉක්මවන්නේ නම්, ආදායමේ අදළ කොටසේ සියල්ල මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට විස්සක් විය යුතු ය.''.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ—

(අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

" එසේ වුවද නිල ලැයිස්තුගත පොදු සමාගමක්—

(i) 1980 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුනේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා ; සහ

(ii) 1981 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා

(ආ) ඡේදය යටතේ බදු ගෙවීමට යටත් නොවිය යුතුය. තවද "

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ආආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක බදු අයකළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් ලාභ මතද, ඒ ලාභවලින් 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ සමාගම විසින් යම් නිර්වාසික තැනැත්තකුට බෙදා හරිනු ලැබූ දළ ලාභාංශ වල සමස්ත මුදලෙහි සියයට පහළොවකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය " ; තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ—

(i) (ii) වන අනුඡේදයේ (අ) විෂයෙහි " ලාභාංශ ගෙවිය යුතු නම්, ඉන් සියයට පනහකින් ; හෝ " යන වචන වෙනුවට " ලාභාංශ ගෙවිය යුතු නම්, ඉන් සියයට පනහකින් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අනුඡේදයේ (ආ) විෂයයෙහි " 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ; හෝ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) ඒ අනුඡේදයේ (ආ) විෂයයට ඉක්බිතිව ම පහත දැක්වෙන විෂයය එකතු කිරීමෙන් :—

" (ඇ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ලාභාංශ ගෙවිය යුතු නම්, ඉන් සියයට දහතයි දහතෙන් එකොළහකින්".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඉ) ඒ ලාභාංශය 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් ප්‍රකාශයට පත්කරන ලද ලාභාංශයක් වන්නා වූ ; හෝ ".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 37අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය :—

37අ. සෑම වාසික සමාගමක් ම විසින් 1961 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු වාසික නොවන යම් තැනැත්තකුට ගෙවනු ලැබිය යුතු වන යම් ලාභාංශයක් (මින්මතු මෙම වගන්තියේ '' අදාළ ලාභාංශ '' යනුවෙන් සඳහන් කරනු ලබන), යම් ලාභාංශයක සම්පූර්ණ මුදල හෝ කොටසක් යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් බෙද හරිනු ලැබ කෙලින් ම හෝ අතරමැදි සමාගම් එකක් හෝ වැඩි ගණනක් මගින් හෝ යට කී නේවාසික සමාගමට ලැබුනා වූ ද එහෙත් මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් වූ ලාභාංශයක සම්පූර්ණ මුදල හෝ කොටසක් නොවන්නා වූ ද සම්පූර්ණ ලාභාංශයෙන් හෝ එහි කොටසකින් යම් ලාභාංශයක් සමන්විත වන්නේ නම්, ඒ අදළ ලාභාංශයෙන් සියයට පහළොවකට සමාන ආදායම් බද්දක් ඒ නේවාසික සමාගම විසින් ඒ අදළ ලාභාංශයෙන් අඩු කරනු ලැබිය යුතු ය. තවද, මේ වගන්තිය යටතේ අඩු කිරීමට නේවාසික සමාගමකට නියම් කරනු ලබන ආදායම් බදු ප්‍රමාණය ඒ සමාගමෙන් රජයට අයවිය යුතු ණයක් වන අතර, එවැනි ණයක් වශයෙන් නොපමාවම අයකර ගනු ලැබිය යුතු ය. නැතහොත් වෙනත් අන්දමකින් ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්දකට අමතරව එය තක්සේරු කොට අයකර ගනු ලැබිය හැකි ය :

එසේ වුවද, අදළ ලාභාංශයේ මුදල මේ වගන්තියේ කාර්ය සඳහා තීරණය කිරීමේ දී යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් වාසික සමාගමක බදු අයකළ හැකි ආදායම ආගණනය කරනු ලබන්නේ යම් ලාභ හෝ ආදායම මතද ඒ ලාභවලින් හෝ ආදායමෙන් බෙද හරිනු ලැබූ ලාභාංශයේ ඒ කොටස ගණන් ගනු නොලැබිය යුතු ය.''.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තියේ '' එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව '' යන වචන සහ ඉලක්කම් වෙනුවට '' එහෙත්, 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ප්‍රකාශයට පත් කරන ලද යම් ලාභාංශයකට, යම් වාසික තැනැත්තකුට '' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි '' සියයට දහ හතෙන් තුනක් '' යන වචන වෙනුවට '' සියයට දහ හතයි දහහතෙන් එකොළහක් '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියෙහි—

(i) ඒ අතුරු වගන්තියේ (ඇ) ඡේදයෙහි ''නිල ලැයිස්තුගත පොදු සමාගමකින්'' යන වචන වෙනුවට, '' නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ; හෝ '' ; සහ

(ii) ඒ අතුරු වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

'' (ඇ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක මුදල.''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි අතුරු වගන්තියේ "හිමිකම් ඇති තැනැත්තකුට අදළ නොවිය යුතු ය" යන වචන වෙනුවට, "හිමිකම් ඇති තැනැත්තකුට අදළ නොවිය යුතු ය ;

එසේ ම තවදුරටත්, මේ වගන්තියේ කාර්ය සඳහා :—

(i) "භාරය" යන්නට, යම් ඒකක භාරයක් ඇතුළත් නොවිය යුතු ය ;

(ii) "භාරකරු" යන්නට, යම් ඒකක භාරයක භාරකරුවා ඇතුළත් නොවිය යුතු ය.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ (4) වන උප වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(5) මේ වගන්තියේ කාර්ය සඳහා "භාරය" යන පදයට යම් ඒකක භාරයක් ඇතුළත් නොවිය යුතු අතර, "භාරකරු" යන පදයට යම් ඒකක භාරයක භාරකරු ඇතුළත් නොවිය යුතු ය."

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය "භාරයක භාරකරු වන්ගේ තත්ත්වයෙන්" යන වචන වෙනුවට, "යම් ඒකක භාරයක් නොවන භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂය සහ අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය "ආආ ඒකක භාර සහ ප්‍රධාන ප්‍රඥප්තියේ 64අ වගන්තිය" වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'ආආ ඒකක භාර

64අ. (1) මේ පනතේ කාර්ය සඳහා සෑම ඒකක භාරයක් සහ සෑම අන්‍යොන්‍ය අරමුදලක් ම ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකාවේ වාසික සමාගම් වලට අදළ මේ පනතේ විධිවිධාන, සෑම ඒකක භාරයක් සහ සෑම අන්‍යොන්‍ය අරමුදලක් සම්බන්ධයෙන් ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක "ඒකකයක්" ඒ සමාගමේ "කොටසක්" ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක ඒකක දරන්නකු ඒ සමාගමේ කොටස්කරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය :

(ඇ) යම් ඒකක භාරයකට හෝ යම් අන්‍යොන්‍ය අරමුදලකට යටත් වූ යම් දේපළකින්, නැතහොත් ඒ ඒකක භාරය හෝ අන්‍යොන්‍ය අරමුදල සඳහා හෝ වෙනුවෙන්, ඒ ඒකක භාරයේ භාරකරු හෝ ඒ අන්‍යොන්‍ය අරමුදලේ රක්ෂක විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ යම් ව්‍යාපාරයකින් ඒ භාරකරුට හෝ රක්ෂකට ව්‍යුත්පන්න වූ හෝ ඒ භාරකරුගේ හෝ රක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පැනනගින හෝ උපචිත වන ලාභ සහ ආදයම් ඒ සමාගමේ ලාභ සහ ආදයම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

" (ආ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක ලාභ සහ ආදායමෙන් කවර වූ හෝ ආකාරයකින් එහි ඒකක දරන්නන් වෙත කරනු ලබන යම් බෙදීමක් ඒ සමාගමේ කොටස්කරුවන් වෙත බෙදා දුන් ලාභාංශයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ඉ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක, යම් ඒකකයක ගෙවා නිමි අගය ඒ සමාගමේ යම් කොටසක ගෙවා නිමි අගය ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් ඒකක භාරයක කළමනාකරුට හෝ භාරකරුට හෝ යම් අන්‍යොන්‍ය අරමුදලක කළමනාකරුට හෝ රක්ෂකට ඒ ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ අරමුදල්වලින් පාරිශ්‍රමික වශයෙන් පරිහරණය කරන ලද හෝ ගෙවන ලද යම් මුදලක්, 23 වන වගන්තියේ කාර්ය සඳහා සමාගමේ ආදායම නිෂ්පාදනය කිරීමේ දී ඒ සමාගම විසින් දරන ලද වියදම් ලෙස සලකනු ලැබිය යුතු ය.'

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි " ගෙවිය යුතු ය." යන වචන වෙනුවට, " සහ 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී යම් සමාගමක් විසින් බෙදා හරිනු ලැබූ ලාභාංශ සම්බන්ධයෙන් 37අ වගන්තිය යටතේ ගෙවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ " භාරයක " යන වචනය වෙනුවට " යම් ඒකක භාරයක් නොවන භාරයක " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) " වෙළෙඳ අගය " යන අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

" අන්‍යොන්‍ය අරමුදල " යන්නෙන්, සුරැකුම්පත් සභාව විසින් අන්‍යොන්‍ය අරමුදලක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද යම් අන්‍යොන්‍ය අරමුදලක් අදහස් වේ.

(2) " නිල ලැයිස්තුගත පොදු සමාගම " යන අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

" නිල ලැයිස්තුගත පොදු සමාගම " යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් අදහස් වන අතර, එය, 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට අදාළව ඒ තක්සේරු වර්ෂය තුළ කොටස් නිල ලැයිස්තුගත කෙරුණු සමාගමක් බවට හෝ ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම එම සමාගම සංස්ථාගත කරනු ලැබ ඇති අවස්ථාවක, සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ තක්සේරු වර්ෂයේ අවසානය දක්වා සුරැකුම් පත් සභාව විසින් බලයක් දෙන ලද යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරන ලද යම් නිල ලැයිස්තුවක ලැයිස්තුගත කෙරුණු බවට හෝ තක්සේරුකරු සෑහීමට පත් වන්නා වූ සමාගමක් අදහස් කෙරෙයි.

(3) " වාසික " හෝ " ශ්‍රී ලංකාවේ වාසික " යන අර්ථ කථනයට ඉක්බිතිවම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

" සුරැකුම්පත් සභාව " යන්නෙන්, 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනත මගින් පිහිටුවන ලද සුරැකුම්පත් සභාව අදහස් වේ ;

(4) '' භාරකරු '' යන අර්ථ කථනයෙහි '' වෙනත් තැනැත්තෙක් ඇතුළත් වන නමුත් '' යන වචන වෙනුවට,

'' වෙනත් තැනැත්තකු ද, යම් ඒකක භාරයක් ඇති කරන සාධන පත්‍රය ඒ ඒකක භාරයේ භාරකරු වශයෙන් පත් කරන ලද තැනැත්තා ද ඇතුළත් වන නමුත් '' යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(5) '' භාරකරු '' යන අර්ථ කථනයට ඉක්බිතිවම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'' ඒකක භාරය '' යන්නෙන්, සුරකුම්පත් සභාව විසින් ඒකක භාරයක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද යම් ඒකක භාරයක් අදහස් වේ ;''.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ V වන කොටසේ '' 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන '' යන වචන සහ ඉලක්කම් වෙනුවට , '' 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එසෙත්, 1990 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන '' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ V වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස් ඇතුළත් කිරීමෙන් :—

' V අ කොටස

1991 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට අදාළ නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ ද 1992 මාර්තු මස 31 වන දිනට—

(i) එම සමාගමේ කොටස් ලේඛනයේ කොටස්කරුවන් වශයෙන් ලියාපදිංචි කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාව දෙසීයය ඉක්මවන්නා වූ ' සහ

(ii) ඒ දිනට, ඒ සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධන එකතුවේ සියයට හැටකට වැඩියෙන් කෙළින් ම හෝ යම් නාමිකයකු මගින් එක්ව දරන්නා වූ කවර හෝ තැනැත්තන් පස් දෙනකු නොමැති

බවට තක්සේරුකරු සෑහීමට පත්වන යම් සමාගමක්.

පිළිවෙලින් 1990 අප්‍රේල් මස 1 වන දින සහ 1991 අප්‍රේල් මස 1 වන දින ආරම්භ මන තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායම මත......සියයට 40 :

එසේ වුව ද, එම සමාගම, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන යටතේ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ යම් ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් පිහිටුවන ලද සමාගමක් වන අවස්ථාවක, එම සමාගමට අදාළ මේ කොටසේ විධිවිධාන (ii) වන විෂය අංකයෙහි '' සියයට හැටකට '' යන වචනවලට යොමුව '' සියයට හැට පහකට'' යන වචන ආදේශ කරනු ලැබූ ලෙස අදාළ කරනු ලැබිය යුතු ය.

මේ කොටසේ කාර්ය සඳහා (i) වන විෂයෙහි හෝ (ii) වන විෂයෙහි සඳහන් යම් තැනැත්තකු—

(අ) යම් පුද්ගලයකු වන අවස්ථාවක, කෙළින්ම හෝ යම් නාමිතයකු මගින් ඒ පුද්ගලයා හෝ ඔහුගේ හෝ ඇගේ කලත්‍රයා හෝ (ඒ දින වන විට දරුවකු නොවන යම් පුතකු හෝ දුවක හැර) දරුවන් විසින් දරනු ලබන ඒ සමාගමේ යම් කොටසක්, ඒ පුද්ගලයා විසින් දරනු ලැබූ ලෙස සැලකිය යුතු ය ;

(ආ) යම් පාලක සමාගමක යම් පාලිත සමාගමක්, එම පාලිත සමාගම විසින් දරනු ලැබූ ඒ සමාගමේ යම් කොටසක්, එම පාලක සමාගම විසින් දරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

" පාලක සමාගම " සහ " පාලිත සමාගම " යන යෙදුම්වල 1982 අංක 17 දරන සමාගම් පනතේ 150 වන වගන්තියෙහි ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන් ම ඇත්තේ ය.

V ආ කොටස

1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයකට අදාළ නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ ද ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයේ දී—

(i) එම සමාගමේ කොටස් ලේඛනයේ කොටස්කරුවන් වශයෙන් ලියාපදිංචි කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාව දෙසීයය ඉක්මවන්නා වූ ; සහ

(ii) ඒ දිනට, ඒ සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධන එකතුවේ සියයට හැටකට වැඩියෙන් කෙළින්ම හෝ යම් නාමිතයෙකු මගින් එක්ව දරන්නාවූ කවර හෝ තැනැත්තන් පස් දෙනකු එක්ව් නොමැති

බවට තක්සේරුකරු සෑහීමට පත්වන යම් සමාගමක්.

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායම මත . . . . . සියයට 40.

එසේ වුවද, එම සමාගම 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන යටතේ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ යම් ආණ්ඩුවට අයත් ව්‍යාපාර සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් පිහිටුවන ලද සමාගමක් වන අවස්ථාවක, එම සමාගමට අදාළ මේ කොටසේ විධිවිධාන (ii) වන විෂය අංකයෙහි "සියයට හැටකට" යන වචනවලට යොමුව "සියයට හැට පහකට" යන වචන ආදේශ කරනු ලැබූ ලෙස අදළ කරනු ලැබිය යුතු ය.

මේ කොටසේ කාර්ය සඳහා (i) වන විෂයෙහි හෝ (ii) වන විෂයෙහි සඳහන් යම් තැනැත්තකු—

(අ) යම් පුද්ගලයකු වන අවස්ථාවක, කෙළින්ම හෝ යම් නාමිතයකු මගින් ඒ පුද්ගලයා හෝ ඔහුගේ හෝ ඇගේ කලත්‍රයා හෝ (ඒ දින වනවිට දරුවකු නොවන යම් පුතකු හෝ දුවක හැර) දරුවන් විසින් දරනු ලබන ඒ සමාගමේ යම් කොටසක්, ඒ පුද්ගලයා විසින් දරනු ලැබූ ලෙස සැලකිය යුතු ය ;

(ආ) යම් පාලක සමාගමක යම් පාලිත සමාගමක්, එම පාලිත සමාගම විසින් දරනු ලැබූ ඒ සමාගමේ යම් කොටසක්, එම පාලක සමාගම විසින් දරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

"පාලක සමාගම" සහ "පාලිත සමාගම" යන යෙදුම්වල 1982 අංක 17 දරන සමාගම් පනතේ 150 වන වගන්තියෙහි ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය.

(3) "VIIIඅ කොටස" "රාජ්‍ය සංස්ථා" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "IX වන කොටස රාජ්‍ය සංස්ථා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(4) ඒ උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

" X වන කොටස

ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල

1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනු ප්‍රමාණය.

ඒකක භාරයේ හෝ අන්‍යෝන්‍ය අරමුදලේ බදු අය කළ හැකි ආදායම......සියයට 50".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ සත්වන උපලේඛනයෙහි (iii) වන විෂයෙහි "කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරන ලද" යන වචන වෙනුවට, " (කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26.** (1) මේ පනතේ 2(3) වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9(1) වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 11 (2) (i) වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31(2) (ආ) වගන්තියට කරන ලද සංශෝධනය 1980 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 13(2) වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33(2) වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 ජූනි මස 12 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ 16(2) (අ) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38(3) වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 ජූනි මස 12 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1990 අංක 43 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 43 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ඇ) ඡේදයේ ''රක්ෂණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් ලබා ගන්නා ලද හෝ ලබාගත හැකි, වාර මුදල් හැර මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ'' යන වචන වෙනුවට ''රක්ෂණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,—

(i) ජීවිත රක්ෂණය ; සහ

(ii) වැඩ වර්ජනයකින්, කැරැල්ලකින්, මහජන කැළඹීමකින් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවලින් සිදු වූ අලාභවලට හෝ විනාශයට ප්‍රතිපක්ෂව වැඩ වර්ජනය, කැරැල්ල සහ මහජන කැළඹීම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් ආණ්ඩුවේ අරමුදලට ගෙවන ලද රක්ෂණය

සම්බන්ධයෙන් ලබා ගන්නා ලද හෝ ලබා ගත හැකි වාර මුදල් හැර, මුළු මුදල් ප්‍රමාණය ඇතුළත් වේ ; තව ද

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ ''එසේ නමුත් ඒ බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකය පවත්වා ගෙන යාමට අදාළ කළ හැකි ලැබීම් ඊට ඇතුළත් නොවිය යුතු ය.'' යන වචන වෙනුවට ''එසේ නමුත්—

(i) ඒ බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකය පවත්වාගෙන යාමට ; සහ

(ii) වෙනත් යම් බැංකුවක් සමග 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ බැංකුව ඇතුළත් වන යම් ගනුදෙනුවකට

ආරෝපණය කරනු ලැබිය හැකි ලැබීම් ඊට ඇතුළත් නොවිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

''(5) භාණ්ඩ සැදීමේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා වූ පිරිවැටුම නිශ්චය කිරීමේ දී ඒ ව්‍යාපාරය කරගෙන යන තැනැත්තා විසින් ඒ භාණ්ඩය සම්බන්ධයෙන්, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවනු ලැබූ යම් තීරු බදු ගාස්තුවකට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද යම් කාර්තුවක් සඳහා එසේ අඩු කරනු ලැබිය යුතු මුදල භාණ්ඩ සෑදීමේ ඒ ව්‍යාපාරය කරගෙන යන අතරතුර යම් භාණ්ඩයක් විකිණී-මෙන් ඒ කාර්තුව සඳහා ලැබුණ හෝ ලැබිය යුතු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුවට ගෙනයා යුතු අතර, එම ඉදිරි කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම් නිශ්චය කිරීමේ දී අඩු කරනු ලැබිය යුතු ය. තව ද යම් ශේෂයක් වෙතොත්, ඉහත කී ආකාරයෙන් ඉදිරියට ගෙන ගොස් අඩු කරනු ලැබිය යුතු ය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

47. යම් කාර්තුවක් තුළ ඇතුළත් වූ යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් යම් ලියාපදිංචි සාදන්නකු විසින් ඔහුගේ භාණ්ඩ සෑදීමේ ව්‍යාපාරයේදී පාවිච්චි කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දක් ඇතුළත් වන යම් මුදලක් වෙනත් ලියාපදිංචි සාදන්නකුට ගෙවා ඇති අවස්ථාවක, එසේ ඇතුළත් කරනු ලැබූ පිරිවැටුම් බද්ද පළමු සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතුවන යම් පිරිවැටුම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) (i) ඒ ව්‍යාපාරයේ දී පාවිච්චි කරනු ලැබූ යම් පිරියතක්, යන්ත්‍රෝප-කරණයක්, තිරවුරු, ගොඩනැගිලි හෝ වෙනත් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ;

(ii) නිදහස් කළ භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් කාර්තුවක් සඳහා ;

(iii) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ;

(iv) ඒ මුදල ලැබුවා වූ දෙවනුව සඳහන් ලියාපදිංචි සාදන්නාගෙන් පළමුව සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් 46 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි, වවුචරයක් ලබාගෙන ඇත්නම් මිස

එසේ ගෙවන ලද යම් මුදලක ඇතුළත් කරනු ලැබූ පිරිවැටුම් බද්දක් සඳහා කිසිම අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(ආ) ලියාපදිංචි සාදන්නකු වශයෙන් තමාගේ ලියාපදිංචියට පෙරාතුව යම් තැනැත්තකු විසින් එසේ ගෙවන ලද යම් මුදලක ඇතුළත් කරනු ලැබූ යම් පිරිවැටුම් බද්දක්, ඔහු විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද අය කර ගනු ලැබීමට ඔහු යටත් වන්නා වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩු කර ගැනීමක් වශයෙන් ඉඩ දෙනු ලැබිය යුතු ය ; තව ද

(ඇ) (i) 1989 මාර්තු 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාර්තුවක් සඳහා වූ අඩු කර ගැනීමේ මුදල, ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා පළමුව සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එහෙත් ඒ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්, අඩු කර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කර ගනු ලැබිය යුතු අතර ඉන්පසුව ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත් ඊලඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ ශේෂය අඩු කර ගනු ලැබිය යුතු ය ; තව ද

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාර්තුවක් සඳහා වූ අඩු කර ගැනීමේ මුදල, ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා පළමු සඳහන් ලියාපදිංචි සාදන්නා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන අවස්ථාවක, ඒ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් අඩු කර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කර ගනු ලැබිය යුතු අතර, අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත්, ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා වූ ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ඒ ඒ ශේෂය අඩු කර ගනු ලැබිය යුතු ය. ඒ අතිරික්තය උද්ගත වූ කාර්තුවේ සිට ගණන් බලනු ලැබූ හතරවෙන කාර්තුව සඳහා ඔහු විසින් ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කර ගනු ලැබිය නොහැකි ඒ අතිරික්තයෙන් වූ යම් ශේෂයක්, 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආපසු ගෙවනු ලැබිය යුතු ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

48. භාණ්ඩ සෑදීමේ තම ව්‍යාපාරයේ දී යම් ලියා පදිංචි සාදන්නකු විසින් පාවිච්චි කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන්, යම් කාර්තුවක් තුළ, පිරිවැටුම් බද්දක් ඒ සාදන්නා විසින් 12 වන වගන්තිය යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයාට ගෙවා ඇති අවස්ථාවක, ඒ පිරිවැටුම් බද්ද, ඔහු විසින් සාදන ලද භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන පිරිවැටුම සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) (i) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, තිරවුරු, වාහන, ගොඩනැගිලි හෝ වෙනත් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ;

(ii) නිදහස් කරන ලද භාණ්ඩ සැදීමේ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරන ලද යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 1989 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා ;

(iii) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ; සහ

(iv) එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් ලියා පදිංචි සාදන්නා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් වවුචරයක් ලබා ගෙන ඇත්නම් මිස

එසේ ගෙවන ලද යම් පිරිවැටුම් බද්දක් සඳහා කිසිම අඩු කිරීමක් කරනු නො ලැබිය යුතු ය ; සහ

(ආ) (i) 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් කාර්තුවක් සඳහා අඩු කරන මුදල ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්මවන්නා වූ අවස්ථාවක, ඒ අතිරික්තය ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එහෙත් ඒ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ ඒ පිරිවැටුම් බද්දෙන් අඩුකර ගනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ අතිරික්තය අඩු කරගනු ලැබිය යුතු අතර, ඉන් පසු ද ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත්, ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් ඒ ශේෂය අඩු කරගනු ලැබිය යුතු ය ; තව ද,

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාර්තුවක් සඳහා අඩු කරන මුදල ඒ පිරිවැටුම සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු මුදල ඉක්ම වන්නා වූ අවස්ථාවක, ඒ අතිරික්තය ඒ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරගනු ලැබිය යුතු අතර, ඉන් පසු ද ඒ අතිරික්තයෙන් යම් ශේෂයක් වෙතොත් ඒ ශේෂය ඊළඟට එළඹෙන කාර්තුව යනාදී වශයෙන් වූ කාර්තු සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩුකර ගනු ලැබිය යුතු ය. ඒ අතිරික්තය උද්ගත වූයේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුවේ සිට ගණන් බලනු ලැබූ හතරවන කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්දෙන් අඩු කරනු ලැබිය නොහැකි ඒ අතිරික්තයේ යම් ශේෂයක් 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආපසු ගෙවනු ලැබිය යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (4අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ''කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට ''කොමසාරිස් ජනරාල් වරයා විසින් ඒ සැපයුම්කරුව ගෙවනු ලැබිය යුතු ය:'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

''එසේ වුව ද ඉහත කී ආකාරයෙන් ණයවර ලිපියක් මගින් ඒ සැපයුම ආවරණය කිරීම අවස්ථානුකූල නොවන බව හෝ කළ නොහැකි බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස ඔප්පු කරනු ලබන අවස්ථාවක, සැපයුම්කරු විසින් ගෙවන ලද පිරිවැටුම් බද්දෙහි ඒ භාණ්ඩ සෑදීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී පාවිච්චි කරනු ලැබූ අමු ද්‍රව්‍යවලට ආරෝපණය කරනු ලැබිය හැකි වන්නා වූ මුදල් ප්‍රමාණය,—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුවකින් විවෘත කරන ලද ණයවර ලිපියක් මගින් හෝ ඒ සැපයුමට අදාළ අපනයනයන් ඇත්ත වශයෙන් ම කළ බවට තමා සෑහීමට පත්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කෙරෙන වෙනත් යම් ලේඛනගත සාක්ෂි මගින් ඒ සැපයුම ආවරණය කරනු ලැබ ඇත්නම්; සහ

(ආ) ඒ සැපයුමට අදළ අපනයනවල වටිනාකම සඳහා වන විදේශ විනිමය ගෙවීම ලැබූ බව, එම විදේශ විනිමය ප්‍රේෂණය කරනු ලැබුවේ යම් බැංකුවකට ද ඒ බැංකුව විසින් සහතික කරනු ලැබ ඇත්නම්

කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැපයුම්කරුට ගෙවිය යුතු ය.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (iii) වන ඡේදයේ ''සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක් ; හෝ'' යන වචන වෙනුවට ''සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (iv) වන ඡේදයේ ''සඳහා වූ යම් ගිවිසුමක්'' යන වචන වෙනුවට ''සඳහා වූ යම් ගිවිසුමක් ; හෝ'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) (iv) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්—

''(v) නිෂ්පාදකයකු විසින් සිනමා චිත්‍රපට සැපයුම සඳහා වූ යම් ගිවිසුමක්'' යන වචන එකතු කිරීමෙන් ;''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ ''බලය ලත් නියෝජිතයා'' යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''බැංකුව'' යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර නිකුත් කරනු ලැබූ වාණිජ බැංකුවක් අදහස් වේ ;''.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

# 1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 6 වන දින]

**තමා සන්තකයේ යම් විශේෂිත තැන්පත් සහතිකයක් ඇති යම් තැනැත්තකුට බදු සහන සැලසීම සඳහා ද එවැනි සහතික මිලට ගන්නා ලද්දේ යම් ලාභවලින් හෝ ආදායම් වලින් ද ඒ ලාභ හෝ ආදායම් නියෝජනය කෙරෙන මුදල් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විශේෂ ගිණුම්වල තැන්පත් කිරීමට හැකි කරවනු සඳහා ද ඒ විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් මත බද්දක් පනවා අයකර ගැනීම සඳහා ද ඒ ගිණුම්වල මුදල් තැන්පත් කරනු ලබන තැනැත්තන් ඒ ලාභ හෝ ආදායම්වලට අදාළ වරදවල් සඳහා නඩු පවරනු ලැබීමේ වගකීමෙන් නිදහස් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) මේ පනත, යම් තැනැත්තකු සන්තකයේ යම් විශේෂිත තැන්පතු සහතිකයක් තිබෙන සහ—

(අ) ඔහුගේ අදාළ සම්පූර්ණ ලාභවලින් හෝ ආදායමෙන් හෝ ඒ ලාභවල හෝ ආදායමේ යම් කොටසකින් ඒ තැන්පතු සහතිකය මිලට ගෙන තිබෙන බව කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් සොයා ගනු ලැබ ඇති අවස්ථාවක, හෝ

(ආ) 1989 මාර්තු මස 31 වන දින හෝ ඊට ප්‍රථම ඒ තැනැත්තාට උද්ගත වූ හෝ උපචිත වූ ලාභ හෝ ආදායම් හෝ පිරිවැටුම් සම්බන්ධයෙන් ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීම පිණිස තත්කාලයේ අදාළ වන නීතියේ විධිවිධාන යටතේ ගෙවිය යුතු යම් බද්දක් හෝ 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පිළිබඳව කරන ලදැයි කියනු ලබන හෝ සැකකරනු ලබන පැහැරහැරීමක් පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් ආරම්භ කිරීමට පෙර, ඔහු විසින් ඒ තැන්පතු සහතික මිලට ගන්නා ලද්දේ ඔහුගේ සම්පූර්ණ අදාළ ලාභ සහ ආදායම හෝ එහි යම් කොටසක් නියෝජනය කෙරෙන මුදල්වලින් බව කොමසාරිස් ජනරාල්වරයාට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට සිය කැමැත්තෙන්ම අනාවරණය කළ අවස්ථාවක

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සෑම තැනැත්තකුම මේ පනතේ මෙහි මින්මතු "මේ පනත අදාළ වන තැනැත්තා" යනුවෙන් ද ඒ උපවගන්තියේ සඳහන් කරන ලද සෑම විශේෂිත තැන්පතු සහතිකයක්ම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන විශේෂිත තැන්පතු සහතිකය" යනුවෙන් ද සඳහන් කරනු ලැබිය යුතු ය.

**3.** (1) මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින්, මේ පනත අදාළ වන යම් විශේෂිත තැන්පතු සහතිකයක් බැංකුවට විකුණනු ලැබිය හැකි අතර, ඒ විකිණීමෙන් ලත් සම්පූර්ණ මුදල බැංකුවෙහි තත් කාර්ය සඳහා ඔහු විසින් විවෘත කිරීමට යෙදෙන විශේෂ ගිණුමක ඔහුගේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) ඒ තැන්පතු සහතිකය මේ පනත අදාළ වන තැන්පතු සහතිකයක් බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කරන්නේ නම්, මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් බැංකුවට විකිණීමට පිරිනමන මේ පනත අදාළ වන යම් විශේෂිත තැන්පතු සහතිකයක් බැංකුව විසින් නිගමනය කරනු ලබන මිලකට මිලට ගැනීම බැංකුවේ කාර්ය වන්නේය.

**4.** (1) 3 වන වගන්තියේ විධිවිධාන අනුව, යම් තැන්පතුවක් කරන සෑම තැනැත්තකු විසින්ම—

(අ) මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් බැංකුව වෙත ප්‍රකාශයක් කළ යුතුය ;

(ආ) 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැංකුවට විකිණීමට යෙදී ඇති මේ පනත අදාළ වන විශේෂිත තැන්පතු සහතිකයේ ප්‍රකාශන අගයෙන් සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයක බද්දක් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට යටත් විය යුතුය ; තවද

(ඇ) ඒ විශේෂිත තැන්පතු සහතිකය සම්බන්ධයෙන් 1982 අංක 43 දරන මුද්දර බදු පනතේ විධිවිධාන යටතේ ඔහු විසින් ගෙවන ලද යම් මුද්දර බද්දක මුදල (ආ) ඡේදය යටතේ ගෙවනු ලබන බද්දෙන් අඩු කරගැනීමට අයිතිය ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අඩුකරගත හැකි යම් මුදලක් අඩු කිරීමෙන් පසු ඒ වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ තැනැත්තා විසින්, 3 වන වගන්තියේ සඳහන් කරන ලද විශේෂ ගිණුම විවෘත කිරීමේ දිනයේ සිට දින දහහතරක් ඇතුළත දී, ඒ ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදල්වලින්, බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතුය.

(3) 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල්වලින් (2) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් කොමසාරිස් ජනරාල් වරයාට බද්ද ගෙවීම, ඒ තැනැත්තා විසින් බලය දුන් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**5.** වෙනත් ලිඛිත නීතියක, කුමක් සඳහන් වුවද, 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක මුදලක් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් ඒ විශේෂ ගිණුම විවෘත කරන ලද දිනයේ සිට ගණන් ගනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් අවසාන වීමට ප්‍රථමයෙන් 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවීමෙන් පසු ඒ විශේෂ ගිණුමේ ඔහුගේ බැරට පවතින ඉතිරි සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක් ආපසු ගැනීමට බැංකුව විසින් අවසර නොදිය යුතුය :

එසේ වුවද, ඒ තැනැත්තාට—

(අ) බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ඉහත කී අවුරුදු දෙකක කාලසීමාව අවසන් වීමට ප්‍රථම, ඒ ශේෂ මුදලට එකතුවන මුළු පොලිය හෝ එහි යම් කොටසක් ආපසු ගැනීමට අවසර දිය යුතුය ;

(ආ) බැංකුව වෙත යවනු ලබන ලිඛිත සංදේශයක් මගින්, 1989 මාර්තු 31 වන දිනෙන් හෝ එදිනට ප්‍රථමයෙන් වූ යම් කාලයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවා ඇති යම් බද්දක් හෝ ඒ මත වූ යම් දණ්ඩනයක් ඉටු කිරීම සඳහා ඒ මුළු ශේෂ මුදල හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කිරීමට ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

**6.** 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවීමෙන් පසු 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට පවතින ශේෂ මුදල මත, ඉතිරි කිරීමේ ගිණුම්වල බැරට ඇති මුදල් සඳහා බැංකුව විසින් ගෙවනු ලබන තත්කාලයේ බලපවත්නා පොලී අනුප්‍රමාණයට අනුව පොලිය ගෙවිය යුතු ය.

**7.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරනු ලැබ ඇති මුදල් මත, 5 වන වගන්තියේ සඳහන් කරන ලද අවුරුදු දෙකක කාලසීමාව තුළ උපචිත වන්නා වූ පොලිය ආදායම් බද්දෙන් නිදහස් කළ යුතු ය.

**8.** 4 වන වගන්තියේ සඳහන් කරන ලද බද්ද ගෙවූ ලෙස සලකනු ලබන මේ පනත අදාළ වන යම් තැනැත්තකු—

(අ) (i) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි යම් විශේෂ ගිණුමක ඔහු විසින් තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදල් නියෝජනය කෙරෙන ඔහුගේ අදාළ ලාභවල හෝ ආදායමේ කොටස වෙනුවෙන් වූ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ පැනවීමට අදාළ වන තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දක් හෝ ආදායම් බද්ද මත අධිභාරයක් ; හෝ

(ii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි ඒ තැනැත්තා විසින් එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදලෙන් නියෝජනය වන ඔහුගේ අදාළ ලාභයේ හෝ ආදායමේ කොටස උපයෝගී කරගනු ලැබුවේ ඔහුගේ ශුද්ධ ධනයෙන් යම් කොටසක් අත්කර ගැනීම සඳහාද ඒ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් වූ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වන තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ධන බද්දක් හෝ ධන බද්ධ මත අධිභාරයක් ; හෝ

(iii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි ඒ තැනැත්තා විසින් එවැනි යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද විශේෂිත තැන්පතු සහතික විකිණීමෙන් ලත් මුදල්වලින් නියෝජනය කෙරෙන ඔහුගේ අදාළ ලාභවල හෝ ආදායමේ ඒ කොටස උද්ගතවූයේ හෝ ව්‍යුත්පන්නවූයේ කවර පිරිවැටුමකින්ද ඒ පිරිවැටුම් ඒ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 60 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවියයුතු යම් පිරිවැටුම් බද්දක්

ගෙවීමට යටත් නොවිය යුතුය ; නැතහොත්

(ආ) (i) (අ) (i) ඡේදයේ සඳහන් කරන ලද ඔහුගේ අදාළ ලාභවල සහ ආදායමේ ඒ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් නැතහොත් (අ) (ii) ඡේදයේ සඳහන් කරන ලද ඔහුගේ ශුද්ධ ධනයේ ඒ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයේ අදාළ වන නීතිය යටතේ වූ ; හෝ

(ii) 1989 මාර්තු 31 වන දිනෙන් හෝ ඊට ප්‍රථමයෙන් අවසන් වන යම් කාර්තුවකට අදාළව, (අ) (iii) ඡේදයේ සඳහන් කරන ලද පිරිවැටුමේ ඒ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ වූ හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ වූ

යම් වරදකට නඩු පවරනු ලැබීමට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය.

**9.** මේ පනතේ කලින් සඳහන් කළ විධිවිධාන කිසිවකින්, එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මක හා තීරණාත්මකව ඇති—

(අ) (i) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළවන්නා වූ තත් කාලයේ පවත්නා නීතියේ විධිවිධාන යටතේ ; හෝ

(ii) 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ විධිවිධාන යටතේ

කරන ලද යම් තක්සේරුවක් ; හෝ

(ආ) වෙනත් යම් කරුණක්,

ප්‍රතිශෝධනය කිරීමට බලය දී ඇති ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

**10.** (1) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ සෑම නිලධරයෙකු හෝ සේවා නියුක්තයකුම විසින් මේ පනත ක්‍රියාත්මක කිරීමේදී තමාට දැනගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතු ය :

එසේ වුවද, බැංකුවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් මේ පනතේ විධිවිධාන ඉටු කිරීමේ කාර්යය සඳහා, 3 වන වගන්තියේ සඳහන් කරන ලද පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමකට අදළ වූ පහත දක්වෙන විස්තර කොමසාරිස් ජනරාල්වරයාට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට සංදේශනය කරනු ලැබිය හැකිය :—

(අ) ගිණුම හිමිකරුගේ නම සහ ආදායම් බදු ලිපිගොනු අංකය ;

(ආ) ව්‍යාපාරයක් ඇත්නම් ඒ ව්‍යාපාරයේ නාමය සහ ආදායම් බදු ලිපිගොනු අංකය ;

(ඇ) මුදල් තැන්පත් කළ හෝ ආපසු ගත් දිනය ;

(ඈ) තැන්පත් කළ හෝ ආපසු ගත් මුදල ;

(ඉ) ඒ විශේෂ ගිණුමට අදාළව, 4 (1) (අ) වගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශයක සඳහන් කරන ලද පරිදි එවැනි වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වූ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

**11.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

" බැංකුව " යන්නෙන් 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකුව පනතින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ ;

" කොමසාරිස් ජනරාල්වරයා ", " ලාභ ", " ආදායම් ", " ධනය " සහ " තක්සේරු වර්ෂය " යන යෙදුම්වල 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා පිළිවෙළින් දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" තැනැත්තා " යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් ඇතුලත් වේ.

" අදාළ ලාභ හෝ ආදායම් " යන්නෙන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට—

(අ) ඔහුට ව්‍යුත්පන්න වූ හෝ 1989 මාර්තු 31 වන දිනට හෝ ඊට ප්‍රථම ඔහුගේ යහපත පිණිස උද්ගත වූ හෝ උපචිත වූ යම් ලාභ හෝ ආදායම් ද ;

(ආ) ඒ වෙනුවෙන් ඔහු විසින් වාර්තාවක් සපයා නැත්තාවූ හෝ ආදායම් බද්ද පැනවීමට අදළ වූ තත්කාලයේ පවත්නා නීතිය යටතේ ඔහු විසින් සපයන් ලද යම් වාර්තාවක එළිදරව් කර නොමැත්තා වූ යම් ලාභ හෝ ආදායම් ද ;

(ඇ) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ පැනවීමට අදළ වූ තත්කාලයේ පවතින නීතිය යටතේ ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ අය කරගත යුතු වන්නේ කවර ලාභ හෝ ආදායම් මත ද එවැනි යම් ලාභ හෝ ආදායම් ද

අදහස් වේ ;

" විශේෂිත තැන්පතු සහතිකය " යන්නෙන්—

(අ) 1989 අංක 9 දරන භාණ්ඩාගාර තැන්පතු සහතික පනත යටතේ ; සහ

(ආ) 1990 ජූනි 20 වන දින හෝ ඊට පසුව, එහෙත් 1991 ජනවාරි 1 වන දිනට පෙරාතුව

නිකුත් කරන ලද යම් තැන්පතු සහතිකයක් අදහස් වේ.

" ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට අදළ වූ තත් කාලයේ පවතින නීතිය " යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාරය පනත, 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාරය පනත සහ 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාරය පනත අදහස් වේ ;

"ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට අදාළ වූ තත්කාලයේ පවතින නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 25 දරන ධන බදු අධිභාරය පනත සහ 1989 අංක 8 දරන ධන බදු අධිභාරය පනත අදහස් වේ.

12. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

4(1) අ වගන්තිය

1990 අංක 45 දරන විශේෂිත තැන්පතු සහතික (බදු සහ වෙනත් සහන) පනත
4 (1) (අ) වගන්තිය යටතේ ප්‍රකාශය.

ආදායම් බදු ලිපිගොනු අංකය ඇතොත් :......
විශේෂ ගිණුම් අංකය :.......
ඇත්නම් ව්‍යාපාරයේ නාමය :.......
දිනය :......

............පදිංචි ........
............මයා/මිය/මෙනවිය/වන මම/අපි—

ඔබගෙන් පහත දැක්වෙන පරිදි ඉල්ලා සිටිමි/සිටිමු :—

(1) (අ) ........ප්‍රකාර........
පදිංචි ............ගේ නමින් වූ විශේෂ ගිණුමක තැන්පත් කිරීම සඳහා රුපියල්........(රු.......) මුදලක් භාර ගන්නා ලෙස :

(ආ) මෙම මුදල මත අයවිය යුතු රුපියල්........(රු.......) ක්වූ බද්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත කෙළින්ම ප්‍රේෂණය කරන ලෙස ;

(ඇ) ඒ ගිණුමේ ශේෂය පහත දක්වෙන පරිදි දුරීමට—

| | |
|---|---|
| තැන්පත් කළ මුළු මුදල | රු......... |
| අඩුකළා අඩුකර ගත යුතු 10% බද්ද | රු......... |
| අඩුකළා ගෙවූ මුද්දර බද්ද | රු......... |
| | රු......... |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විශේෂ ගිණුමේ දුරිය යුතු | රු......... |

(2) මෙදින සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත්වන තෙක් මෙම ශේෂ මුදලින් යම් කොටසක් ආපසු නොගැනීමට පොරොන්දු වෙමි/වෙමු.

(3) මගේ/අපගේ විශේෂ පාස් පොත ඔබ බැංකුවේ ආරක්ෂක භාරකාරත්වයේ තබාගැනීමට එකඟ වෙමි/වෙමු.

(4) ඔබ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුම්වලට අදාළ තත්කාලයේ පවත්නා සහ කලින් කල ක්‍රියාත්මක විය හැකි රීතිවලින් බැඳී සිටීමට ද තවදුරටත් එකඟ වෙමි/වෙමු.

(5) මම/අපි විසින් ඒ සඳහා ලියවිල්ලකින් ඉල්ලීමක් කිරීමෙන් පසු මෙම ශේෂ මුදලේ මුළු මුදල හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඔබට මෙයින් බලය පවරමි/පවරමු.

..............
තැන්පත්කරුගේ අත්සන.

මා ඉදිරියේ අත්සන් කරන ලදී.

ශාඛා කළමනාකරුගේ අත්සන.

## 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 6 වන දින]

**සාමාන්‍යයෙන් කර්මාන්ත සහ විශේෂයෙන් අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම් අධෝව්‍යුහ සහ සුදුසු පරිසරයක් ඇති කිරීමේ අරමුණ ඇතිව කාර්මිකකරණය පිළිබඳ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම, කර්මාන්ත පිළිබඳ උපදේශක සභාවක් පිහිටුවීම, ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු ඇති කිරීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ පනතේ 24 වන වගන්තිය හැර මේ පනතේ වෙනත් විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය. තවද 24 වන වගන්තිය 1991 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## කර්මාන්ත ව්‍යවසාය ලියාපදිංචි කිරීම

2. (1) නියමිත දිනයේ දී හෝ එදිනට පෙර ආරම්භ කරන ලද කර්මාන්ත ව්‍යවසායක් පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින් ම, නියමිත දින සිට මාස හයක් ඇතුළත එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන වැඩ බිම හෝ ස්ථානය රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පසුව ආරම්භ කරන ලද කර්මාන්ත ව්‍යවසායක් පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින්ම එම කර්මාන්ත ව්‍යවසාය ආරම්භ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන වැඩබිම හෝ ස්ථානය රෙජිස්ට්‍රාර් වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවක් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව ප්‍රාදේශීය ව්‍යවසායකට හෝ බලපත්‍රලත් ව්‍යවසායකට හෝ අදාළ නොවිය යුතු ය.

3. (1) 2 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම, නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම ඉල්ලීමෙහි පහත දැක්වෙන විස්තර එනම්—

(අ) කර්මාන්ත ව්‍යවසායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන වැඩ බිම හෝ ස්ථානය ;

(ඇ) එම කර්මාන්ත ව්‍යවසායේ සාදනු ලබන කර්මාන්ත නිෂ්පාදන ;

(ඈ) එම කර්මාන්ත ව්‍යවසායේ සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව ; සහ

(ඉ) එම කර්මාන්ත ව්‍යවසායේ කාර්යය සඳහා යොදා ගනු ලබන ඉඩමේ, ගොඩනැගිලිවල සහ ව්‍යුහවල පිරිවිතර,

ඇතුළුව නියමිත විස්තර ඇතුළත් විය යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන කර්මාන්තයක් සම්බන්ධයෙන් වන විට, එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන වැඩබිම හෝ ස්ථානය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් සමග, 26 වන වගන්තිය යටතේ එම කර්මාන්ත ව්‍යවසාය සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රය ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**4.** (1) 3 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ලැබුණු විට සහ එම ඉල්ලීමේ සඳහන් කරනු ලැබ ඇති වැඩබිමේ හෝ ස්ථානයේ දී කර්මාන්ත ව්‍යවසායක් පවත්වාගෙන යනු ලබන බවට සෑහීමට පත්වීමේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කර්මාන්ත ව්‍යවසායක් සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී, එම කර්මාන්ත ව්‍යවසායේ අයිතිකරු විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඉ) තෙක් වූ ඡේදවල නිශ්චිතව දැක්වෙන විස්තර මෙන්ම එම වර්ෂය සඳහා එම කර්මාන්ත ව්‍යවසායේ පිරිවැටුම සහ සම්පූර්ණ නිෂ්පාදනය පිළිබඳ විස්තර අඩංගු වාර්ෂික වාර්තාවක් ඊළඟට එළැඹෙන වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දිනට පෙර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**5.** (1) 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් කර්මාන්ත ව්‍යවසායක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී, 2 වන වගන්තියට එකඟව ක්‍රියා කරමින් එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන වැඩබිම හෝ ස්ථානය ලියාපදිංචි කිරීම සඳහා එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යන තැනැත්තාට නියම කරන ආඥාවක් ලබා ගැනීම පිණිස එම කර්මාන්ත ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම ඉල්ලීමක් ම එම මහාධිකරණය අමතන ලද ලිඛිත පෙත්සමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එය සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයෙහි දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

**6.** සහතිකයේ නිශ්චිතව දැක්වෙන වැඩබිමක හෝ ස්ථානයක කර්මාන්ත ව්‍යවසායක් පවත්වාගෙන යනු ලබන බවට සහ මේ පනතේ මේ කොටස යටතේ එම වැඩබිම හෝ ස්ථානය ලියාපදිංචි කරනු ලැබ නොමැති බවට රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් 5 වන වගන්තිය යටතේ පවරන ලද යම් නඩු කටයුතුවල දී සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර එම සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

## II වන කොටස

## කාර්මිකකරණය පිළිබඳ කොමිෂන් සභාව

**7.** (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්මිකකරණය පිළිබඳ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

**8.** (1) කොමිෂන් සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඈ) වෙළෙඳ හා වාණිජ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) ජේෂ කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඊ) කුඩා කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(උ) කෘෂිකර්ම හා පශු සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ;

(එ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා ;

(ඒ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා ; සහ

(ඔ) කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති සහ එම ක්ෂේත්‍රයේ ස්වකීය හැකියාවන් පෙන්නුම් කර ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින්, අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පස් දෙනකුට අඩු නොවන හා හත් දෙනෙකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක්.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම්, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ සාමාජිකයකුට ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කොමිෂන් සභාවෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් හේතුවක් නොදක්වා ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම යන හේතු නිසා කොමිෂන් සභාවේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් එම ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

(7) එවැනි යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද යම් තැනැත්තකු ඔහුගේ පූර්වගාමියාගේ ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(8) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතු අතර ඔහු කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැතිවිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා සහ එම ලේකම්වරයා යන දෙදෙනාම පැමිණ නොමැති විටෙක එම රැස්වීමට පැමිණ සිටින කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින්, (15) වන උපවගන්තියට යටත්ව, තමන් අතුරින් යම් සාමාජිකයකු රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාපත් කර ගනු ලැබිය යුතු ය.

(9) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හය දෙනකු විය යුතු ය.

(10) සභාපතිවරයාට හෝ කොමිෂන් සභාවේ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(11) කොමිෂන් සභාව යටත්පිරිසෙයින් සෑම මාසයකම එක් වරක් හෝ රැස්විය යුතු අතර, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් පිළිබඳව හා ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම් පිළිබඳව කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය යුතු ය.

(12) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් ඇතද ඒ නොතකා කොමිෂන් සභාවට ක්‍රියා කළ හැකි අතර, කොමිෂන් සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

(13) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(14) (1) (ආ) උපවගන්තියේ හෝ (1) (ඇ) උපවගන්තියේ හෝ (1) (උ) උපවගන්තියේ හෝ (1) (ඌ) උපවගන්තියේ හෝ සඳහන් කරනු ලැබ ඇති සාමාජිකයකු විසින් තමා වෙනුවට සහ තම නියෝජිතයා වශයෙන් කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණීම සඳහා තම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු නම් කරනු ලැබිය හැකි අතර, එසේ නම් කිරීම පිළිබඳව කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(15) (14) වන උපවගන්තිය යටතේ නම් කරනු ලැබූ විකල්ප සාමාජිකයකුට කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණීමට සහ එම රැස්වීම්වල දී ඡන්දය දීමට අයිතිවාසිකම තිබිය යුතු නමුත්, කොමිෂන් සභාවේ රැස්වීම්වල දී මුලසුන දැරීම සඳහා (8) වන උප වගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබීමට ඔහු සුදුස්සකු නොවිය යුතු ය.

(16) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් තමාට කොමිෂන් සභාවේ නියෝජනය ලැබීමට හිමිකම් ලබන ධුර එකකට වැඩි සංඛ්‍යාවක් දරන අවස්ථාවක දී, තමා කොමිෂන් සභාවෙහි නියෝජනය කරන ධුරය පිළිබඳව එම සාමාජිකයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත අමතනු ලබන ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර තමා දරන අනෙක් ධුරය නියෝජනය කිරීම සඳහා වෙනත් නිලධරයකු නම් කරනු ලැබිය යුතු ය.

(17) කොමිෂන් සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වගකිව යුතු ය. මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා දී ඇති හෝ වෙන්කර දී ඇති බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමිෂන් සභාව විසින් එම ලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

**9.** කොමිෂන් සභාවට ලේකම්වරයකු ද කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කාර්ය මණ්ඩල ද පත් කරනු ලැබිය යුතු ය.

**10.** (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) කර්මාන්තවලට දිරි දීම සහ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම පිණිස, කාර්මිකකරණය සඳහා වූ යෝග්‍ය සර්ව ආර්ථික ප්‍රතිපත්ති ද ඇතුළුව ප්‍රතිපත්ති පිළිබඳ පියවර, සැලසුම් සහ වැඩ පිළිවෙලවල් සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම ;

(ආ) කාර්මිකකරණය සහ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් නියෝජ්‍යායතන සම්බන්ධීකරණයක් තහවුරු කිරීම ;

(ඇ) කාර්මිකකරණය සඳහා ආයතනික ක්‍රම සැලසීම තහවුරු කිරීම ;

(ඈ) කර්මාන්ත අධෝව්‍යුහ සහ සේවා සැලසීම සඳහා සැලසුම් පිළියෙල කිරීම ;

(ඉ) කර්මාන්ත සඳහා සම්පූර්ණ නිෂ්පාදන හා වෙළඳපොළ තොරතුරු අධෝව්‍යුහයක් සැලසීම ; සහ

(ඊ) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන කර්මාන්තවලට අදළ කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අමාත්‍යවරයා වෙත වාර්තා සැපයීම.

(2) කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(3) මේ පනත මගින් කොමිෂන් සභාව වෙත වෙන්කර දී ඇති කර්තව්‍ය ඉටුකිරීමේ දී, කොමිෂන් සභාව විසින් පහත සඳහන් කරුණුවල අවශ්‍යතාව සැලකිල්ලට ගත යුතු ය :—

(අ) කාර්යක්ෂම වන සහ ජාත්‍යන්තර වශයෙන් තරගකාරී වන කර්මාන්තවල සංවර්ධනයට හා දියුණුවට අනුබල දීම ;

(ආ) ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම්වල හැඩ ගැසීම පහසු කිරීම ;

(ඇ) ජාතික ප්‍රතිපත්තිය මගින් ඉඩ ලැබෙන තාක් ප්‍රමාණයට කර්මාන්ත පාලනය කිරීම අවම ප්‍රමාණයකට අඩු කිරීම.

(4) 10 (1) (ඊ) වගන්තිය යටතේ යම් කාරණයක් පරීක්ෂණය සඳහා කොමිෂන් සභාව වෙත යොමු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් අතුරු වාර්තා සහ අවසාන වාර්තාව ඉදිරිපත් කළ යුතු කාලසීමාව අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත නියම කරනු ලැබිය හැකි ය :—

(අ) ආණ්ඩුව විසින් යම් කර්මාන්තයකට මූල්‍යමය හෝ වෙනත් ආධාර සැපයීම ;

(ආ) ආණ්ඩුව විසින් යම් කර්මාන්තයකට මූල්‍යමය ආධාර සැපයීමට ඇති අවශ්‍යතාව හෝ ආණ්ඩුව විසින් යම් කර්මාන්තයකට සපයන ලද යම් මූල්‍යමය ආධාරයක් අස්කර ගැනීමට, වැඩි කිරීමට හෝ අඩු කිරීමට ඇති අවශ්‍යතාව ;

(ඇ) ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම තහනම් කිරීමට හෝ සීමා කිරීමට ඇති අවශ්‍යතාව ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ කිසිවක් මත බදු පැනවීමට, ඉවත් කිරීමට, වැඩි කිරීමට හෝ අඩු කිරීමට ඇති අවශ්‍යතාව.

**11.** කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි කමිටු, කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පත් කරනු ලැබිය හැකි අතර, එම කමිටු නියමිත සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. තව ද මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා දී ඇති බලතල හෝ වෙන්කර දී ඇති කර්තව්‍ය, කොමිෂන් සභාව විසින් එම කමිටු වෙත පවරනු ලැබිය හැකි ය.

**12.** කොමිෂන් සභාව විසින් එක් එක් ලිත් වර්ෂය අවසානයේ දී, එම වර්ෂය ඇතුළත දී කොමිෂන් සභාව විසින් කරන ලද වැඩ පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

## III වන කොටස

### කර්මාන්ත පිළිබඳ උපදේශක සභාව

**13.** (1) (මෙහි මින් මතු " සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) "කර්මාන්ත පිළිබඳ උපදේශක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් විය යුතු ය.

(2) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) කාර්මිකකරණය පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයන් ;

(ආ) අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන මණ්ඩල, සංගම් සහ සංවිධාන මගින් කර්මාන්තවල දියුණුව උදෙසා කරන ලද සේවය සැළකිල්ලට ගෙන ඒ මණ්ඩල, සංගම් සහ සංවිධානවලින් නම් කරන ලද සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) කර්මාන්ත නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් නියමිත සංඛ්‍යාවක් ;

(ඈ) කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති සහ එම ක්ෂේත්‍රයේ ස්වකීය හැකියාවන් පෙන්නුම් කර ඇති බවට අමාත්‍යවරයාට පෙණී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පහළොවකට වැඩි නොවන සංඛ්‍යාවක්.

**14.** සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා, කර්මාන්තවලට අදළ ප්‍රශ්න පිළිබඳව සහ ඒකාබද්ධ කර්මාන්ත වැඩ පිළිවෙලවල් පිළිබඳව ආණ්ඩුව සමග සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකාවේ කර්මාන්තවල නියෝජිතයන්ට සාකච්ඡා මණ්ඩපයක් ලබා දීම ; සහ

(ආ) කර්මාන්තවල ප්‍රවර්ධනය සඳහා ගන්නා ලද පියවරවල සඵලත්වය පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.

15. (1) සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ එහි ලා ආනුෂංගික වන බලතල සභාවට තිබිය යුතු ය.

(2) සභාවේ රැස්වීම්වල ගණපූරණය, එම රැස්වීම්වල දී කරනු ලබන කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය, 13 (2) වන වගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් සාමාජිකයන්ගේ ධුර කාලය, 13 (2) (ආ) වගන්තියේ සඳහන් මණ්ඩල, සංගම් සහ සංවිධාන පිළිගැනීම පිළිබඳ මාර්ගෝපදේශ සහ සභාවේ සභාපතිවරයා තෝරා පත්කර ගැනීම, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) සභාව විසින්, එක් එක් වර්ෂය අවසානයේ දී එම වර්ෂය ඇතුළත සභාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙළ කිරීමට සැලැස්විය යුතු අතර එම වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු

16. (1) එක් එක් පළාත ඇතුළත කර්මාන්ත සංවර්ධනයට පහසුකම් සැලසීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් එක් එක් පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසා එම පළාත ඇතුළත ප්‍රදේශ තීරණය කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ තීරණය කරන ලද එක් එක් ප්‍රදේශය සඳහා කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර එය ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය. එම ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පළාතක ද එම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් එම කමිටුව පත් කරනු ලැබිය යුතු ය.

17. ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) එම ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය පිළිබඳව අමාත්‍යවරයාට, එම කමිටුව පත් කරනු ලැබ ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහා ද එම ප්‍රදේශය පිහිටා ඇති පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාට සහ කොමිෂන් සභාවට උපදෙස් දීම ;

(ආ) එම ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය සඳහා සැලසුම් සහ වැඩපිළිවෙලවල් සකස් කිරීම ;

(ඇ) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව එම ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ එහි ලා පහසුකම් සැලසීම ;

(ඈ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සැලසුම්වලට අනුකූලව ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය වන සේවා සහ පහසුකම් සැලසීම සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) එම ප්‍රදේශයේ යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් යම් ආයෝජන තීරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා යම් ආයෝජකයකුට ආධාර කිරීම ; සහ

(ඊ) එම ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවක් පිහිටුවීම.

**18.** ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ සංයුතිය සහ එම කමිටුවේ කටයුතු කිරීම නියමිත පරිදි විය යුතු ය.

**19.** කර්මාන්තපුර, කර්මාන්ත උද්‍යාන, විද්‍යා උද්‍යාන සහ වෙනත් නිශ්චිතව දැක්වෙන කර්මාන්ත අධෝව්‍යුහ පිහිටුවීම සහ පරිපාලනය ද එසේ ම—

(අ) එවැනි යම් කර්මාන්ත පුරයක්, කර්මාන්ත උද්‍යානයක්, විද්‍යා උද්‍යානයක් හෝ අධෝව්‍යුහයක් පිහිටුවනු ලබන්නේ හෝ පිහිටුවීමට යෝජනා කරනු ලැබ ඇත්තේ යම් ප්‍රදේශයක ද එම ප්‍රදේශය සඳහා පත්කරන ලද ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙත හෝ එවැනි යම් කමිටුවක් නොමැති විට දී, රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ එම කර්මාන්ත පුරය, කර්මාන්ත උද්‍යානය, විද්‍යා උද්‍යානය හෝ අධෝව්‍යුහය පිහිටුවීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ආකාරය ද ;

(ආ) දනට පවත්නා කර්මාන්ත පුරයක්, කර්මාන්ත උද්‍යානයක්, විද්‍යා උද්‍යානයක් හෝ නිශ්චිතව දැක්වෙන කර්මාන්ත අධෝව්‍යුහයක් පිහිටුවා ඇත්තේ යම් ප්‍රදේශයක ද, එම ප්‍රදේශය සඳහා පත්කරන ලද ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙත හෝ එවැනි කමිටුවක් නොමැති විට දී රෙජිස්ට්‍රාර්වරයා වෙත එම කර්මාන්ත පුරය, විද්‍යා උද්‍යානය හෝ අධෝව්‍යුහය ලියාපදිංචි කිරීම සඳහා, ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ආකාරය ද;

(ඇ) එවැනි කර්මාන්ත පුර හෝ උද්‍යාන ඇතුළත ගොඩනැගිලි හෝ වෙනත් ව්‍යුහ ඉදි කිරීම, වෙනස් කිරීම සහ කඩාදැමීම සඳහා අනුමතය ලබාගැනීම සඳහා වන ඉල්ලීම්, එම කර්මාන්තපුර හෝ උද්‍යාන පිහිටුවා ඇති ප්‍රදේශය සඳහා පත්කරනු ලැබ ඇති ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව වෙත හෝ එවැනි කමිටුවක් නොමැති විට දී රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ආකාරය ද ;

(ඈ) එවැනි කර්මාන්තපුර, උද්‍යාන හෝ නිශ්චිතව දැක්වෙන කර්මාන්ත අධෝව්‍යුහ කළමනාකරණය කිරීම ද

නියමිත පරිදි විය යුතු ය.

**20.** (1) යම් කර්මාන්ත පුරයක්, කර්මාන්ත උද්‍යානයක්, විද්‍යා උද්‍යානයක් හෝ නිශ්චිත කර්මාන්ත අධෝව්‍යුහයක් අනුමතය නොමැතිව ඉදිකරනු ලැබූ අවස්ථාවක දී හෝ 19 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබූ ආකාරයට පටහැනිව පාලනය කරනු ලබන අවස්ථාවක දී හෝ 19 වන වගන්තිය මගින් නියම කර ඇති අනුමතය නොමැතිව එවැනි යම් කර්මාන්ත පුරයක හෝ උද්‍යානයක ගොඩනැගිල්ලක් ඉදි කරනු ලැබූ අවස්ථාවක දී එම කර්මාන්ත පුරය හෝ උද්‍යානය හෝ නියමිත කර්මාන්ත අධෝව්‍යුහය හෝ ගොඩනැගිල්ල හෝ කඩාදමන ලෙස විධාන කරන ආඥාවක් සඳහා හෝ එම කර්මාන්ත පුරය හෝ උද්‍යානය හෝ නියමිත කර්මාන්ත අධෝව්‍යුහය එම නියෝගවලට අනුකූලව පාලනය කරන ලෙස නියම කරන ආඥාවක් සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) යම් ව්‍යුහයක්, අවස්ථාවෝචිත පරිදි, කර්මාන්ත පුරයක්, කර්මාන්ත උද්‍යානයක්, විද්‍යා උද්‍යානයක් හෝ නිශ්චිත කර්මාන්ත අධෝව්‍යුහයක් බවද, එසේම එහි පිහිටුවනු ලැබ ඇත්තේ 19 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගය මගින් නියමිත අනුමතය නොමැතිව බව හෝ එම කර්මාන්ත පුරය හෝ උද්‍යානය පාලනය කරනු ලබන්නේ එම නියෝගවලට පටහැනිව බව හෝ ඒ සහතිකයේ නිශ්චිතව සඳහන් ගොඩනැගිල්ලක් එම කර්මාන්ත පුරයේ, කර්මාන්ත

උද්‍යානයේ හෝ විද්‍යා උද්‍යානයේ ඉදිකර ඇති බව සහ එම ඉදි කිරීම සිදුකර ඇත්තේ 19 වන වගන්තිය මගින් නියමිත අනුමතය නොමැතිව බවද සඳහන් වන්නා වූ රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් මේ වගන්තිය යටතේ පවරනු ලැබූ යම් නඩු කිව්යුතුවල දී ආවේශ්‍ය විය යුතු අතර එම සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ අරර්ථානුකූල වූ යම් ප්‍රාදේශීය ව්‍යවසායකට හෝ බලපත්‍රලත් ව්‍යවසායකට නැතහොත් ප්‍රාදේශීය ව්‍යවසායක් හෝ බලපත්‍රලත් ව්‍යවසායක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**21.** (1) අමාත්‍යවරයා විසින් පළාතක ප්‍රධාන අමාත්‍යවරයා විමසා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම පළාත ඇතුළත පිහිටි යම් ප්‍රදේශයක් " කර්මාන්ත ප්‍රදේශයක්", ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද එම ප්‍රදේශය ජාතික රාජ්‍ය සභාවේ 1971 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයක් යටතට අයත්වන අවස්ථාවක දී, නාගරික සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස අමාත්‍යවරයා විසින් මේ උපවගන්තිය යටතේ කිසිම ප්‍රකාශයක් කරනු නොලැබිය යුතු ය.

(2) යම් කර්මාන්ත ප්‍රදේශයක් අයත් වන්නේ යම් ප්‍රදේශයකට ද එම ප්‍රදේශය සඳහා 16 වන වගන්තිය යටතේ පත් කරන ලද ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින්, එම කර්මාන්ත ප්‍රදේශය ඇතුළත කර්මාන්ත සඳහා අධෝව්‍යුහ සැලසීම සඳහා සහ එම කර්මාන්ත ප්‍රදේශය ඇතුළත සේවා සහ පහසුකම් සම්බන්ධීකරණය කිරීම සඳහා සැළසුම් සහ යෝජනා ක්‍රම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද එවැනි සැළසුම් සහ යෝජනා ක්‍රම, කොමිෂන් සභාවේ උපදෙස් මත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අනුමත කරනු ලැබිය හැකි ය.

(4) කර්මාන්ත ප්‍රදේශයක් සම්බන්ධයෙන් (3) වන උප වගන්තිය යටතේ සැලැස්මක් හෝ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම කර්මාන්ත ප්‍රදේශය අයත් වන්නේ යම් ප්‍රදේශයකට ද එම ප්‍රදේශය සඳහා පත් කරනු ලැබ ඇති ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව, එම යෝජනා හෝ සැළසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

(5) එවැනි යම් සැළසුම් හෝ යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය වන යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් සාදනු ලැබිය යුත්තේ හෝ වෙනස් කරනු ලැබිය යුත්තේ යම් ප්‍රමිතිවලට අනුකූලව ද එම ප්‍රමිති, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විමසා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(6) ඒ සැලැස්ම හෝ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශයෙහි වූ ගොඩනැගිලි ඉදිකිරීම හෝ වෙනස් කිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් බලය පවරනු ලැබ ඇති අධිකාරිය විසින් ඒ ඉදිකිරීම් හෝ වෙනස් කිරීම (5) වන උපවගන්තිය යටතේ නියමිත ප්‍රතිමිවලට අනුකූලව වන්නේ නම් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක්

සඳහන් වුව ද, එය නොතකා, එම ඉදිකිරීම හෝ වෙනස් කිරීම සඳහා අනුමතිය ලබා දිය යුතු අතර, ඒ අනුමතය සඳහා ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දිනයේ සිට සති අටක් ඇතුළත එම අනුමතය ලබා දිය යුතු ය.

(7) එවැනි සැලැස්මක හෝ යෝජනා ක්‍රමයක කාර්ය සඳහා යම් කර්මාන්ත ප්‍රදේශයක යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ වෙනස් කිරීම සඳහා වූ ඉල්ලීමක් අනුමතිය ලබා දීමට යම් ලිඛිත නීතියක් මගින් බලය පවරනු ලැබ ඇති අධිකාරයක් වෙත ඉදිරිපත් කරනු ලැබ එම ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දිනයේ සිට සති අටක් ඇතුළත එම අනුමතිය ලබා දීමට එම අධිකාරිය අපොහොසත් වන අවස්ථාවක දී, එම අනුමැතිය ලබා දීම සඳහා බලය පවරනු ලැබූ අධිකාරිය නිලධරයා හෝ තැනැත්තා වශයෙන් එම ලිඛිත නීතියෙහි කර ඇති සඳහන් එම කර්මාන්ත ප්‍රදේශය අයත් වන ප්‍රදේශය සඳහා පත් කරනු ලැබ ඇති ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙත කරන ලද සඳහන් ලෙස සලකා එම කමිටුව මගින් එම අනුමතය ලබා දීම නීත්‍යානුකූල වන්නේ ය.

**22.** (1) කර්මාන්ත ව්‍යවසායක කාර්ය සඳහා වූ ගොඩනැගිල්ලක් නාගරික සංවර්ධන අධිකාරිය විමසා නියම කරන ලද ප්‍රමිතිවලට අනුකූල වන්නේ නම් මිස, නියමිත දිනයෙන් ආරම්භව 1994 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව ඇතුළත ඒ ගොඩනැගිල්ල ඉදිකොට පාවිච්චි කිරීම නොකළ යුතු ය.

(2) යම් ඉදි කිරීමක් නියමිත ප්‍රමිතිවලට අනුකූල වන්නේ නම් වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද එම ඉදි කිරීම හෝ පාවිච්චි කිරීම අනුමත කිරීමට ලිඛිත නීතිය මගින් බලය පවරනු ලැබ ඇති අධිකාරිය විසින් එම ඉදි කිරීම හෝ පාවිච්චි කිරීම අනුමත කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව යම් ප්‍රාදේශීය ව්‍යවසායක් හෝ බලපත්‍රලත් ව්‍යවසායක් විසින් ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ගොඩනැගිලිවලට :

(ආ) (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ප්‍රදේශයක් බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ජනාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ප්‍රදේශයක ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ගොඩනැගිලිවලට ;

(ඇ) 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කර්මාන්ත පුරයක, කර්මාන්ත උද්‍යානයක, විද්‍යා උද්‍යානයක හෝ කර්මාන්ත අධෝව්‍යුහයක ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ගොඩනැගිලිවලට ; සහ

(ඈ) 21 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් කර්මාන්ත ප්‍රදේශයක ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ගොඩනැගිලිවලට

අදාළ නොවිය යුතු ය.

**23.** 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව විසින්, යම් භාණ්ඩයක මිල ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි අතර එම කාර්යය සඳහා පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය. එවැනි යම් පරීක්ෂණයකින්

පසුව ඒ භාණ්ඩයේ මිල අසාධාරණ බවට සහ එම භාණ්ඩය ආනයනය කිරීමට ඉඩ දීමෙන් තරඟකාරී බවට අනුබල දීම අවශ්‍ය වන බවට සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව විසින් වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එම භාණ්ඩ ආනයනය කිරීමේ දී පනවනු ලබන, යම් රේගු බද්දක් වේ නම් එම රේගු බද්දේ අනුප්‍රමාණය ද එම වාර්තාවේ නිර්දේශ කරනු ලැබිය යුතු ය.

**24.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් වෙළෙඳ හා වාණිජ විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන සියලු නිෂ්පාදන හැර, වෙනත් සියලු නිෂ්පාදන 1991 ජුලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි අන් සියලු නිෂ්පාදන 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 4(1) වන වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

**25.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර්මාන්ත මහජන යහපත උදෙසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පාලනය කිරීම යෝග්‍ය යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(2) පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් මේ පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

**26.** (1) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ සහ එම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස අන්‍යාකාරයකින් කිසිම තැනැත්තකු විසින් පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර්මාන්තයක් වන දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර්මාන්තයක් පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරන ආකාරය සහ එවැනි බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචන ඉදිරිපත් කළ යුතු ආකාරය නියමිත පරිදි විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව එම උපවගන්තියේ සඳහන් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී, එම කර්මාන්තය පවත්වාගෙන යාම එම තැනැත්තාට තහනම් කරන ආඥාවක් ලබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක නිශ්චිතව සඳහන් කර්මාන්තයක් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියම කරනු ලැබ ඇති කර්මාන්තයක් බවට ද, එම උපවගන්තිය යටතේ එම කර්මාන්තය සම්බන්ධයෙන් කිසිම බලපත්‍රයක් නිකුත් කරනු ලැබ නොමැති බවට ද සඳහන් වන එම සහතිකය (4) වන

උපවගන්තිය යටතේ පවරන ලද යම් නඩු කටයුතුවල දී සාක්ෂියේදී ආවේශ්‍යා විය යුතු අතර, එම සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

**27.** (1) මේ පනතේ කාර්යය සඳහා කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයකු සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයන් සහ සහකාර කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයන් යම් සංඛ්‍යාවක් ද නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම නියෝජ්‍ය කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයකු සහ සහකාර කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබීමේ දී ඔහු පත්කරනු ලබන ප්‍රදේශය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එසේ නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශය, මෙහි මින් මතු '' ඔහුගේ පත්වීම් ප්‍රදේශය '' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) සෑම නියෝජ්‍ය කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම සහ සහකාර කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම, රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනත මගින් හෝ එය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරා ඇති බලතල හෝ නියම කර ඇති කාර්ය හෝ වෙන්කර ඇති කර්තව්‍ය සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි ය.

**28.** රෙජිස්ට්‍රාර්වරයා, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා සහ සහකාර රෙජිස්ට්‍රාර්වරයා මේ පනත යටතේ යම් කර්තව්‍යයක් ඉටු කරන වෙනත් යම් නිලධරයකු විසින් තම කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන කර්මාන්ත ව්‍යවසායක් සම්බන්ධයෙන් වූ සියලු කරුණු පිළිබඳව තමා තදින්ම රහස්‍ය භාවය සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් තම කාර්ය භාර ගැනීමට පෙර අත්සන් කළ යුතු අතර, අධිකරණයක් මගින් හෙළි කරන ලෙස නියම කරනු ලබන අවස්ථාවක දී හැර, එවැනි යම් කරුණක් හෙළි නොකරන බවට එම ප්‍රකාශය මගින් ඔහු පොරොන්දු විය යුතු ය.

**29.** (අ) 4 වන වගන්තිය යටතේ තමාට ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ; හෝ

(ආ) 4 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්ෂික වාර්තාවක, දැන දැනම යම් සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඇ) 28 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**30.** කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් වන සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත ලිඛිතව දෙනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව විසින් එම විධාන බලාත්මක කරනු ලැබිය යුතු ය.

**31.** (1) කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට බාධා පමුණුවන පරිපාලනමය සහ වෙනත් බාධක ඉවත් කිරීම, හෝ තරඟකාරී කාර්මික පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද යෝජනා ක්‍රම සහ වැඩ පිළිවෙලවල් සාර්ථක ලෙස

ක්‍රියාවේ යෙදවීමට වගබලා ගැනීම සහ පොදුවේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනික සහ වෙනත් හැකියාවන් වැඩි දියුණු කිරීම යන කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා සහ වෙනත් යම් අදාළ අමාත්‍යවරයකු විමසා කොමිෂන් සභාව වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද යම් විධානයක් ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ආණ්ඩුවේ යම් ආයතනයක් වෙත විධාන කිසිවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක දී, එම විධාන අනුව ක්‍රියාකිරීම එම ආයතනය භාරව සිටින තැනැත්තාගේ කාර්යය වන්නේය.

(3) (1) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද යම් විධානයක් ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ගන්නා ලද පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත වාර්තා කළයුතු අතර, කොමිෂන් සභාව විසින් එම වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

**32.** 1987 අංක I දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනතේ 18 වන වගන්තියේ සිට 26 වන වගන්තිය තෙක් වූ වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

18. (1) මේ වගන්තියෙහි " නියමිත භාණ්ඩය " යන්නෙන් යම් ආහාරයක් හෝ යම් ඖෂධ නිෂ්පාදනයක් අදහස් වේ.

(2) යම් නියමිත භාණ්ඩයක මිලෙහි අසාධාරණ වැඩිවීමක් ඇතැයි හෝ ඇතිවීමට ඉඩ තිබේ යයි හෝ ඒ භාණ්ඩය විකුණනු ලබන මිල අධික යයි මිල පාලකවරයාට පෙනී යන්නේ නම්—

(අ) එම භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම සිල්ලර මිල නියම කරන ලෙස හෝ එම උපරිම මිල ව්‍යුහය නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වන ලෙස ; හෝ

(ආ) නියමිත භාණ්ඩයක් සම්බන්ධයෙන්, එය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම මිල නියම කරමින් හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දක්වමින් මේ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද තත් කාලයේ බලපවත්නා නියමයක් තිබෙන අවස්ථාවක, ඒ නියමයෙන් නියම කරන ලද උපරිම මිල හෝ දක්වන ලද මිල ව්‍යුහය වෙනස් කරන ලෙස ; හෝ

ඔහු විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකි ය.

(3) (4) වන උපවගන්තිය යටතේ කරන ලද තත් කාලයේ බලපවත්නා නියමයක් නියමිත භාණ්ඩය සම්බන්ධයෙන් තිබෙන අවස්ථාවක, ඒ නියමය මගින් නියම කරන ලද මිල හෝ දක්වන ලද මිල ව්‍යුහය වෙනස් කරන ලෙස අදාළ නියෝජ්‍යායතනයක් විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උප වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් විභාග කරනු ලැබීමෙන් පසුව ඒ ඉල්ලීම සාධාරණ යයි කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත්, කොමිෂන් සභාව විසින්—

(අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද, ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ විට, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, එම ඉල්ලීමෙහි සඳහන් නියමිත භාණ්ඩය විකිණීමේ දී නොඉක්ම විය යුතු උපරිම සිල්ලර මිල නියම කිරීම හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළ යුතු මිල ව්‍යුහය දැක්වීම ; හෝ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (3) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට ඒ ඉල්ලීමෙහි සඳහන් නියමිත භාණ්ඩය විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම සිල්ලර මිල නියම කරමින් හෝ ඒ උපරිම මිල නියම කිරීමේ දී අනුගමනය කළයුතු මිල ව්‍යුහය දක්වමින් හෝ කරන ලද නියමය වෙනස් කිරීම

කරනු ලැබිය යුතුය.

මේ උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, ඒ නියමය ගැසට් පත්‍රයේ පල කරන ලද දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් අමාත්‍යවරයා විසින් පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් නියමයක් පරිච්ඡින්න කරන ලද හෝ වෙනස් කරන ලද අවස්ථාවක, ඒ පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දින සිට (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය, අවස්ථාචෝචිත පරිදි, පරිච්ඡින්න කරනු ලැබූ හෝ වෙනස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කරන ලද හෝ විඳින ලද යම් දෙයකට හෝ ඒ යටතේ අත්කර ගන්නා ලද, උපචය වූ හෝ දරන ලද යම් අයිතියකට, බැඳීමකට හෝ වගකීමකට ඉන් හානියක් නොවිය යුතු ය.''.

**33.** (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, සභාවේ යම් සාමාජිකයකු, ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ සාමාජිකයකු හෝ රෙජිස්ට්‍රාර්වරයා, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු, සහකාර රෙජිස්ටාර්වරයකු, හෝ මේ පනත යටතේ යම් කර්තව්‍යයක් ඉටු කරන වෙනත් යම් නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් හෝ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරනු නොලැබිය යුතු ය.

**34.** (1) නියම කිරීමට මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි සිට හෝ එහි සඳහන් යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් පසු දිනයක අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කරන ලද කිසිවකුට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(25 වන වගන්තිය)

## පළමුවන උපලේඛනය

1. විදේශීය ආයෝජන සහිත යම් කර්මාන්තයක්.
2. උසස් තාක්ෂණය යොදවා ගනු ලබන යම් කර්මාන්තයක්.
3. ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.
4. ඛනිජ ද්‍රව්‍ය හෝ අලුත් කළ නොහැකි ස්වාභාවික සම්පත් කැනීමේ, ඉවත්කර ගැනීමේ හෝ පිරිසැකසුම් කිරීමේ ලා සම්බන්ධ යම් කර්මාන්තයක්.
5. ආයුධ, වෙඩි ද්‍රව්‍ය, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ උපකරණ, ගුවන් යානා සහ වෙනත් යම් යුධ ආම්පන්න නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.
6. වස, මත් ද්‍රව්‍ය, මද්‍යසාර, අන්තරායදයක ඖෂධ සහ විෂ සහිත අන්තරාය දයක කුලීරමාව ද්‍රව්‍ය නිෂ්පාදනය කරන කර්මාන්තයක්.
7. මුදල්, කාසි සහ ආරක්ෂිත ලේඛන නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.
8. (අ) පිරියත සහ උපකරණ සඳහා යොද ඇති ප්‍රාග්ධන ආයෝජනයෙහි අගය රුපියල් මිලියන හතරක් ඉක්මවන්නා වූ සහ

   (ආ) කර්මාන්තයෙහි සේවයේ නියුක්ත කර සිටින ස්ථිර සේවා නියුක්තයන් සංඛ්‍යාව පණහක් ඉක්ම වන්නා වූ

   යම් කර්මාන්තයක්.
9. ආණ්ඩුවට අයත් යම් කර්මාන්තයක් හෝ කොටස්වලින් වැඩි ප්‍රමාණයක් ආණ්ඩුව විසින් දරනු ලබන යම් කර්මාන්තයක්.

(26 වන වගන්තිය)

## දෙවන උපලේඛනය

1. ආයුධ, වෙඩි ද්‍රව්‍ය, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන හා උපකරණ, ගුවන් යානා සහ වෙනත් යම් යුධ ආම්පන්න නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.
2. වස, මත් ද්‍රව්‍ය, මද්‍යසාර, අන්තරාදයක ඖෂධ සහ විෂ සහිත, අන්තරායදයක සහ කුලීරමාව ද්‍රව්‍ය නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.
3. මුදල්, කාසි සහ ආරක්ෂිත ලේඛන නිෂ්පාදනය කරන යම් කර්මාන්තයක්.

(26 වන වගන්තිය)

## තුන්වන උපලේඛනය

### බලපත්‍රයක ඇති නියම සහ කොන්දේසි

1. එවැනි යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු වන ආරක්ෂාව පිළිබඳ ප්‍රමිති.

2. අමුද්‍රව්‍ය ගබඩා කිරීම, අමු ද්‍රව්‍ය පාවිච්චි කිරීම සහ පාවිච්චි නොකරන ලද අමු ද්‍රව්‍ය, අප ද්‍රව්‍ය සහ ප්‍රතික්ෂිප්ත බැහැර කිරීම.

3. කර්මාන්තයේ නිෂ්පාදන ගැනුම්කරුවන් වෙත භාර දිය යුතු ආකාරය.

4. පවත්වාගෙන යා යුතු සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රමිතිය.

5. එවැනි යම් කර්මාන්තයක දී පාවිච්චි කළ යුතු අමු ද්‍රව්‍ය.

## 1990 අංක 48 දරන විසර්ජන පනත

[සහතිකය සටහන් කළේ 1990 දෙසැම්බර් මස 28 වන දින]

**1991 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

1. මේ පනත 1990 අංක 48 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි " 1991 මුදල් වර්ෂය " යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව 1991 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති, රුපියල් නවදහස් පන්සිය තිස්අට කෝටි එකොළොස් ලක්ෂ අනූතුන් දහසක් විය යුතු ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් හය දහස් හයසිය අසූකෝටියක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් නවදහස් පන්සිය තිස්අට කෝටි එකොළොස් ලක්ෂ අනූතුන් දහසක් වූ මුදල, මේ පනතේ පළමුවන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

**3.** (1) 1991 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1991 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදයමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපල වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තක ආදයමින් අඩු කළ යුතුය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1991 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1991 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උප ලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

**4.** 1991 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

**5.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට එම උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තුවිය හැකි වූ ද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩසටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත්කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකිය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දැක්වෙන අවම සීමා,

නියමයක් මගින්, 1992 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය.

**8.** පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උප ලේඛනය සංශෝධනය කළ හැකිය.

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.